


**සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම**

**පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය**

2013 වාර්ෂික වාර්තාව

# අප ගැන

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගමක් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව ජනතා වතු සංවර්ධන මණ්ඩලය මඟින් පාලනය වූ වතු සමූහයක කර්තව්‍ය භාරගෙන ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා පිහිටුවන ලදී. 1992 ජූනි 18 වන දින සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස නිති ගත කරන ලදී. පූර්ණ රාජ්‍ය අයිතිය යටතේ ඇති සමාගමක් ලෙස ක්‍රියාත්මක වන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ සියළු කොටස් අයිතිය ස්වර්ණමය කොටස්කරුවන මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් උසුලනු ලබයි.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1992 ජූනි 18 වැනි දින සිට පෞද්ගලික අංශය මඟින් කළමනාකරණය කරන ලදී. වසර 13ක පමණ කාලයක් පුරා ක්‍රියාත්මක වූ පෞද්ගලික කළමනාකරණයේ පැවිති දුර්වලතා තුල සමාගම ආර්ථිකමය වශයෙන් ඵලදායි නොවූ අතර සමස්ථ පසු බැමකට ලක් විය. ඒ අනුව සමාගමේ කළමනාකාරිත්වය 2005 ජනවාරි 01 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ රජයට පවරා ගන්නා ලදි.

එතැන් පටන් විවිධ අමාත්‍යාංශ යටතේ පාලනය වූ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 2010 වසරේ සිට පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සමාගම විවිධාංගීකරණයෙන් යුත් කෘෂි බෝග, එනම් පොල්, රබර් සහ වෙනත් අතුරු බෝග නිෂ්පාදනය කිරීම, සැකසුම් කිරීම සහ අලෙවිකරණය යන ක්‍රියාදාමයන් තුල යෙදී සිටි.

පලාත් වතු යායන් 08 කින් සමන්විත සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සතුව හෙක්ටයාර 5,261.17 ක භූමි ප්‍රමාණයක් ඇති අතර එය කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක තුනෙහි වූ විවිධ කෘෂි දේශගුණික කලාප තුල පැතිරී ඇත. සෑම පලාත් වතුයායක්ම ප්‍රාදේශිය ලේකම් කෙට්ඨාශ දෙකක් හෝ තුනක් ආවරණය වන පරිදි විහිදුණු කුඩා වතු කොටස් කිහිපයකින් සමන්විත වේ.

සමාගම සතුව හෙක්ටයාර 4,102.33 ක පොල් වගා වපසරියක් හා හෙක්ටයාර 253.62 රබර් වගා වපසරියක් පවති.

# පටුන


| | |
|---|---|
| මූල්‍යමය උද්ධෘතයන් | 3 |
| කඩඉම් | 4 |
| ජයග්‍රහනයන් | 6 |
| ගරු සභාපතිතුමන්ගේ සමාලෝචනය | 10 |
| අධ්‍යක්ෂක මණ්ඩලය | 14 |
| ප්‍රධාන විධායක නිළධාරිතුමාගේ සාමාලෝචනය | 20 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | 24 |
| පලාත් වතු අධිකාරීවරු | 25 |
| අපේ වගාවන් | 26 |
| කළමනාකරණ සංවාදය හා විශ්ලේෂනය | 28 |
| තිරසාරත්වය පිළිබඳ විමසුම | 36 |
| අවදානම් කළමනාකරණය | 40 |
| සාමූහික පාලන ප්‍රකාශය | 42 |
| **මූල්‍යමය වාර්තා** | |
| අධ්‍යක්ෂක මණ්ඩයේ වාර්ෂික වාර්තාව | 46 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය | 49 |
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 50 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 51 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 52 |
| ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය | 53 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 54 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 56 |
| ගිණුම්කරණ සටහන් | 66 |
| දස වසරක සාරාංශය | 82 |
| වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ නිවේදනය | 84 |

# ස්වශක්තියෙන් ඉදිරියට

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම තිරසාර ලාභාදායීත්වය, වෙළෙඳපොළ ප්‍රවනතාවයෙන් පෙර දැක්මකින් යුතුව හඳුනාගෙන ඒවාට මනාව ප්‍රතිචාර දැක්වීම තුල අත්කරගත් කැපීපෙනෙන ප්‍රගතිය තුළින් තම කීර්තිනාමය ගොඩනගාගත් සමාගමකි. මෙම වර්ෂය තුළද ඉතා ඉහල ප්‍රගතියක් අත්පත්කර ගැනීමට කුරුණෑගල වැවිලි සමාගමට හැකිවිය. රජය සතු ආයතනයක් ලෙස පොදු වගවීම සහ පුළුල් සමාජීය වගකීම කෙරෙහි අපි අවධාරණයෙන් යුක්ත වෙමු. අපටම ආවේනික වූ කාර්යක්ෂම කළමනාකරණ ක්‍රමවේදයන් තුල හා අභිප්‍රේරණය වූ සේවක මණ්ඩලය තුලින් අපගේ සාමාජීය වගකීම නිරන්තරයෙන්ම මනාව ඉටුකරලීම තහවුරු කරනු ලබයි. වර්තමානයේ අත්පත්කර ගෙන ඇති ප්‍රගතිය තුළ ඉදිරියේදී ජාතික ආර්ථිකයට වඩ වඩාත් දායකවීමට අපි බලාපොරොත්තු වෙමු.

# අපගේ දැක්ම

ගිනිකොණ දිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි සහ කෘෂිව්‍යාපාර කළමනාකාරිත්ව සමාගම බවට පත්වීම.

# අපගේ මෙහෙවර

ස්වාභාවික භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමකින් යුතුව උකහා ගෙන වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායී ලෙසත් ලාභදායී ලෙසත් තිරසාර ලෙසත් කළමනාකරණය කරමින් සියලු ප්‍රතිලාභීන්ගේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.

# ප්‍රධාන අගයයන්

**හොඳම සේව්‍යයා:** ගුණාත්මකභාවය, ඵලදායිතාවය, ව්‍යවසායකත්වය, වටිනාකම් නැංවීම, ලාභදායත්වය, පරිසර හිතකාමීභාවය සහ සාමූහික සමාජීය වගකීම යන කාරණා කෙරෙහි යොමුවූ අවංක කැපවීමෙන් යුත් සුදුසුකම්ලත් සේවක මඬුල්ලක් ගොඩනැංවීම.

**ගුණාත්මක ප්‍රතිපාදකයා:** අප සිදු කරන්නා වූ සියලුම කර්තව්‍යයන්හිදී ඉහළම පාරිභෝගික තෘප්තිය සහ අඛණ්ඩ උන්නතියක් ළඟාකරගැනීමට කටයුතු කිරීම

**ඵලදායීතාවය:** යොදවන සෑම සම්පත් ඒකකයකින්ම ඉහලම ඵලදායීතාවයක් ලබාගැනීම, හෙක්ටයාරකින උපරිම අස්වැන්නක් ලබාගැනීම, තිරසාර අන්දමින් භූමියෙන් උපරිම ප්‍රයෝජනය ලබාගැනීම හා නාස්තිය අවම කිරීමට කටයුතු කිරීම

**ව්‍යවසායකත්වය:** සියලුම අවස්ථාවන්හිදී පූර්ව ක්‍රියාකාරීත්වය තුළ නව ප්‍රවේශයන්ට යොමුවීම

**වටිනාකම නිර්මානය:** ව්‍යාපාරික ලෝකයේ නිරන්තරයෙන් වෙනස්වන අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිචාර දැක්වීම

**ලාභදායී බව:** ප්‍රාථමික නිෂ්පාදනයන් සහ අගය එකතු කළ නිෂ්පාදනයන් සඳහා ප්‍රශස්ත විකුණුම් මිලක් ලබාගැනීම සහ නිෂ්පාදන පිරිවැය හැකි අවම මට්ටමක තබාගැනීමට කටයුතු කිරීම

**පරිසර හිතකාමීබව:** පරිසරයට හානියක් නොවන අයුරින් හෝ අවම බලපෑමක් සහිතව සම්පත් උපරිමයෙන් යොදා ගැනීම

**සමාජයීය වගකීම:** යහපාලනයට ගරු කරමින් මිනිසා සහ පරිසරය රැක බලා ගැනීම

# මූල්‍යමය උද්ධෘතයන්

| | | 2013 | 2012 | වෙනස % |
|---|---|---|---|---|
| මෙහෙයුම් උද්ධෘතයන් | | | | |
| **පොල්** | | | | |
| එලදරණ භූමි ප්‍රමාණය | හෙක්ටයාර් | **3,264.04** | 3,391.50 | (3.8) |
| නිෂ්පාදනය | ගෙඩි ගණන | **13,000,150** | 18,103,053 | (28.2) |
| විකුණුම් | ගෙඩි ගණන | **13,010,454** | 18,683,392 | (30.4) |
| ශුද්ධ විකුණුම් සාමාන්‍ය (පොල් ගෙඩි 1000කට) | රු. | **30,951** | 22,327 | 38.6 |
| නිෂ්පාදන වියදම් (පොල් ගෙඩි 1000කට) | රු. | **16,386** | 13,531 | 21.1 |
| ලාභය (පොල් ගෙඩි 1000කට) | රු. | **14,565** | 8,797 | 65.6 |
| හෙක්ටයාරයක ඉපැයුම | ගෙඩි ගණන | **3,983** | 5,338 | (25.4) |
| හෙක්ටයාරයකට ලාභය | රු. | **58,011** | 46,954 | 23.5 |
| **රබර්** | | | | |
| එලදරණ භූමි ප්‍රමාණය | හෙක්ටයාර් | **192.62** | 188.28 | 2.3 |
| නිෂ්පාදනය | කි.ග්‍රෑ. | **188,934** | 209,898 | (10.0) |
| විකුණුම් | කි.ග්‍රෑ. | **186,118** | 209,322 | (11.1) |
| ශුද්ධ විකුණුම් සාමාන්‍ය (කිලෝග්‍රෑමයකට) | රු. | **330** | 371 | (11.1) |
| නිෂ්පාදන වියදම් (කිලෝග්‍රෑමයකට) | රු. | **256** | 213 | 20.5 |
| ලාභය (කිලෝග්‍රෑමයකට) | රු. | **74** | 159 | (53.4) |
| හෙක්ටයාරයක ඉපයුම | කි.ග්‍රෑ. | **981** | 1,115 | (12.0) |
| හෙක්ටයාරයකට ලාභය | රු. | **72,621** | 176,960 | (59.0) |
| **ඉපයීම් උද්ධෘතයන්** | | | | |
| මුළු ආදායම | රු. | **475,890,175** | 491,819,486 | (3.2) |
| දළ ලාභය | රු. | **207,093,357** | 194,536,365 | 6.5 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | රු. | **95,827,085** | 89,353,353 | 7.2 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ලාභය | රු. | **193,669,763** | 176,742,698 | 9.6 |
| බදු පෙර ලාභය | රු. | **213,628,985** | 193,051,212 | 10.7 |
| බදු පසු ලාභය | රු. | **208,145,938** | 177,266,345 | 17.4 |
| දළ ලාභ ආන්තිකය | % | **43.52** | 39.55 | 10.0 |
| ශුද්ධ ලාභ ආන්තිකය | % | **43.74** | 36.04 | 21.4 |
| කොටසක ඉපයුම | රු. | **10.41** | 8.86 | 17.4 |
| **ශේෂ පත්‍ර උද්ධෘතයන්** | | | | |
| මුළු වත්කම් | රු. | **1,616,447,736** | 1,451,022,440 | 11.4 |
| මුළු හිමිකම් | රු. | **1,280,014,666** | 1,111,084,824 | 15.2 |
| නිකුත් කළ කොටස් ගණන | | **20,000,001** | 20,000,001 | 0.0 |
| මුදල් හා කෙටිකාලීන ආයෝජන | රු. | **335,741,661** | 325,659,031 | 3.1 |
| කොටසක ශුද්ධ වත්කම් | රු. | **64.00** | 55.55 | 15.2 |
| ජංගම අනුපාතය | වාර ගණන | **5.61** | 5.03 | 11.5 |
| ක්ෂණික වත්කම් අනුපාතය | වාර ගණන | **4.84** | 4.43 | 9.3 |
| **වෙනත් තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | | **1,400** | 1,503 | (6.9) |
| අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර | | | | |
| අරමුදල් ඇතුළුව වැටුප් හා වේතන | රු. | **206,683,002** | 205,525,353 | 0.6 |
| කාර්යසාධන දිරිදීමනා | රු. | **27,429,989** | 22,717,215 | 20.7 |
| ප්‍රසාද දීමනා | රු. | **8,614,940** | 7,458,393 | 15.5 |
| රජයට ගෙවූ මුළු බදුමුදල් | රු. | **5,238,236** | 12,365,842 | (57.6) |

1992 ජුනි 18 දින
සිට
2004 දෙසැම්බර් 31
දින දක්වා

2005 ජනවාරි 01 දින

2006 ජූනි 06 දින

2007 අප්‍රේල් 18 දින

2010 ජූනි 18 දින

2010 නොවැම්බර්
16 දින සිට මේ දක්වා

# කඩඉම්

1992 ජුනි 18 දින එවකට පැවැති රජයේ පෞද්ගලිකකරණ ප්‍රතිපත්තිය යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ කාණ්ඩ අංක V යටතේ පාලනය වූ වතු සමූහයන් ඒකාබද්ධ කොට 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමෙ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස කු. වැ. ස. පිහිටුවන ලදී.

වසර 13 කට ආසන්න කාලයක් පුද්ගලික කළමනාකාරිත්වය යටතේ වූ දුර්වල කළමනාකරණය හේතුවෙන් 2005 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි කු. වැ. ස. කළමනාකාරිත්වය රජයට පවරා ගත් අතර එතැන් පටන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය.

කු. වැ. ස. පොල් සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත්වීම.

කු. වැ. ස. රාජ්‍ය වතු කළමනාකරණ සහ සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත්වීම.

කු. වැ. ස. රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත්වීම.

කු. වැ. ස. පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත්වීම.

කුරුණෑගල වැවිලි සමාගම පුද්ගලික කළමණාකරණය යටතේ (1992 - 2004) බැංකු අයිරාවන් මත කලින් කලට මෙහෙයුම් කටයුතු සිදු කළ අතර එහි අයිරා තත්ත්වය 1997 සිට වසර 08 ක කාලයක් තිස්සෙ අඛණ්ඩව පැවතිනි. 2005.01.01 දින රජය මගින් සමාගමේ කළමණාකාරිත්වය භාරගන්නා ලද අවස්ථාවේ රු. මිලියන 7.9 ක බැංකු අයිරාවක් පැවතිනි.

**2013**

ජාතික කෘෂි සම්මාන ප්‍රධානයේ ඓතිහාසික වාර්තාවක් තබමින් දෙවන වරටත් ජාතික ස්වර්ණ සම්මානයෙන් පුද ලද එකම කෘෂි ව්‍යාපාර ආයතනය බවට පත්වීමට කු. වැ. ස. හැකිවය. එමෙන්ම අඛණ්ඩව තෙවන වරටත් මහා පරිමාණ නිෂ්පාදන (වැවිලි) සම්මානය ලැබූ එකම කෘෂි ව්‍යවසාය බවට පත්වීමට කු. වැ. ස. හැකිවය.

**2012**

කුරුණෑගල වැවිලි සමාගම 2012 ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන උළෙලේදී ද නැවත වරක් මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) කාණ්ඩයේ රන් සම්මානය දිනා ගත්තේය.

**2005**

රු. මිලියන 7.9 බැංකු අයිරාව පියවමින් රු. මිලියන 8.2 ක වාසිදායක බැංකු ශේෂක් වාර්තා කල කු. වැ. ස. ස්ථාවර මූල්‍ය තත්ත්වයක් ඇතිකරලීමේ අඩිතාලම දමන ලදි.

# ජයග්‍රහනයන්

කුරුණෑගල වැවිලි සමාගම ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන උළෙලේදී ද නැවත වරක් මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) කාණ්ඩයේ රන් සම්මානය ද ජාතික මට්ටමේදි ලෝකඩ සම්මානය ද දිනා ගන්නා ලදී.







සමාගම ආදායම්, ලාභ, මුදල් සහ කෙටි කාලීන ආයෝජන සම්බන්ධ නව වාර්තාවන් සමගින් සාර්ථකව ඉදිරියට ගමන්කරන ලදී.

ජාතික අවශ්‍යතා, මහජන අරමුණු සහ ව්‍යවස්ථාපිත නිශ්චයන් සඳහා ඉඩම් නිදහස් කිරිම හේතුවෙන් කු. වැ. ස. ට ඵලදායී ඉඩම් රැසක් අහිමි විය. කුරුණෑගල වැවිලි සමාගම වෙත 1992 දී භාර දෙන ලද හෙක්ටයාර 6,555.03 න් 20% ක් එනම් හෙක්ටයාර 1,293.86 ප්‍රමාණයක් අහිමි වී ඇත. පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ ක්‍රියාකාරී මැදිහත්වීම මත අදාළ අවදානම මේ වන විට අවම කොට ගෙන තිබේ.

එක් එක් වසර අගදී තිබු ඉඩම් ප්‍රමාණයන්

| | | | |
|---|---|---|---|
| **1992:** | 6,555.03 | **2004:** | 5,537.28 |
| **2005:** | 5,451.41 | **2006:** | 5,450.28 |
| **2007:** | 5,450.28 | **2008:** | 5,409.70 |
| **2009:** | 5,397.51 | **2010:** | 5,397.51 |
| **2011:** | 5,327.77 | **2012:** | 5,316.43 |
| **2013:** | 5,261.17 | | |

# කළමනාකරණ තොරතුරු



# ගරු සභාපතිතුමන්ගේ සමාලෝචනය



"2013 වසරේ පැවැත්වූ ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන උළෙලේදී රන් සම්මාන දෙකක් දිනා ගත් කුරුණෑගල වැවිලි සමාගම ජාතික කෘෂි ව්‍යාපාර ස්වර්ණ සම්මානය අඛණ්ඩව දෙවන වරටත් මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා  වූ රන් සම්මානය අඛණ්ඩව තෙවන වරටත් දිනාගත්තේය."

ආචාර්ය සුනිල් ජයසේකර
සභාපති

**"වර්ෂ 2013 දී බදු පසු ලාභය රුපියල් මිලියන 208.15 ක් වූ අතර 2012 දී එය රුපියල් මිලියන 177.27 ක් විය. දිගුකාලීනව පැවති නියඟය නිසාවෙන් වූ පොල් ඵලදාවේ අඩුවීම හා ජාත්‍යන්තරව ස්වාභාවික රබර් සඳහා වූ අඩු ඉල්ලුම හේතුකොට ගෙන රබර් මිලෙහි වූ පහත වැටීමද හමුවේ මෙවන් ප්‍රගතියක් ලබාගැනීම විශේෂත්වයකි."**

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් මෙම වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව මම මහත් ප්‍රසාදයට පත්වන අතර එය ලැබූ භාග්‍යයක් ලෙසද සලකමි.

කු. වැ. ස. සමාගමයේ සභාපති ලෙස මෙම වර්ෂයේදී ද සමාගමේ එහි ලාභදායීතාවය ඉහල ගොස් ඇති බව මම ආඩම්බර යෙන් ප්‍රකාශ කරමි. අදාල වර්ෂයේදී බලපෑ දැඩි නියගය හේතුවෙන් බොහෝ කෘෂි ව්‍යාපාර සමාගම් අත්විඳි අඩු ලාභයන් හා සසඳා බැලීමේදී මෙය විශාල ජයග්‍රහණයකි.

2013 වසරේ පැවැත්වූ ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන උළෙලේදී රන් සම්මාන දෙකක් දිනා ගත් කුරුණෑගල වැවිලි සමාගම ජාතික කෘෂි ව්‍යාපාර ස්වර්ණ සම්මානය අඛණ්ඩව දෙවන වරටත් මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා වූ රන් සම්මානය අඛණ්ඩව තෙවන වරටත් දිනාගත්තේය.

### පාලනය සහ කළමනාකරණය

භාණ්ඩාගාර ලේකම්තුමන් විසින් වර්ෂ 2013 සැප්තැම්බර් 24 වන දින රජය වෙනුවෙන් නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්කරන ලද අතර සමාගම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2013 මාර්තු 01 දිනදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සමාගම විමර්ශනය කිරීමෙන් අනතුරුව අප අත්කරගත් ප්‍රගතිය ඉමහත් අගැයීමට ලක් කෙරිණි.

භාණ්ඩාගාරය නියෝජනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකකත්වය දරන අධ්‍යක්ෂකවරයාගේ සභාපතිත්වය යටතේ විගණන කමිටු රැස්වීම් පැවැත්විණි. සමාගමේ සභාපති, විධායක අධ්‍යක්ෂක, ක්‍රියාකාරී අධ්‍යක්ෂක, ප්‍රධාන විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ වතු අධිකාරීන් අවශ්‍යතාවය අනුව ආරාධිතව සහභාගි වූහ. සභාපති, විධායක අධ්‍යක්ෂ, ක්‍රියාකාරී අධ්‍යක්ෂක යන අයගේ සහභාගිත්වයෙන් හා ප්‍රධාන විධායක නිලධාරි තුමාගේ ප්‍රධානත්වයෙන් මාසික කළමනාකාර රැස්වීම් සහ වතු අධිකාරීන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විණි. සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය වතුවල කළ නිරීක්ෂණයන් කාර්ය මණ්ඩල සහ අනෙකුත් සේවකයන්ගේ උනන්දුව වැඩිකරලීමට හේතුවිය.

### අමාත්‍යාංශය සමඟ ඇති සහයෝගීතාව

2013, 2014 වර්ෂවල දැයට කිරුළ ප්‍රදර්ශනයන්හිදී පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය "විශිෂ්ඨ ප්‍රදර්ශන කලාපය" වෙනුවෙන් පිරිනමන ලද ජාතික සම්මානයෙන් පිදුම් ලැබීය. මේ සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීමෙන් එහි කොටස් කරුවෙකු වීමට හැකිවීම පිළිබඳව කු. වැ. ස. ලෙස අප ද ආඩම්බරයට පත්වනේය.

අමාත්‍යාංශය විසින් මාසිකව සිදුකරන ප්‍රගති සමාලෝචනයන් සමාගමේ ඉදිරි වැඩි දියුණු කිරීම් සඳහා බොහෝ ඉවහල් වී ඇත. අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නැංවූ පොල් වගා කළමනාකරණ ජාල ගත මෙහෙයුම් පද්ධතිය සමාගමේ අභ්‍යන්තර පාලන ව්‍යුහය වඩාත් ශක්තිමත් කිරීමට හේතුවිය.

අමත්‍යාංශයේ කඩිනම් ජාතික පොල් සංවර්ධන වැඩසටහන යටතේ උසස් තත්වයේ බීජ පොල් සැපයීම සඳහා කු. වැ. ස. ට ඇති හැකියාව හඳුනාගත් අතර 2013 වසරේදී බීජ පොල් 1,172,433 ක් සැපයීමෙන් දිවයිනේ ප්‍රමුඛ බීජ පොල් නිෂ්පාදකයා බවට පත්විය.

අමාත්‍යාංශය මගින් ලංකාවේ පොල් වගාවන්ට හානිකරන කෘමීන් සහ රෝග පාලනය සහ මර්දනය සඳහා ගත් දැඩි ප්‍රයත්නය අපි අතිශයින්ම අගයමු. අතිශය විනාශකාරී වැලිගම රෝගය සාර්ථකව පාලනය කළ අතර එය දකුණු පළාතට සීමාකිරීමට ද හැකිවිය. මයිටා උවදුරද (ඇසිරියා ගරේරෝනිස්) විලෝපික මයිටා විශේෂයක් (නියෝසෙයුලස් බරාකි) හඳුන්වා දීමෙන් පාලනය කළ හැකි විය. මෙම විලෝපික මයිටාවන් ප්‍රාදේශිකව නිෂ්පාදනය සඳහා කටුගම්පල පළාත් වතුයායතුල විද්‍යාගාරයක් ස්ථාපනය කිරීමෙන් කු. වැ. ස. ක්‍රියාකාරීකව දායක වූ අතර ඉන් අපේක්ෂිත ප්‍රතිඵලද ලබාගැනීමට ද හැකිවිය.

### නිෂ්පාදනය

2012 දී නිෂ්පාදිත පොල් ගෙඩි ගණන මිලියන 18.10 වූ අතර 2013 දී එය මිලියන 13 ක් විය. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් 2013 හා පෙර වසර දෙකේදී ඇති වූ දැඩි නියඟය හේතු සාධක වී ඇත. මෙම නියඟය වියලි කෘෂි දේශගුණ කලාපයේ පිහිටි කු. වැ. ස. වතුවලට දැඩිව බලපා ඇත. නියඟයේ මෙම දැඩි බලපෑම විද්‍යාත්මක කළමනාකාරිත්ව ක්‍රියාවලියන් හා කෘෂි තාක්ෂණික ක්‍රම වේදයන් භාවිතයෙන්

# ගරු සභාපතිතුමන්ගේ සමාලෝචනය

**"සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සියලුම අංශවල සේවක මණ්ඩලය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමන්, රජය සහ ගරු අමාත්‍යවරුන්ට මෙම සමාගමේ කළමනාකරණය වර්ෂ 2005 දී රජයට පවරා ගැනීම ගැන මාගේ කෘතඥතාවය පිරිනමමි. එමෙන්ම වර්ෂ 2007 සිට සමාගමට ද එහි ස්වර්ණමය කොටස් කරු වූ මහා භාණ්ඩාගාරයට ලාභාංශ ලබාදීමට හැකි වූ බව සඳහන් කිරීමට කැමැත්තෙමි."**

අඩුකර ගැනීමට හැකිවිය. වැටුණු පොල් එකතු කිරීම වඩාත් කාර්යක්ෂමව කිරීම, අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා ආරක්ෂක වැටවල් ඉදිකිරීම තුළින් සොරකම් අවම කිරීම සඳහා කටයුතු කරන ලදී.

## ලාභය

වර්ෂ 2013 දී බදු පසු ලාභය රුපියල් මිලියන 208.15 ක් වූ අතර 2012 දී එය රුපියල් මිලියන 177.27 ක් විය. දිගුකාලීනව පැවති නියඟය නිසාවෙන් වූ පොල් ඵලදාවේ අඩුවීම හා ජාත්‍යන්තරව ස්වාභාවික රබර් සඳහා වූ අඩු ඉල්ලුම හෙත්කොට ගෙන රබර් මිලෙහි වූ පහත වැටීමද හමුවේ මෙවන් ප්‍රගතියක් ලබාගැනීම විශේෂත්වයකි.

නොයෙකුත් සංවර්ධනයන් හා ප්‍රතිආයෝජනයන් තුළ කු. වැ. ස. මුදල් සහ කෙටි කාලීන ආයෝජනයන් රුපියල් මිලියන 335.74 ක් දක්වා ඉහළ නංවා ගත්තේය. සමාගම සතුව රුපියල් මිලියන 326 ක කෙටි කාලීන ආයෝජන ඇති අතර ඒවාට රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස පවතී. මෙම මුදල් අනාගත කෘෂිකාර්මික හා අගය එකතු කිරීමේ ව්‍යාපෘතීන් සඳහා ප්‍රයෝජනයට ගනු ඇත.

අදාල වර්ෂයේදී සමාගම රුපියල් මිලියන 40 ක් ලාභාංශ ලෙස භාණ්ඩාගාරයට ගෙවීය. මෙය භාණ්ඩාගාරය සහ ඉහල බලධාරීන්ගේ ඉහල අගැයීමට බඳුන් විය. කු. වැ. ස. ඉහලම කලමනාකාරිත්වයෙන් යුත් ප්‍රාදේශීය වැවිලි සමාගමක් (RPC) ලෙස හඳුනාගෙන ඇති බව සඳහන් කරන්නේ ඉතාම ආඩම්බර යෙනි. මෙයට අමතරව රුපියල් මිලියන 32.78 ක් බදු ඉඩම් සඳහා වූ කුලී ලෙස රජයට ගෙවා ඇති අතර කාර්යය මණ්ඩලය සඳහා වන ගෙවීම්, සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් බැර කිරීම් නිසිකලට ගෙවීමට කටයුතු කර ඇත.

## තිරසාර වර්ධනයක් සඳහා වූ ආයතනික ක්‍රමඋපාය සැලසුම්

2011-2013 සංයුක්ත සැලැස්මෙහි සඳහන් සංවර්ධන වැඩපිළිවෙල අප සමාගම සාර්ථකව ක්‍රියාවට නංවා ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ලාභය, පොල් ඵලදාව සහ ඵලදායීතාව වැඩිවීමටත් මානව සම්පත වඩාත් දියුණු වීමටත් හේතුවිය. 2005 වසරේ සිට ක. වැ. ස. සමගම ඉහල තලයේ වර්ධනයක් අත්පත් කරගෙන ඇති අතර එය ඊටත් වඩා ඉහල තලයේ වර්ධනයක් කරා රැගෙන යෑමට නිවැරදි ක්‍රමවේද මගින් ප්‍රතිලාභයන් ස්ථාවර කිරීම අවශ්‍යව ඇත.

2013 සැප්තැම්බර් මස පත්කළ නව අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ වර්ධනය වඩාත් තීව්‍ර කිරීම සඳහා නව අංශයෙන් කෙරෙහි අවධානය යොමුකර ඇත.

තම ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ අභියෝග (SWOT) විශ්ලේෂණය මගින් නව සංයුක්ත සැලැස්මක් (2014-2018) ගොඩනැංවීමට සැලසුම් දියත් කර ඇත. මෙම සැලැස්ම අගය එකතු කිරීමේ සහ අපනයන ව්‍යාපෘති තුළින් ඉහළ ලාභදායී ව්‍යවසායක් බවට පත්කිරීමේ උපාය මාර්ගික සැලසුම් කෙරෙහි අවධාන යොමු කර ඇති අතර එහිදී පොල් වගාව මත පදනම් වූ තිරසාර කෘෂි කළමනාකරණයක් තුළින් ආයතනයේ, සම්පත් හා වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. මෙම නව සැලසුම මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ අමාත්‍යාංශයේ 'කප්රුක නවෝදාව' පොල් සංවර්ධන සැලසුම හා එක්ව ගමන් කරයි. මෙම නව සැලසුමේ විශේෂිත අංගයක් වනුයේ පරිසර හිතකාමී සමාගමක් බවට පත්වීමට අවදානය යොමු කිරීමයි. ක. වැ. ස. නයිට්‍රජන් රඳවා ගන්නා ශාක වැවීම නොනවත්වා කරන අතර එමගින් පෘතුවියට මුදාහරින කාබන් ප්‍රමාණය පාලනය කිරීමටද කටයුතු කරයි. මෙම ශාක පරිසර හිතකාමී නයිට්‍රජන් පොහොර සහ ඉදිකිරීමට අදහස් නව බලශක්ති ව්‍යාපෘතීන්ට අමුද්‍රව්‍ය වශයෙන් සැපයීමට බලාපොරොත්තු වෙයි. කාබනික ගොවිතැන, සෝල්ට් වැටි ස්ථාපනය, පස සහ ජල සංරක්ෂණය පරාගනය, මායිම්වල මල් හටගන්නා සහ පලතුරු ශාක වැවීම මගින් ක්ෂුද්‍ර පරිසර වාතාවරණය වැඩිදියුණුව කෙරෙහිද අවධානය යොමුකොට ඇත. එමෙන්ම අගය එකතු කළ නිෂ්පාදන ලෙස නැවුම් පොල්තෙල්, කොහු, අඟුරු නිෂ්පාදනය සහ අපනයන නිෂ්පාදනයන්ට යොමුවීම කෙරෙහිද අවදානය යොමුකර ඇත. පොල් පර්යේෂනායතනයේ විද්‍යාඥයන්ගේ තාක්ෂණික සහයෝගිතාවය සමග සිදුකළ නියෝසිලස් බරාකි මයිටාවා බෝකිරීම සහ පරිසරයට මුදාහැරීම මගින් ජීවවිද්‍යාත්මකව ඇසෙරියා ගුරරෝමිස් මයිටා උවදුර තුරන් කිරීමටද දායක වූයෙමු. වර්ෂය පුරාවට සැකසුනු කෘෂිකාර්මික සහ කළමනාකරණ කාල සටහනකට අනුව කටයුතු කරගෙන යනු ලබන අතර මනා සේ සැලසුම් කරන ලද අභ්‍යන්තර විගණන පද්ධතියක් ක්‍රියාවට නංවා ඇත.

## මානව සම්පත්

මානව සම්පතෙහි ඇති වැදගත්කම මනාව හඳුනාගත් අප සමාගම වාණිජ කළමනාකරනයක් කෙරෙහි යොමු වූ මානව සංවර්ධන වැඩසටහන් දිගින් දිගටම ක්‍රියාත්මක කළඅතර ඒ තුළින් අවංක, කැපවීමෙන් යුත් හා විනය ගරුක සේවක පිරිසක් බිහිකිරීමට හා ඒ තුළින් ඉහළ ඵලදායිතාවයක් හා ලාභදායිත්වයක් අත් පත් කර ගැනීමට සමාගමට හැකිවිය. සේවකයින් හඳුනාගැනීම කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා හා ප්‍රතිලාභ ලබාදීම මෙම ක්‍රියාවලිය තුළ අන්තර්ගත විය.

## ප්‍රණාමය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ සියලුම අංශවල සේවක මණ්ඩලය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමන්, රජය සහ ගරු අමාත්‍යවරුන්ට මෙම සමාගමේ කළමනාකරණය වර්ෂ 2005 දී රජයට පවරා ගැනීම ගැන මාගේ කෘතඥතාවය පිරිනමමි. එමෙන්ම වර්ෂ 2007 සිට සමාගමට ද එහි ස්වර්ණමය කොටස් කරු වූ මහා භාණ්ඩාගාරයට ලාභාංශ ලබාදීමට හැකි වූ බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

කඩිනම් පොල් සංවර්ධන වැඩපිළිවෙළක් සඳහා උපාය මාර්ගික මග පෙන්වීම හා දිරිගැන්වීම් නිරතුරුවම ලබාදෙන පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමාට සහ ඒ සඳහා දුන් සහයෝගය වෙනුවෙන් ගරු නියෝජ්‍ය අමාත්‍ය ඇන්තනි වික්ටර් පෙරේරා මැතිතුමන්ටද අප කෘතඥ වෙමු. එමෙන්ම අපහට ලබාදෙන නිරන්තර සහයෝගය වෙනුවෙන් අමත්‍යාංශයේ ලේකම් නිහාල් සෝමවීර මහතා සහ අතිරේක ලේකම් ඩී. එම්. එල්. බණ්ඩාරනායක මහතා ඇතුළු අමාත්‍යාංශයේ සියලුම නිලධාරී මණ්ඩලයට ස්තුති කරමු.

අවංකව හා කැපවීමෙන් සේවය කළ කාර්යය මණ්ඩලය ගැන අපි ආඩම්බර වෙමු. වෘත්තීය සමිති විසින් ලබාදුන් සහයෝග යද, සමාජයීය දේශපාලන බලධාරීන් සහ අසල් ගම්වාසීන් ලබාදුන් සහයෝගයද අගය කරමු.

වත්මන් සභාපති ලෙස සමාගමේ හිටපු සභාපති පණ්ඩුක ජයසිංහ මහතා ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලයට මාගේ කෘතඥතාවය පළකරමි. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සහෝදර සාමාජිකයින් විසින් නිරතුරුවම ලබාදෙන වටිනා දායකත්වය සහ නිරන්තර දිරිගැන්වීම් වෙනුවෙන් මගේ හෘදයාංගම කෘතඥතාවය පළ කරමි.

අපගේ ප්‍රධාන විධායක නිලධාරි සුනිල් නිල්ලේගොඩ මහතා ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයටත්, සියලුම තරාතිරම්වල ක්ෂේත්‍ර සහ කාර්යාලීය කාර්යය මණ්ඩලයටත් ඔවුන් විසින් එක් කණ්ඩායමක් ලෙස අවංකව හා කැපවීමෙන් ලබාදුන් සහයෝගයට මාගේ විශේෂ ස්තුතිය හිමිවන අතර එම දායකත්වයට සුභාෂිංසනය පිරිනැමීමටද කැමැත්තෙමි.

නව සංවර්ධන සහ කළමනාකාරිත්ව වැඩසටහන් තුලින් තිරසාර සංවර්ධනයක් ඇතිකිරීම හා සමාගම කෙරෙහි උනන්දුව දක්වන සියලු පාර්ශවයන්ගේ ප්‍රතිලාභ තහවුරු කිරීමත් අවසාන වශයෙන් අපගේ මව්බිම ආසියාවේ ආශ්චර්යක් බවට පත් කිරීමේ ජාතික ප්‍රතිපත්තියට උරදීමත් අපගේ පරම අභිප්‍රායයි.



**ආචාර්යය සුනිල් ජයසේකර**
B.Sc. (රසායන විද්‍යාව - ගෞරව - පේරාදෙනිය - ශ්‍රී ලංකාව)
Ph.d (ක්වීන්ස්ලන්තය - ඔස්ට්‍රේලියාව) වරලත් රසායනඥ
සභාපති

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම (කු. වැ. ස.)
2014 අප්‍රේල් 22.

# අධ්‍යක්ෂක මණ්ඩලය













මහාචාර්ය
ඩබ්. පී. ගාමිණී ද අල්විස් මහතා


ජේ. දේවපිරාන් මහතා


ජී. වී. ඒ. ඩබලිව්. ඩී. ගමආරච්චි මහතා

# අධ්‍යක්ෂක මණ්ඩලය

## ආචාර්ය සුනිල් ජයසේකර

සභාපති

2013 සැප්තැම්බර් මස 24 දින කුරුණෑගල වැවිලි සමාගමේ සභාපති ලෙස පත්වන ලදි. කෘෂි පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ වසර 36 ක පළපුරුද්දක් ඇති ඒ මහතා පාංශු විද්‍යාඥයෙකු වන අතර වරලත් රසායනඥයක්ද වේ. මෙතුමා දිවයිනේ පිළිගත් රාජ්‍ය හා පුද්ගලික ව්‍යවසායයන් බොහොමයක කළමනාකාර තනතුරු හොබවා ඇත. ඔහු වර්ෂ 1977 දී පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳ විශේෂ  (ගෞරව) උපාධියක් ලැබූ අතර ඔස්ට්‍රේලියාවේ, ක්වීන්ස්ලන්ඩ් විශ්වවිද්‍යාලයෙන් (1989) ආචාර්ය උපාධිය ලැබීය. කොළඹ ක්‍රමය මගින් ඔස්ට්‍රේලියාවේදී පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා අධි ශිෂ්‍යත්වයක් ප්‍රදානය කෙරුණු අතර සුනිල් ජයසේකර මහතාට න්‍යායාත්මක භෞතික විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර ආයතනයේ (ICPT) සහ ට්‍රිස්ට්-ඉතාලිය (1987) හි සාමාජිකත්වය හිමිකරගන්නා ලදී.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ප්‍රථම ජනාධිපතිවරයා විසින් අබුඩාබියේ පොල් වගාවන් සංවර්ධනය සඳහා කැඳවන ලද ද්විත්ව සාමාජික උපදේශන කමිටුවේ පාංශු විද්‍යාඥ සාමාජිකයා ඔහුය. ඔහුගේ පර්යේෂණවල දායකත්වය ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO), ආසියා ශාන්තිකර කලාපයේ පොල් වගා කරන්නන්ගේ සංගමය (APCC),  ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය (IAES) සහ ශ්‍රී ලංකා ජාතික පොහොර මහලේකම් කාර්යාලය ආදියට ලබාදී ඇත.

ඔහු සී/ස හලාවත වැවිලි සමාගමේ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි (2010-2013) ලෙසද, උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයෙහි අධක්‍ෂක - වැවිලි ලෙසද (2006-2010), ලේක්හවුස් ආයතනයේ සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂ (2005-2006), තේ පර්යේෂණ මණ්ඩලයේ සභාපති (2004-2005) ලෙසද, හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂකවරයකු (2002-2004) ලෙසද, පොල් සංවර්ධන මණ්ඩලය සභාපති (1994-2001) ලෙසද සහ පොල් පර්යේෂණ ආයතනයේ පාංශු විද්‍යඥයෙකු (1978-1994) ලෙසද සේවය කර ඇත.

මේ දක්වා ඔහු පර්යේෂණ පත්‍රිකා 58 ක් ලියා ඇති අතර ජාත්‍යන්තර සහ මෙරට සම්මන්ත්‍රණවලදී ඉදිරිපත් කර ඇත. 1994 වසරේදී ශ්‍රී ලංකා නිර්මාණකරුවන්ගේ කොමිසමේ ආරම්භක සම්මාන උළෙලේදී (1994) වර්ෂා මානයක් (ස්වයංක්‍රීය වර්ෂා මානය) නිර්මාණය වෙනුවෙන් සම්මානයක් දිනාගන්නා ලදී. ලෝක මානව සම්පත් සංවර්ධන කොංග්‍රසයේ (2006 මුම්බායි - ඉන්දියාව) ලෝක මානව සම්පත් සංවර්ධන සම්මානය ලබාගන්නා ලද්දේ මානව සම්පත් හා ප්‍රතිපත්ති ක්‍රමෝපායන් ආයතනික ඉලක්ක සපුරා ගැනිම සඳහා මනා ලෙස හැසිර විම උදෙසාය.

ඔහු ප්‍රධාන දායකත්වයක් ලබාදුන් සමහරක් අතර පොල් සඳහා පත්‍ර - පාංශු පෝෂක මට්ටම සහ ඵලදායීතාවය පදනම්ව ඩී. එෆ. ආර්. පොහොර නිර්දේශ කිරීමේ ක්‍රමය හඳුන්වාදීම සැලකිය හැකිය. මෙය ලෝකයේ ප්‍රථම වරට සිදුවූ අතර අනෙකුත් පොල් වගාකරන රටවල් ඔවුන්ට සුදුසු පරිදි මෙය අනුගමනය කරණු ලබයි. මෙම වැඩපිළිවෙල පොල් පර්යේෂණායතනය මගින් ඉදිරියට ගෙන යන අතර මෙය වගාකරුවන්ගේ ඉහල ඉල්ලුමට හේතු වූයේ තිරසාර ඉහළ අස්වැන්න සහ මුල්‍ය ඉතුරුව නිසාය. එමෙන්ම  එප්පාවල පොස්පේට් පොල් වගාව සඳහා නිර්දේශ කිරීම (1986 සිට) විදේශ විනිමය බොහෝ සෙයින් ඉතිරි කිරීමට ඉවහල් විය. ඉන්දියානු ආකෘතියේ වැඩිදියුණු කිරීමක් ලෙස හඳුන්වා දුන් ගස් නැගීමේ උපකරණය ඔහුගෙන් වූ තවත් වැදගත් දායකත්වයකි. පොල් ඉඩම් සංවර්ධනය සඳහා ඔහු පුරෝගාමි වී පොල් සංවර්ධන මණ්ඩලයේ කප්රුක ආයෝජන ණය  ක්‍රමය ක්‍රියාත්මක කරණ ලදී (1988). මෙම ණය ක්‍රමය පොල් වගා කරුවන්ගේ ඉල්ලුම හා පිළිගැනිම මත ආවර්ත අරමුදල් ක්‍රමය යටතේ ඉතාම සාර්ථකව අද දක්වා ක්‍රියාත්මක වේ. ක්‍රමෝපායික විද්‍යානුකූල තාක්ෂණයක් යොදමින් පොල් සංවර්ධන මණ්ඩලය මගින් 1994  සිට හඳුන්වා දුන් වැඩපිළිවෙල නිසාවෙන් 2000 වසරේදී ගෙඩි මිලියන 3,096 ක්වූ වාර්තාගත ජාතික පොල් අස්වැන්නක් නෙලාගත හැකි විය. හලාවත වැවිලි සමාගම පුද්ගලික කළමනාකාරීත්වයෙන්, රාජ්‍ය කළමනාකාරීත්වයට පවරාගැනීමට 2008 වසරේ ඔහු මහත්සේ දායකත්වයක් ලබාදුනි. 2011 වසරේදී ලෝකයේ ප්‍රථමවරට ඇසෙරියා මයිටාවා පාලනය කිරීම සඳහා විලෝපික මයිටාවකු නිෂ්පාදනයට හලාවත වැවිලි සමාගමේ පලුගස්වැව වතුයායේදී විද්‍යාගාරයක් පිහිටුවන ලදී. 2013 වසරේදී ජාතික කෘෂි ව්‍යාපාර උළෙලෙදී ලෝකඩ පදක්කමක් දිනාගැනිම ඔහුගේ සභාපතිත්වය යටතේ හලාවත වැවිලි සමාගමට හැකි විය.

**පී. ජී. අමරකෝන් මහතා**

**විධායක අධ්‍යක්ෂක**

මෙතුමන් කොළඹ විශ්ව විද්‍යාලයෙන් බී.ඒ. (ගෞරව) උපාධිය සහ දර්ශනවේදී උපාධිය ලබා ඇත. 2013 සැප්තැම්බර් 24 දින කු. වැ. සමාගමේ විධායක අධ්‍යක්ෂක ලෙස එක්විය. 1974 ජූලි මාසයේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳෙනතෙක් ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ සහකාර කථිකාචාර්ය වරයෙකු ලෙස සේවය කළේය. පසුව වලපනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියා ලෙසද, ඉන්පසුව ගලගෙදර සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙසද පත්වීම ලැබීය. පසුව අමරකෝන් මහතා නුවරඑළිය සහකාර ඉඩම් කොමසාරිස ලෙසද මොනරාගල ප්‍රාදේශීය ඉඩම් කොමසාරිස් ලෙසද උසස්වීම් ලැබීය. මේ අතරතුර ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ විධායක අධ්‍යක්ෂ ලෙසද කටයුතු කළේය. මොනරාගල දිස්ත්‍රික්කයේ උප දිසාපති ලෙසද පසුව මොනරාගල දිස්ත්‍රික්කයේ දිසාපති ලෙස 1996 සිට 2002 දක්වා සේවය කලේය. මේ අතර පැල්වත්ත සීනි සංස්ථාවේ සභාපති සහ සෙවනගල සීනි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද ක්‍රියා කළේය. වසර 2002 සිට 2004 දක්වා ඌව පළාත් ප්‍රධාන ලේකම් ලෙස උසස් වීම් ලැබ 2004 වසර සිට 2011 දක්වා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ලෙස මාරු වීම් ලැබිය. දැනට කු. වැ. ස. සමාගමයේ විධායක අධ්‍යක්ෂක වන අතර එයට අමතරව පල්ලේකැලේ ජාත්‍යන්තර බෞද්ධ විද්‍යායතනයේ අධ්‍යක්ෂකවරයෙකුද වෙයි. ඔහු ජර්මනිය, නෙදර්ලන්තය, තායිලන්තය, සිංගප්පූරුව, මලයාසියාව, චීනය, නේපාලය, ඉන්දියාව, බංග්ලාදේශය, පකිස්තානය, අප්‍රිකාව ආදී රටවල විවිධ ජාත්‍යාන්තර මට්ටමේ පුහුණු වීම් ලබා ඇත.

**ආර්.ඩබ්.එම්. ජූඩ් රූකාන්ත පෙරේරා**

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

පෙරේරා මහතා ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා වශයෙන් 2010 මැයි මස 17 වෙනි දින කුරුණෑගල වැවිලි සමාගට එක් වූ අතර 2013 සැප්තැම්බර් 24 වෙනි දා ක්‍රියාකාරී අධ්‍යක්ෂ වශයෙන් නැවත පත් කෙරුණි.

පෙරේරා මහතා 1997 දී සහ ඉන් අනතුරුව 2002 සිට 2007 දක්වා කෑගල්ල මහ නගර සභාවේ සභාපති වරයා වශයෙන් තේරී පත් විය. ඔහුගේ ධූර කාලය තුළ කෑගල්ල මහ නගර සභාව දිවයිනේ විශිෂ්ඨතම නගර සභාව බවට පත් වුනු අතර හෙතම මනාප ඡන්ද වැඩිම ප්‍රමාණයක් දිනා ගනිමින් නගරාධිපති වරයා බවට පත් වූ ලාබාලතමයාද වේ.

පෙරේරා මහතා 2002 සිට 2005 දක්වා වයඹ පළාත් සංවර්ධන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම් ධූරයද 2009 දී කම්කරු අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ ලේකම් ධූරය ද 2010 සිට 2012 දක්වා අධිකරණ අමාත්‍යාංශයේ මාධ්‍ය ලේකම් ධූරයද හෙබවීය. හෙතම දැනට කෑගල්ල මහ නගර සභාවේ සාමාජිකයෙකු වශයෙන් සේවය කරයි. ඔහු කු. වැ. ස. මේ වැඩිම කලක් සේවය කල අධ්‍යක්ෂක වරයාද වේ.

# අධ්‍යක්ෂක මණ්ඩලය

**ඒ. පී. කුරුම්බලපිටිය මහතා**
**අධ්‍යක්ෂක භාණ්ඩාගාර නියෝජිත**

2013 අගෝස්තු 16 දින භාණ්ඩාගාර නියෝජිත ලෙස කු. වැ. ස. හි අධ්‍යක්ෂක මණ්ඩලයට පත් විය. හෙතෙම මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක් වන අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ උපාධිධරයෙකි. තවද ඔහු මෙම විශ්වවිද්‍යාලයේම ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා උපාධිධරයෙකි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සහතික ලත් ව්‍යාපාර ගණකාධිකාරී වරයකු වේ.

මෙතුමා 1994 ගණකාධිකාරීවරයෙකු ලෙස ශ්‍රී ලංකා රජයේ ගණකාධිකාරී සේවයට එක්විය. පසුගිය වසර 10 ක් තිස්සේ භාණ්ඩාගාරයේ නොයෙකුත් අංශයන්හි සේවය කළ අතර, දැනට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයෙකු වෙයි. ඔහු භාණ්ඩාගාර නියෝජිතයා ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය, රණවිරු සේවා අධිකාරිය, ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල, සීමාසහිත කහටගන ග්‍රැෆයිට් ලංකා ආදී රාජ්‍ය ආයතනයන්හි සේවය කර ඇත.

**මහාචාර්ය ඩබ්. පී. ගාමිණී ද අල්විස් මහතා**

2013 සැප්තැම්බර් 24 දින කු. වැ. ස. හි අධ්‍යක්ෂක ලෙස පත් විය. අල්විස් මහතා 2010 වසරේදී තම ආචාර්ය උපාධිය එංගලන්තයේදි ලබා ගත් අතර ඔහු උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව (2008) ව්‍යවහාරික මනෝවිද්‍යාව පිළිබඳ විශාරද උපාධිය කොළඹ විශ්වවිද්‍යාලය එම්. එස්. සී. උපාධිය (2005), ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධිය (1984), ඉන්දියාවේ පූනේ විශ්වවිද්‍යාලයෙන් නගර සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (1985), මොරටුව සරසවියෙන් නගර සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝම (1980), විද්‍යොදය විශ්වවිද්‍යාලය (1971) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය ද හිමිකරගෙන ඇත. ඔහු වෘත්තීය සුදුසුකම් අනුව ශ්‍රී ලංකා නගර නිර්මාණකරුවන්ගේ ආයතනයයේ සැලසුම්කරුවකු ලෙසද ශ්‍රී ලංකා පුද්ගල කළමණාකරන ආයතනයේ සාමාජිකත්වයද දරයි. ඔහු දැනට කළමනාකරණය හා ආයතන අධ්‍යයනය පිළිබඳ (2006 සිට) මහාචාර්ය වරයෙක් ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණය සහ මූල්‍ය පීඨයේ සේවය කරයි. ආයතනික මනෝවිද්‍යාව, ආයතනික චර්යා රටාව ආයතනික විශ්ලේෂණය ව්‍යවසාය යන අංශ ඔහුගේ සිත්ගත් පර්යේෂණ අංශයන් වේ. ඔහු මේ වන විට පර්යේෂණ පත්‍රිකා 20 කට අධික ප්‍රමාණයක් පර්යේෂණ සම්මන්ත්‍රණයන් හීදී ඉදිරිපත් කර ඇති අතර කළමනාකරණ විෂය සම්බන්ධයෙන් පොත් තුනක් ප්‍රකාශයට පත් කර ඇත. ඔහු මෙයට පෙර දැරූ පදවි අතර කොළඹ සරසවිය (1993-1997) කළමනාකරණය සහ මූල්‍ය පීඨයේ, වානිජ අංශයේ ප්‍රධානී, සමුපකාර කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (1987-1991) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපදේශක, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ (1984-1987) මිනිස් ජනාවාස පර්යේෂණ සහ පුහුණුව පිළිබද කළමනාකරු, ක්‍රමසම්පාදන නිලධාරි, නාගරික සංවර්ධන අධිකාරිය (1980-1984) සහ මාර්ග පර්යේෂණ ආයතනය (1972-1980) පර්යේෂණ නිලධාරි යන ඒවා වේ.

අල්විස් මහතා නොයෙකුත් මණ්ඩල සහ කමිටුවල උපදේශකත්ව තනතුරු ඉසිලූ අතර පශු සම්පත් සංවර්ධන සහ වතු යටිතල පහසුකම් පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ උපදේශකයෙකු ලෙසද කටයුතු කර ඇත.

1997 සිට 1999 දක්වා පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ උපදේශක වරයකු වශයෙන්ද, කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨයේ - උපදේශක වරයකු ලෙසද, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂන මණ්ඩලයේ (2008-2010) අධ්‍යක්ෂක වරයකු ලෙසද විවෘත විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශක වරයකු ලෙසද (1999-2000) කටයු කර ඇත.

ඔහු මීට අමතරව කොලොන්නාව රොටරි සමාජයේ (2001/2002) සභාපති ලෙස කටයුතු කල අතර ශ්‍රී ලංකාවේ හොඳම රොටරි සභාපති ලෙස සම්මානයට පාත්‍ර විය.

## ජෙයගනපතිපිල්ලේ දේවපිරාන් මහතා

2013 සැප්තැම්බර් 24 දින කු. වැ. ස. හි අධ්‍යක්ෂකවරයකු ලෙස සම්බන්ධ විය. දේවපිරන් මහතා සමස්ථ ව්‍යාපාර කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ හසල අත්දැකීම් ඇත්තෙකි. ඔහු RRR සහ සමාගමේහි කළමනාකාර හවුල් කරු ලෙස වසර 15 ක් තිස්සේ කටයුතු කර ඇති අතර 1945 සිට ගනේශන් සමාගමේ හවුල් කරුවකු වශයෙන් ක්‍රියා කරයි. කළමනාකාර අධ්‍යක්ෂක සී/ස ටෙක්ලීවර් ලංකා (පුද්ගලික) සමාගම, කළමනාකාර අධ්‍යක්ෂක ICORE ටෙක්නොලොජී සොලියුෂන් පුද්ගලික සමාගම, ජනාධිපති මහ ලේකම් කාර්යාලය යටතේ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (2007) ස්වාධීන රූපවාහිනි නාලිකාව - අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික යන තනතුරු දරා ඇත. මෙයට අමතරව ඔහු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය සහ වෙළෙඳාම්කරුවන්ගේ සංගමයේ විධායක කමිටු සාමාජිකත්වයද ඉන්දියානු සම්භවය ඇත්තන්ගේ ගෝලීය ආයතනය සහ ඉන්දු - ශ්‍රී ලංකා වැසියන්ගේ කවුන්සිලයේ සාමාජිකයෙකු ද වෙයි. දේවපිරාන් මහතා සමාජයේ සම්භාවනීය පුද්ගලයෙකු වන අතර සමාජයේ ඉහල තනතුරු කිහිපයක්ම උසුලයි. මේ අතර ජින්තුපිටිය ශ්‍රී සිවසුබ්‍රනියම් ස්වාමී කෝවිලේ භාරකරුවකු ලෙස 1978 වසරේ සිටද, පිටකොටුව වෙළෙඳුන්ගේ සංගමයේ උප සභාපති ලෙසද කටයුතු කරයි. ඔහු පොදු සමාජ උන්නතිය උදෙසා සිදුකරණ කටයුතු රාශියකට හවුල් වී සිටි.

## ජී. වී. ඩබ්. ධම්මික ගමාරච්චි - නීතිඥ

2013 සැප්තැම්බර් 24 දින කු. වැ. ස. හි අධ්‍යක්ෂකවරයකු ලෙස සම්බන්ද විය. රාජ්‍ය සහ පුද්ගලික අංශයේ නීතිඥයෙකු, ලෙස වසර 25 ක සහ බැංකුකරුවෙකු ලෙස වසර 15 ක පමණ අත්දැකීම් ඇති ඔහු දැනට විශේෂයෙන්ම සිවිල් කටයුතු පිළිබඳ නීතිඥයෙකු ලෙස කුරුණෑගල ප්‍රදේශයේ සේවය කරයි. ඔහු කහටගහ ග්‍රැපයිට් සමාගමේ - සභාපති, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ - උප සභාපති, අපනයන සංවර්ධන මණ්ඩලයේ - උප සභාපති සහ SME බැංකුවේ උපදේශක වරයකු ලෙස කටයුතු කර ඇත.

# ප්‍රධාන විධායක නිළධාරිතුමාගේ සාමාලෝචනය



"විශේෂයෙන්ම වැවිලි ක්ෂේත්‍රයේ පවතින අභියෝගාත්මක පරිසරය යටතේ වුවද නව වාර්තා තබමින් වාර්ෂිකව ඉහළ ආදායම් හා ලාභයන් අත්කර ගැනිම ඉතා දුර්ලභ සංසිද්ධියකි. මෙම දුර්ලභ සංසිද්ධිය හේතුවෙන් සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම අනෙකුත් සමාගම් වලට වඩා සුවිශේෂ වේ."

එන්. එම්. එස්. කේ. නිල්ලේගොඩ
ප්‍රධාන විධායක නිළධාරි

**"2006 වසරේදී එනම්, කළමනාකාරිත්වය පවරාගෙන වසරකට පසු රුපියල් මිලියන 38.94 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට සමාගමට හැකිවූ අතර එය කු. වැ. ස. ඉතිහාසය තුළ වූ වැඩිම මෙහෙයුම් ලාභය ලෙස වාර්තා විය. එය 2005 වසරේ වාර්තා වූ මෙහෙයුම් ලාභයට සාපේක්ෂව 15% ක වර්ධනයක් විය. 2006 වසරේ බදු පෙර ලාභය රුපියල් මිලියන 23.29 වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 18% ක වර්ධනයකි. මෙය වසරක් තුළ ඉපයූ වැඩිම බදු පෙර ලාභය ලෙස වාර්තා විය."**

2005 ජනවාරි 01 දින කු. වැ. ස. කළමනාකාරිත්වය රජයට පවරා ගන්නා අවස්ථාව වන විට රුපියල් මිලියන 7.9 ක බැංකු අයිරාවක් පැවැති අතර පවරා ගත් වසර තුළදීම එය පියවා ගැනීමට හැකිවූවා පමණක් නොව විශිෂ්ඨ ප්‍රගතියක් අත්පත්කර ගනිමින් එම වසර අගදී රුපියල් මිලියන 8.2 ක වාසිදායක බැංකු ශේෂයක් වාර්තා කිරීමට සමාගමට හැකිවිය.

එපමණක් නොව 2005 වසර සඳහා රු. මිලියන 19.75 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට හැකිවූ අතර එය වසරකදී ඉපැයූ වැඩිම බදු පෙර ලාභය ලෙස වාර්තා ගත විය.

එයට අමතරව ඔවුන්ගේ තිබූ දුර්වල ද්‍රවශීලතාවය හේතුවෙන් පුද්ගලික කළමනාකාරිත්වයට තමන්ගේ කළමනාකාර ගාස්තු වශයෙන් වූ රුපියල් මිලියන 40.6 ක මුදලද ලබාගැනීමට අපොහොසත් වූහ. 2005 01.01 දින සිට කළමනාකාරිත්වය රජයට පවරාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික කළමනාකාරිත්වය හා සමාගම අතර ඇතිවූ බේරුම් කරන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස උක්ත සඳහන් කළමනාකරණ ගාස්තුව ගෙවීමට සමාගම එකඟ වූ අතර එය සමාගම විසින් සම්පූර්ණයෙන් ගෙවා පියවා දමන ලදී.

මෙයට අමතරව පෞද්ගලික කළමනාකරණ කාලපරිච්ඡේදය තුළ පියවීමට අපොහොසත් වූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් එච්. එල්. ද මෙල් සමාගමට ගෙවිය යුතුව තිබූ රුපියල් මිලියන 8.5 ක මුදල ද සමාගම විසින් සම්පූර්ණයෙන්ම ගෙවා පියවන ලදී.

2006 වසරේදී එනම්, කළමනාකාරිත්වය පවරාගෙන වසරකට පසු රුපියල් මිලියන 38.94 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කිරීමට සමාගමට හැකිවූ අතර එය කු. වැ. ස. ඉතිහාසය තුළ වූ වැඩිම මෙහෙයුම් ලාභය ලෙස වාර්තා විය. එය 2005 වසරේ වාර්තා වූ මෙහෙයුම් ලාභයට සාපේක්ෂව 15% ක වර්ධනයක් විය. 2006 වසරේ බදු පෙර ලාභය රුපියල් මිලියන 23.29 වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව 18% ක වර්ධනයකි. මෙය වසරක් තුළ ඉපයූ වැඩිම බදු පෙර ලාභය ලෙස වාර්තා විය.

මෙය වර්ෂයක් ඇතුළත කු. වැ. ස. සමාගම ලැබූ ඉහළම ලාභය ලෙස වාර්තාගත විය. වර්තමාන කළමනාකාරීත්වය යටතේ සමාගම වසරක් පාසා නව වාර්තාවන් තැබීමට සමත් විය.

2011 වසරේදී සමාගම ලැබූ විශිෂ්ඨ ප්‍රගතිය හා ජාතික දායකත්වය අගයමින් 2012 වසරේ පැවති ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන උළෙලේදී කු. වැ. ස. සමස්ත ලංකා රන් සම්මානයෙන් පිදුම් ලැබීය. මෙය සමාගමේ ඉතිහාසය තුළ ලැබූ විශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැකිය. එයට අමතරව මහා පරිමාන නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය නැවත වරක් දිනාගනිමින් විශිෂ්ඨ ප්‍රගතියේ ස්ථාවර තාවය තවදුරටත් සහතික කරන ලදී.

සමාගමේ ප්‍රගතිය අගය කරමින් 2013 වසරේදී සමාගම ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන ප්‍රදානයේදී නැවත වරක් රන් සම්මාන දෙකක් දිනා ගත්තේය. ඒවා නම් පිට පිට දෙවනවරටත් දිනාගත් ජාතික කෘෂි ව්‍යාපාර රන් සම්මානය සහ මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) සඳහා තෙවන වරටත් දිනාගත් රන් සම්මානයන්ය. මෙම විශේෂිත ජයග්‍රහනයන් සමාගමට අති විභවය හා හැකියාව පිළිබඳව සේවකයන් තුල ඇඩි විස්වාසයක් ඇති කල අතර ජයග්‍රාහී මානසිකත්වයක් ඇති කිරීමට හේතු විය.

රජය කු. වැ. ස. සමාගමේ කළමනාකාරිත්වය පවරාගෙන රජයෙන් පරිපාලනය වන කළමනාකාරිත්ව කණ්ඩායමක් ස්ථාපිත කල දා පටන් අපි සමාගම නව දිශාවකට ගෙන ගියා පමණක් නොව සමාගමේ ආදායම්, මුදල් සහ මුදල් සමාන දෑ පිළිබඳ වාර්තාවන් වසරින් වසර බිඳ දැමුවෙමු. අනාගත තිරසාරභාවය සඳහා විද්‍යාත්මක කෘෂි සහ වගා කළමනාකරණ ක්‍රමයන් ක්‍රියාවට නංවමින් ආයෝජනයන් සිදු කලෙමු. මේ වන විට කුරුණෑගල වැවිලි සමාගම මුළු පොල් වගා වපසරියෙන් 20% කට වැඩි වපසරියක් පොල් යටි වගා ලෙස නඩත්තු කරයි. 2005 වසරේදී පොල් වගා වපසරිය 1.5% ක් වූ අතුරු වගා වපසරිය 12% ක් දක්වා ඉහල නැංවූයෙමු. 2005 දී ඉඩම් අක්කරයකට 37 ක් වූ ඵල දරන ගස් ප්‍රමාණය, ගස් 58 ක් දක්වා ඉහල නැංවූයෙමු. අපගේ කෘෂි කළමනාකරණ ක්‍රමවේදයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය වෙළෙඳපොළ මිල ගණන් වලට වඩා ඉහළ මිලක් ලබා ගැනිමට අපට හැකි විය. අපගේ මෙම ප්‍රගතිය ජාතික අධිකාරීන් පමණක් නොව ස්වාධීන පාර්ශවයන්ද හඳුනාගෙන ඇති අතර එය ඉහළින් අගය කර නොයෙකුත් සම්මානයන් පුදකර ඇති බවද සතුටින් සඳහන් කරමි.

# ප්‍රධාන විධායක නිළධාරිතුමාගේ සාමාලෝචනය

**"පසුගිය වසරේදී මුහුන දුන් නොයෙකුත් අභියෝග මධ්‍යයේ සමාගම රුපියල් මිලියන 193.67 ක් වන මෙහෙයුම් ලාභවක් සහ රුපියල් මිලියන 208.15 ක බදු පසු ලාභයක් අත්කර ගැනිනි. මෙය 2012 වසරේ මිලියන 177.27 ක් වු ලාභය සමඟ සංසන්දනය කිරීමේ දී 17% ක වර්ධනයක් වන අතර ඉතිහාසයේ ඉහළම බදු පසු ලාභය ලෙසද වාර්තා වේ."**

කු. වැ. ස. ලබා ඇති විශේෂිත ප්‍රගතිය තුලින් සේවක කණ්ඩායමේ ඇති ඉහල මට්ටමේ කළමනාකරණ සහ වෘත්තීයමය නිපුණතාවය සහ විශේෂඥතාවය පිළිබිඹු වන අතර 2013 වසරේදී ලබාගත් ප්‍රතිඵල තුල ඔවුන්ගේ බලාපොරොත්තු මල්ඵලගැන්විනි. පසුගිය වසරේදී මුහුන දුන් නොයෙකුත් අභියෝග මධ්‍යයේ සමාගම රුපියල් මිලියන 193.67 ක් වන මෙහෙයුම් ලාභවක් සහ රුපියල් මිලියන 208.15 ක බදු පසු ලාභයක් අත්කර ගැනිනි. මෙය 2012 වසරේ මිලියන 177.27 ක් වු ලාභය සමඟ සංසන්දනය කිරීමේ දී 17% ක වර්ධනයක් වන අතර ඉතිහාසයේ ඉහළම බදු පසු ලාභය ලෙසද වාර්තා වේ.

විශේෂයෙන්ම වැවිලි ක්ෂේත්‍රයේ පවතින අභියෝගාත්මක පරිසරය යටතේ වුවද නව වාර්තා තබමින් වාර්ෂිකව ඉහළ ආදායම් හා ලාභයන් අත්කර ගැනිම ඉතා දුර්ලභ සංසිද්ධියකි. මෙම දුර්ලභ සංසිද්ධිය හේතුවෙන් කු. වැ. ස. සමාගම අනෙකුත් සමාගම් වලට වඩා සුවිශේෂ වේ.

## පොල් නිෂ්පාදනය

2011 වසරට පෙර සිටම ඇතිවූ කාලගුණ වෙනස්වීම් වල අහිතකර ප්‍රතිඵල සමග නියගයෙන් වූ හානි නිසාවෙන් 2013 පොල් වගාවට අභියෝගාත්මක වසරක් විය. පොල් වලින් ලද ආදායම පෙර මුදල් වර්ෂයේ රුපියල් මිලියන 404.19 ක් වූ ආදායමට වඩා 0.5% කින් අඩු විය. මෙයට බලපාන ප්‍රධානතම හේතුව වූ යේ 2012 වසරට සාපේක්ෂව 28% කින් පොල් අස්වැන්න පහල බැසිමයි. කෙසේ වෙතත් ලැබූ ඉහළ මිල ගණන් හේතුවෙන් මෙම තත්වය සමනය කර ගැනීමට හැකි විය. 2013 වසරේදී ගෙඩියකට හොඳ විකුණුම් මිලක් ලැබුණු අතර විකුණුම් මිල සාමාන්‍ය රු. 30.95 විය.

විද්‍යාත්මක කළමනාකාර ක්‍රමෝපායයන් සහ කෘෂිකාර්මික ක්‍රමෝපායයන් අපගේ ප්‍රගතියට හේතු වේ. වැඩිදියුණු කළ කළමනාකරන පාලනයන් සමග දිරිගැන්වීමේ වැඩසටහන් සහ ආකල්ප වෙනස් කිරීම් තුල නිෂ්පාදන අපතේයාම බොහෝ ලෙස අඩුකර ඵලදායීතාවය ඉහළ නංවා ගැනිමට හේතු විය. නියමිත වෙලාවට නිසිලෙස පොහොර යෙදීම, පාංශු කළමනාකරණය සහ අඛන්ඩව යටි වගාව සිදුකිරීම වැනි විද්‍යාත්මක කෘෂිකාර්මික ක්‍රමෝපායන් අස්වැන්න වර්ධනයට හේතු වන අතර නොමේරු වගාවන් අනාගත තිරසාර අස්වැන්නක් සහතික කරයි. මනා මූල්‍ය කළමනාකරණය සමග පිරිවැය පාලනය, විනිවිද භාවයෙන් යුත් ගිණුම්කරනය මගින් කාර්යක්ෂම මූලධන කළමනාකාර හැකියාවක් ඇතිකරන අතර සමාගම මූල්‍ය අස්ථාවරත්වයකට පත්වීම සම්පූර්ණයෙන්ම වලකාලයි.

## රබර් නිෂ්පාදනය

අපගේ දෙවන ප්‍රධාන වගාව වන රබර්වලින් ලත් ආදායම 2012 වසරේදී රුපියල් මිලියන 77.96 ක් වූ අතර එය 2013 දී රුපියල් මිලියන 62.41 ක් දක්වා පහත වැටුණි. අඩු ඉල්ලුම සහ ඉහළ ගිය සමස්ත ජාත්‍යන්තර නිෂ්පාදනය හේතුවෙන් 2012 දී රු. 371 වූ රබර් කිලෝවක මිල 2013 දී රු. 330 දක්වා පහත වැටුනි. 2012 දී කිලෝ ග්‍රෑම් 209,898 ක් වූ රබර් නිෂ්පාදනය ද 2013දී කිලෝ 188,934 දක්වා 10% කින් පහත වැටුණි. මෙය ප්‍රධාන වශයෙන් රබර් කිරි කැපීමට අයහපත් ලෙස බලපෑ කාලගුණ තත්ත්වයන් නිසා වෙන් සිදු විය.

2006 වසරේ සිට මේ දක්වා ඉතාමත්ම සාර්ථක ලෙස අතුරුභෝග ව්‍යාප්තිය සිදුකර ඇති අතර ඒ තුළින් සමාග මට වර්ධිත ආදායම් ගලාඒමක් දක්නට ලැබේ. මෙය සමාග මට අතිරේක ආදායම් මාර්ගයක් වනවා පමණක් නොව සීමිත භෝග කීපයක් මෙත වූ දැඩි රඳා පැවැත්ම තුළ ඇති වන්නා වූ අවදානම අඩුකිරීමට ද ඉවහල්වී ඇත.

## අතුරු භෝග වගාවන්

2005 වසරේදී සමාගමේ කළමනාකාරිත්වය භාරගන්නා අවස්ථාවේදී හෙක්ටයාර් 62.5 ක් වූ අතුරු වගා වපසරිය හෙක්ටයාර් 476.05 ක් දක්වා වර්ධනය කර ඇත. අතුරුබෝග වගා ලෙස ගම්මිරිස්, කුරුඳු, රඹුටන්, දූරියන්, ඩ්‍රැගන් ෆ්‍රුට්, අඹ, කොකෝවා, කජු වැනි බෝග වගා කර ඇත.

දිවයිනේ ඇති විශාලතම දූරියන් වගාව කු. වැ. ස. අයත් මහයාය වතුයාය තුළ ස්ථාපනය කර ඇති අතර එහි දූරියන් ගස් 1000 කට වැඩි ප්‍රමාණයක් පවතී. අතුරු බෝග වගාවන් වැඩි ප්‍රමාණයක් පරිනත භාවයට පත්වීමත් සමග ප්‍රවර්තන වර්ෂයේ අතුරුබෝගවලින් ලද ආදායමේ වර්ධනයක් පෙන්නුම් කරයි. 2012 වසරේදී අතුරු බෝගවලින් ලද ආදායම රු. මි. 9.66 ක් වූ අතර 2013 දී එය රු. මි. 11. 12 දක්වා 15% කින් වර්ධනය වී ඇත.

## ප්‍රණාමය

පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන ගරු අමාත්‍ය ජගත් පුෂ්පකුමාර මැතිතුමාට, නියෝජ්‍ය අමාත්‍ය ගරු ඇන්තනි වික්ටර් පෙරේරා මැතිතුමාට, අමාත්‍යංශයේ ලේකම් නිහාල් සෝමවීර මහතා ඇතුලු සියලුම අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට සහ හිටපු සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයට, සමාගම වර්තමාන තත්ත්වයට ගෙන ඒම සඳහා වසර ගණනාවක් තිස්සේ ලබාදුන් අගනා දිරිගැන්වීම වෙනුවෙන්, මගේ කෘතඥතාවය පුද කරමි. අදාල වර්ෂය පුරාම වර්තමාන සභාපතිතුමන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය දුන් මඟ පෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් මාගේ ස්තුතිය පිරිනමමි.

එමෙන්ම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සියලුම සාමාජිකයන්ටත්, වතු අධිකාරිවරුන්ටත්, සියලුම සේවක පිරිසටත්, වර්ෂය පුරා ක්‍රියාකාරීව හා කැපවීමෙන් ලබාදුන් දායකත්වය වෙනුවෙන් මම කෘතඥ වෙමි. කු. වැ. ස. සමාගමේ මෙම ජයග්‍රාහී කණ්ඩායම වෘත්තීයභාවය සහ දැඩි කැපවීම පිළිබඳ ආදර්ශයක් වන බව මාගේ විශ්වාසයයි.



**එන්. එම්. එස්. කේ. නිල්ලේගොඩ**
ප්‍රධාන විධායක නිළධාරි

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම (කු. වැ. ස.)
2014 අප්‍රේල් 22

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය



**එන්. එම්. එස්. කේ. නිල්ලේගොඩ**
ප්‍රධාන විධායක නිළධාරි



**එස්. එම්. එම්. සමරකෝන්**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



**පී. එම්. ඩී. ජී. ප්‍රේමතිලක**
කළමනාකරු - මූල්‍ය



**එම්. එම්. ජේ. කුරේ**
කළමණාකරු - විගණන



**අයි. ඒ. ගුණවර්ධන**
කළමණාකරු - මානව සම්පත් සහ පරිපාලන



**එස්. එම්. ආර්. පී. සත්කුමාර**
කළමණාකරු - වතු අධීක්‍ෂණ සහ සම්බන්ධීකරණ



**ජේ. කේ. ජේ. පී. ජයවර්ධන**
කළමණාකරු - අලෙවි

# පලාත් වතු අධිකාරීවරු



කේ. ජේ. එස්. පෙරේරා



එම්. එල්. ඒ. පී. පෙරේරා



ජී. කේ. ඒ. ජයවර්ධන



කේ. එල්. එච්. සී. පෙරේරා



ඒ. එම්. පී. අබේකෝන්



කේ. පී. ඩී. එන්. කළුගල්ල



යූ. පී. ආර්. එම්. පතිරණ



එම්. ටී. ජේ. පෙරේරා

# අපේ වගාවන්







අප උත්සාහා දරන්නේ, මූල්‍ය ප්‍රගතිය අත්ලත්කර ගැනීම මෙන්ම සමස්ථ සමාජ හා පාරිසරික සංවර්ධනය තුලින් තිරසාර ව්‍යවසායක් ඇතිකරලීමටයි.

















# කළමනාකරණ සංවාදය හා විශ්ලේෂනය

### කළමනාකරණ සංවාදය
### සමාගම පිළිබඳව

කුරුණෑගල වැවිලි සමාගම පූර්ණ රජය සතු සමාගමක් ලෙස 1992 ජූනි 18 දින රජයේ පුද්ගලීකරණ ප්‍රතිපත්තිය යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලය මගින් එවකට මණ්ඩල අංක V යටතේ පාලනය වූ වතු සමූහයක් ඒකාබද්ධ කිරීමෙන් ස්ථාපනය කරන ලදී.

1992 ජූනි 18 සිට 2004 දෙසැම්බර් 31 දක්වා සී/ස කුරුණෑගල වැවිලි සමාගම කළමනාකරණය වූයේ සී/ස ලේක්හවුස් ප්ලාන්ටේෂන්ස් පුද්ගලික සමාගම මගින්ය. වසර 13 ක් තිස්සේ වූ දුර්වල පාලනය නිසාවෙන් රජය එහි කළමනාකාරිත්වය 2005 ජනවාරි 01 දින සිට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණයට යටත්ව පවරා ගනු ලැබීය. මෙය කුරුණෑගල වැවිලි සමාගමේ හැරවුම් ලක්ෂය ලෙස සැලකිය හැකිය. අනතුරුව 2006 දී පොල් සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණයට නතු විය. 2007 අප්‍රේල් සිට මෙම සමාගම රාජ්‍ය වතු කළමනාකරණ සහ සංවර්ධන අමාත්‍යාංශය යටතේද, 2010 ජූනි සිට රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේද ක්‍රියාත්මක විය. නව තාක්ෂණය යටතේ පොල් වගාව සහ පොල් ආශ්‍රිත කර්මාන්ත සංවර්ධනය උදෙසා 'මහින්ද චින්තන' ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසින් නව කැබිනට් අමාත්‍යාංශයක් ලෙස පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය 2010 නොවැම්බර් මසදී ස්ථාපනය කරන ලදී. එතැන් සිට කු.වැ.ස. සමාගම එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි.

### මෙහෙයුම් විෂයපථය

කු.වැ.ස. කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක තුනෙහි වූ විවිධ කෘෂි දේශගුණික කලාපවල පිහිටි වතුයාය 08 කින් සමන්විත වන අතර සමාගම සතුව ඉඩම් හෙක්ටයාර 5261.17 ක් පවතී. මෙම වතුයායන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක තුනක් පුරා විහිදුනු කුඩා වතු කොටස් සමූහයකින් සමන්විත වේ.

පුළුල් භූගෝලීය පරාසයක මෙම වතු පිහිටීම නිසා කළමනාකරන සහ අධීක්ෂණ පිරිවැය අධික වීමට හේතුවී ඇත. ඒ නිසාවෙන් 2012 සහ 2013 වසරවලදී සමහර වතු යායන් ඒකාබද්ධ කිරීමට කටයුතු කරන ලදී. 2013 වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාවැව පිහිටි ධාතුසේනපුර වතුයාය සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි හිරියාල වතුයාය ඒකාබද්ධ කරන ලද අතර 2012 වර්ෂයේදී වාරියපොල පලාත් වතුයාය හිරියාල පළාත් වතුයාය සමග ඒකාබද්ධ කරන ලදී. මෙය මෙහෙයුම් පිරිවැය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීමට තුඩුදුන් අතර. මේ මගින් උසස් ඵලදායීතාවයක් සඳහා විද්‍යාත්මක කෘෂිකාර්මික භාවිතයන් ඒකාකාරී අන්දමින් කිරීමට හැකිවිය.

මෙම ඒකාබද්ධ කිරීමෙන් පසුව කුරුණෑගල වැවිලි සමාගම සතුව වතුයායන් 8 ක් ඇති අතර ඒවා නම්, ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි අත්තනගල්ල හා මහායාය සහ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි දඹදෙණිය, කටුගම්පල, කුරුණෑගල, දොඩම්ගස්ලන්ද, නාරම්මල හා හිරියාල වතුයායන් වේ.

පළාත් වතුයායන්ගේ භූමි ප්‍රමාණය




### කළමනාකරණයේ ගුණාත්මකභාවය

2005 වර්ෂයේදී සිදුවූ කළමනාකරනයන්ගේ වෙනස්වීමෙන් පසුව උසස් ගණයේ කළමනාකාර ක්‍රමවේදයන් අනුගමනය කළ අතර ජාතික ආර්ථිකයටත් පොල් කර්මාන්තයටත් ජනතාවගේ සුබසිද්ධියටත් විශාල දායකත්වයක් ලබාදීමටත් හැකිවී තිබේ. සමාගම ලබා ඇති මූල්‍යමය සහ කෘෂිකාර්මික ප්‍රගතිය තුළින් කු. වැ.ස. දිවයිනේ ඇති මනා කළමනාකාරිත්වයෙන් යුත් ප්‍රාදේශීය වැවිලි සමාගමක් බව මේ වන විට ඔප්පුකර හමාරය.

2011 වර්ෂයේදී ජාතික කෘෂි ව්‍යාපාර ක්‍රියාවලිය මගින් සංවිධානය කල ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන ප්‍රධානයේදී කු. වැ. ස. මහා පරිමාන නිෂ්පාදක (වැවිලි) සඳහා පිරිනමන රන් සම්මානය දිනාගත් අතර ජාතික මට්ටමේ තෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී.

2012 වසරේදී ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන ප්‍රදානයේදී ජාතික කෘෂි ව්‍යාපාර ස්වර්ණ සම්මානය දිනාගත්තේය. කු. වැ. ස. සමාගම නැවතත් මහා පරිමාන නිෂ්පාදක (වැවිලි) අංශයේ තම ස්ථානය තහවුරු කරමින් නැවත වරක් ඒ සඳහා වූ රන් සම්මානය දිනා ගත්තේය.

2013 වර්ෂයේ දී කු. වැ. ස. ජාතික කෘෂි ව්‍යාපාර සම්මාන ප්‍රදාන උළෙලේදී රන් සම්මාන දෙකක් දෙවන වරටත් දිනා ගත්තේය.




## නිෂ්පාදනයන්

සමාගම සතුව පොල් වගා හෙක්ටයාර 4,102.33 ක්ද, රබර් හෙක්ටයාර 253,62 ක්ද ඇත. පොල් වගාව යටතේ අතුරු භෝග ඇතිකිරීමද සමාගම සිදුකරයි. පළාත් වතු 8 හිම ප්‍රධාන වගාව පොල් වන අතර රබර් වගාව අත්තනගල්ල, මහයාය සහ දොඩම්ගස්ලන්ද වතුයායන් වලට සීමාවී ඇත.

### ඉඩම් භාවිතය




භූමි ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා රබර් වගාව ව්‍යාප්ත කිරීමට සුදුසු ඉඩම් කට්ටි කුරුණෑගල සහ නාරම්මල පළාත් වතුයායන් තුල හඳුනාගෙන ඇති අතර ඒ කොටස්වල රබර් ස්ථාපනය ආරම්භ කර ඇත.

### පොල් වගා වපසරිය




## මූල්‍යමය විශ්ලේෂණය

සමාගමේ කළමණාකාරිත්වය පෞද්ගලික අංශයෙන් පවරාගත් දින සිට සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵල වල විශාල ප්‍රගතියක් පෙන්නුම් කරයි.

### ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය



# කළමනාකරණ සංවාදය හා විශ්ලේෂනය

**ලාභාංශ ගෙවීම**

බොහෝ රාජ්‍ය ආයතනයන් භාණ්ඩාගාරයට බරක්ව පවතින කාලයක කු. වැ. සමාගම ස්වයං මූල්‍ය උත්පාදන ආයතනයක් බවට පත්වීමට අමතරව, සමාගමේ පූර්ණ අයිතිය ඇති ස්වර්ණමය කොටස්කරු වන භාණ්ඩාගාරයට ලාභාංශ ගෙවීමද සිදු කරන ලදී. වර්ෂ 2005 දී කු.වැ.ස. සමාගමේ කළමනාකාරිත්වය රජය විසින් පවරාගත් පසුව සිය ස්වර්ණමය කොටස්කරුට පහත පරිදි ලාභාංශ ගෙවා ඇත. මෙම වසරේදී රු. මිලියන 40 ක ලාභාංශයන් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කරන බවද තවදුරටත් ස්වයං මූල්‍ය උත්පාදන සමාගමක් ලෙස සාර්ථකව කටයුතු කර ගෙන යන බවද ප්‍රකාශය කිරීමට කැමැත්තෙමු. 2013 වසර සඳහා ප්‍රකාශිත මිලියන 40 ක ලාභාංශය ද සහිතව 2007 සිට මේ දක්වා රුපියල් මිලියන 230 ක් ලාභාංශ ලෙස රජයට ගෙවීමට කටයුතු කර ඇත.

ලාභාංශ ගෙවීම




**දිරිගැන්වීම් දීමනා**

සේවකයන් උනන්දු කිරීම අරමුණු කරගෙන කාර්යසාධනය මත පදනම් වූ දිරිගැන්වීමේ දීමනාවක් සේවකයන්හට ලබාදෙන අතර එය ඉතා ඉහළ මට්ටමක ප්‍රගතියන් ලබාගැනීමට සමාගමට හැකි වූ බව සඳහන් කරමු.

- 2005 දී අත්කරගත් ප්‍රගතිය නිසාවෙන් ඉතිහාසයේ ප්‍රථම වතාවට රුපියල් මිලියන 4.1 ක් දිරි ගැන්වීමේ දීමනාවක් ලෙස ගෙවීමට කටයුතු කරන ලදී. මාසික වැටුප් ලබන සේවකයන් සතුව මාසික වැටුපට සමාන මුදලක් හා දෛනික වැටුප් ලබන්නන්ට රුපියල් දෙදහසක මුදලක් දිරි දීමනා ලෙස ගෙවන ලදී.

- 2006 වසරේදී රුපියල් මිලියන 7.1 ක මුදලක් දිරි දීමනා ලෙස ගෙවන ලදී. මාසික වැටුප් ලබන්නන්ට මාස 1 1/2 ක වැටුපට සමාන මුදලක් හා දෛනික වැටුප් ලබන්නන්ට රු. 3,000 ක මුදලක් ගෙවීමට කටයුතු කරන ලදී.

- 2007 වසරේදී රුපියල් මිලියන 10.3 ක් දිරි දීමනා ලෙස ගෙවූ අතර මාසික වැටුප් ලබන්නන්ට මාස 1 1/2 ක වැටුප් හා දෛනික වැටුප් ලබන්නන්ට රු. 5,000/= ක් වශයෙන් ගෙවන ලදී.

- 2008 වසරේදී රුපියල් මිලියන 12.5 ක මුදලක් ගෙවූ අතර මාසික වැටුප් ලබන්නන්ට මාස 1 1/2 ක වැටුප් සහ දෛනික සේවකයන්ට රුපියල් 7,500/= ක් වශයෙන් ද ගෙවන ලදී.

- 2009 වසරේදී ද ඉහත කාර්ය සාධන ප්‍රතිපත්තිය යටතේම මාසික වැටුප් ලබන්නන්ට සහ දෛනික වැටුප ලබන්නන්ට රුපියල් මිලියන 13.25 ක මුදලක් ගෙවන ලදී.

- 2010 වසරේදී උක්ත පදනම යටතේම දිරි ගැන්වීම් දීමනා ලෙස රුපියල් මිලියන 13.3 ක් ගෙවන ලදී.

- 2011 වසරේදී මාසික වැටුප් ලබන්නන්ට මෙම ගෙවීම මාස 2 ක වැටුපක් හා දෛනිකව ලබන්නන්ට රු. 10,000 /= ක මුදලක් වශයෙන් රුපියල් මිලියන 21.2 ක් ගෙවන ලදී.

  **මෙහිදී සඳහන් කිරීමට ඇති වැදගත් කාරණය වන්නේ අඩු ආදායම්ලාභී කාණ්ඩය නියෝජනය කරන දෛනික වැටුප් ලබන්නන් 2005 වසරේදී ඔවුන් දිරි දීමනා ලෙස ලැබූ මුදලමෙන් හත්ගුණයක් මුදලක් දිරිගැන්වීම ලෙස 2011 වසරේදී ලබාගැනීමයි.**

- 2012 දී දිරිගැන්වීමේ දීමනා ගෙවීමේ ප්‍රතිපත්තිය එලෙසම අනුගමනය කරමින් රුපියල් මිලියන 22.7 ක් ගෙවන ලදී.

කාර්යසාධන මත පදනම් වූ දිරිගැන්වීමේ දීමනා



- වත්මන් මුදල් වර්ෂයේදී එම ගෙවීම් ප්‍රතිපත්තියම අනුගමනය කරමින් රුපියල් මිලියන 27.4 ක් දිරිදීමනා ලෙස ගෙවන ලදී.

## ප්‍රසාද මුදල් ගෙවීම

2009 වසර දක්වා කු. වැ. ස. සේවකයන් හට  එක් එක් වතුයායේ ප්‍රගතිය මත ලාභාංශ පංගු ගෙවන ලදී. මෙය රුපියල් 1,000 ක අවමයේ සිට වෙනස් විය. 2009 වසරේදී භාණ්ඩාගාර විධි විධානයන් පදනම් කරගෙන ප්‍රසාද දීමනා ගෙවීය. 2009 සිට ගෙවූ ප්‍රසාද දීමනා පහත සඳහන් පරිදි වේ.

ප්‍රසාද මුදල් ගෙවීම




## බදු ගෙවීමෙන් පසු ලාභය

වසරින් වසර නව වාර්තා බිහිකරමින් ඉදිරියට යන ගමන් මගේදී කු.වැ.ස. 2013 වසරේදී ලාභදායීත්වයේ වර්ධනයක් පෙන්වීමට සමත්විය. මෙහි සුවිශේෂත්වය වන්නේ අනෙකුත් බොහෝ වැවිලි සමාගම් හා ව්‍යවසායකයන් පසුගිය වසරට සාපේක්ෂව, 2013 වසර තුළ අඩුලාභ දායත්වයක් පෙන්නුම් කරන විට කු.වැ.ස. ලාභදායිත්වයේ වර්ධනයක් ඇතිකර ගැනීමයි.

බදු පසු ලාභය




## වත්කම්වල වර්ධනය

තිරසාර සංවර්ධනය සඳහා වූ දිගුකාලීන ක්‍රමෝපාය අනුව යමින් මෙම වසර තුළද සමාගම එහි සංවර්ධන හා භෝග විවිධාංගිකරණය ක්‍රියාදාමයන් අඛන්ඩව කරගෙන යන ලදී. ඉතා විශාල මුදලක් වන රුපියල් මිලියන 186.70 ක් තරම් වූ විශාල මුදලක් ප්‍රාග්ධන වත්කම් සඳහා ආයෝජනය කරන ලද අතර එයින් රුපියල් මිලියන 93.66 ක් පොල් යටිවගා, අලුත් රබර් වගා සහ අතුරු වගා ඇතිකිරීමටත් සහ නොමේරූ වගා නඩත්තුව සඳහාත් වැය කරන ලදී.

2013 වසර අවසානයේදී සමාගමේ මුළු වත්කම් රුපියල් බිලියන 1.62 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා රුපියල් මිලියන 165.43 ක වර්ධනයකි. ඉන් රුපියල් බිලියන 1.14 ක් ජංගම නොවන වත්කම් වූ අතර රුපියල් මිලියන 473.18 ජංගම වත්කම් විය. පෙර මුදල් වර්ෂය හා සංසන්දනයේදී මෙම වර්ෂයේදී ජංගම නොවන වත්කම් 15% ක වර්ධනයක් පෙන්වන අතර ජංගම වත්කම් 3% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

2013 දෙසැම්බර් 31 වන විට සමාගමේ කෙටිකාලීන ආයෝජන රුපියල් මිලියන 326 ක් වූ අතර එය 2012 දී රුපියල් මිලියන 320 කි. මේවා රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ලෙස පවතී.

වත්කම් ව්‍යුහය




## ද්‍රවශීලතාව කළමනාකරණය

සමාගමේ ජංගම වත්කම් අනුපාතය 5.61 (වාර ගණන) වන අතර එය 2012 දී 5.03 (වාර ගනන) විය. පෙර වර්ෂය හා සැසඳීමේදී ක්ෂණික වත්කම් අනුපාතය 4.43 සිට 4.84 දක්වා වැඩිදියුණු විය.

# කළමනාකරණ සංවාදය හා විශ්ලේෂනය

### කොටසක ශුද්ධ වත්කම හා කොටසක ඉපැයුම

මේ වසරේ කොටසක ඉපැයුම රුපියල් 10.41 ක් වූ අතර පෙර වර්ෂය සඳහා එය රුපියල් 8.86 ක් විය. කොටසක ශුද්ධ වත්කම 2012 දී රුපියල් 55.55 වූ අතර 2013 දී රුපියල් 64.00 ක් විය.




### පොල් නිෂ්පාදනය

2013 වසර අවසානයේදී පොල් ඵලදරන භූමි ප්‍රමාණය හෙක්ටයාර 3264.04 ක් විය. මෙය පෙර වසර හා සැසදීමේදී 4% ක පහත වැටීමකි. මෙයට හේතුවූයේ යටි වගාවන් සිදුකිරීමත් රාජ්‍ය අවශ්‍යතාවයන් සඳහා ඉඩම් නිදහස් කිරීමටත් සංවර්ධන වැඩසටහන් සඳහා ඉඩම් පවරාගැනීමත්ය. වර්තමානයේදී පොල් යටි වගා අක්කර ප්‍රමාණය මුළු පොල් වගා ප්‍රමාණයෙන් 20% කි. කු.වැ.ස. සමාගමේ වගාවන්හි අක්කරයට පොල් ගස් ගණන 58 කි. ප්‍රශස්ත ගහනය වන්නේ අක්කරයකට පොල් ගස් 60 කි. නමුත් 2005 දී අක්කරයකට පැවති ගහනය 35 ක් පමණ විය. පොල් සංවර්ධන මණ්ඩලය විසින් පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේදී පොල් අලෙවි කරන අතර විකිණීමේ ක්‍රියාපටිපාටියේ විනිවිදභාවය හා වගකීම් සහගත භාවය ඒ තුළින් වඩාත් වර්ධනය වී ඇත. පොල්තෙල් හා කොප්පරා නිෂ්පාදනය ඉතාමත් සීමිත මට්ටමකින් කරගෙන යනු ලබයි.

කු.වැ.ස. ප්‍රධාන භෝගය පොල්වන අතර ප්‍රධානතම ආදායම් මූලාශ්‍ර වන්නේද පොල්ය. 2012 වසරේදී රුපියල් මිලියන 404.19 ක් වූ පොල් ආදායම 2013 වසරේදී රුපියල් මිලියන 402.37 ක් දක්වා 5% කින් අඩුවිය. බොහෝ අවස්ථාවන්හිදී කු.වැ.ස. පොල් වෙන්දේසියේ විකුණුම් සාමාන්‍යයට වඩා ඉහළ සාමාන්‍යයක් අත්කර ගැනීම විශේෂයෙකි. 2013 වසරේදී පොල් ගෙඩියක සාමාන්‍ය විකුණුම් මිල රුපියල් 30.95 ක් වූ අතර එය 2012 වසර සඳහා රුපියල් 22.33 ක් විය.

පොල් අස්වැන්න 2005 වර්ෂයේ සිට වැඩිවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරන අතර 2012 වසරේදී එය ගෙඩි මිලියන 18.10 ක උපරිම අගයක් දක්වා වර්ධනය විය. කෙසේ නමුත් 2013 වසරේදී කු.වැ.ස. මෙන්ම අනෙකුත් සියලුම පොල් වගාකරුවන් පොල් අස්වැන්නේ සැලකිය යුතු පහත බැස්මක් අත්විඳින ලදී. 2013 වාර්තාවූ කු.වැ.ස. පොල් අස්වැන්න ගෙඩි මිලියන 13 කි.

මෙය 2011 වසර සහ ඊට පෙර සිට ඇතිවූ නියගයේ ප්‍රතිඵලයකි. ශ්‍රී ලංකාවේ කාලගුණික රටාවන් වෙනස් වී ඇති අතර වර්ෂාපතනයේ පැතිරීම අඩුවී ඇත. ඒ හේතුවෙන් වැසි දින ගණන සංසන්දනාත්මකව අඩුවී ඇති අතර අඩුකාල සීමාවක් තුළ දැඩි වර්ෂාපතනයක් ලැබීම නිසාවෙන් ජලය විශාල ලෙස අපතේ යාමක් සහ පොළොවට උරාගන්නා ප්‍රමාණයෙහි විශාල අඩුවක් සිදුවී ඇත.

කු.වැ.ස. ඵලදායිත්වය ඉහළ නැංවීම සඳහා සොරකම් අවම කිරීම සඳහාත් සාමාන්‍ය ක්‍රමය වන දෙමසකට වරක් පොල් කැඩීම වෙනුවට හැකි සෑම වපසරියකම මාසිකව අස්වනු නෙළීමට කටයුතු කරයි. මෙම ක්‍රමය තුළ වැටුණු පොල් ප්‍රතිශතය අඩුවන අතර එහි සොරකම් කිරීමට ඇති අවස්තාවන් අඩුවේ. මීට අමතරව, මෙම ක්‍රමය තුළ පැසුණු පොල් වල්ල ඉක්මනින් ඉවත්වීම හේතුවෙන් එම පොල්වල්ල නඩත්තුවට වැයවන ජලය සහ පෝෂණ කොටස් ගසේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ඉතිරිවන අතර අමතර පොල් වල්ලක් වර්ෂයක් තුළදී නෙළාගැනීමටද හැකිවී තිබේ.

2004 දී මාසිකව අස්වනු නෙළන ලද අක්කර ප්‍රමාණය 26% ක්වූ අතර එය මේ වන විට එය 88% ක් දක්වා ඉහල නංවා ඇත. පසුගිය වසර 03 තුළ වැටුණු ගෙඩි ප්‍රමාණය 17% සිට 20% ක් දක්වා වූ මට්ටමක පවතින අතර ඒ අනුව මෙම උපාය මාර්ගයේ ඇති කාර්යක්ෂමතාවය මොනවට පැහැදිලිවේ.



## නිෂ්පාදන පිරිවැය

නාස්තිය අවම කිරීම, කම්කරුවන්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, මිනිස් ශ්‍රමය වෙනුවට වෙනත් විකල්ප ක්‍රම භාවිතය ආදිය මගින් නිෂ්පාදන පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීමට හැකිවිය. 2012 දී රුපියල් මිලියන 245 ක් වූ මුළු නිෂ්පාදන පිරිවැය 2013 දී රුපියල් මිලියන 213 ක් විය. මෙය 13% ක අඩුවීමකි. කෙසේ වෙතත් නිෂ්පාදනයේ පහත වැටීම නිසා ගෙඩියක නිෂ්පාදන වියදම ඉහල ගොස් ඇත. 2012 දී ගෙඩියක නිෂ්පාදන පිරිවැය රුපියල් 13.53 ක් වූ අතර එය 2013 දී රුපියල් 16.39 දක්වා වැඩිවිය.

## රබර් නිෂ්පාදනය

සමාගම සතුව මේරූ රබර් හෙක්ටයාර 192.62 ක් ඇති අතර එය දෙවන නිෂ්පාදන භෝගයයි. භූමියේ ඵලදායිතාවය නැංවීම සහ පරිසරය රැක ගැනීම වස් සමාගම රබර් වගාව ව්‍යාප්ත කරයි. ජාත්‍යන්තර වෙළෙඳපොළේ පැවැති අඩු මිල ගණන් හේතුවෙන් 2012 ට වඩා 2013 රබර් ආදායම අඩුවිය. 2013 දී මුළු ආදායම රුපියල් මිලියන 62.41 ක් වූ අතර 2012 දී එය රුපියල් මිලියන 77.96 ක් විය. එමෙන්ම 2012 වසරේ කිලෝ ග්‍රෑම් 1ක සාමාන්‍ය විකුණුම් මිල වූ රු. 371 වූ අතර 2013 වසරේදී එය රු. 330 ක් දක්වා 11% කින් පහත වැටිණි.

අයහපත් කාලගුණය හේතුවෙන් 2013 දී ජාතික රබර් නිෂ්පාදනය 14% කින් පහත වැටුණි. සමාගමේ රබර් අස්වැන්න කිලෝ ග්‍රෑම් 188.93 ක් වූ අතර එය 2012 හා සංසන්දනයේදී එය 10% ක අඩුවීමකි.

## අගය එකතු කල රබර් සැකසීම

උසස් තත්ත්වයේ RSS රබර් සීට් නිෂ්පාදනය සඳහා කු.වැ.ස. රබර් පර්යේෂණ ආයතනයෙන් නවතම තාක්ෂණය ලබා ගෙන අත්තනගල්ල වතුයායේ RSS රබර් සීට් නිෂ්පාදනය කිරීමේ නවතම කර්මාන්තශාලාවක් පිහිටුවා ඇත. පරිසර හිතකාමී ලෙස මෙම රබර් නිෂ්පාදනය කරගෙන යෑම සඳහා 2014 දී මෙයින් ඉවත යන ජලය පිරිපහදු කිරීමේ පිරිපහදුවක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

## වෙනත් භෝග

2005 වසරේ සිට කු.වැ.ස සාර්ථකව අතුරු භෝග විවිධාංගිකරනයේ යෙදී සිටී. 2005 දී පැවති වෙනත් භෝග ප්‍රමාණය හෙක්ටයාර 62.49 කට සීමා වූ අතර එය 2013 දී එය හෙක්ටයාර 486.33 ක් දක්වා හත්ගුණයකින් පමණ වර්ධනය කිරීමට සමාගමට හැකිවිය. වර්තමානයේදී සමාගම ගම්මිරිස්, කුරුඳු, රඹුටන්, දූරියන්, ඩ්‍රැගන් ෆෘට්, අඹ, කොකෝවා, කජු ආදී අතුරු භෝග වගාකර ඇත. දිවයිනේ විශාලතම දූරියන් වගාව කු.වැ.ස. සමාගම සතුය. එය ගස් 1040 කින් සමන්විත වන අතර මහයාය වතුයායේ පිහිටා තිබේ. කුරුණෑගල පිහිටි වියළි කලාපීය වතුයායන්හි කජු, කුරුඳු, ඩ්‍රැගන් ෆෘට්, අඹ සහ පේර වගාවන් සිදුකර ඇත. තෙත් කලාපයට අයත් ගම්පහ දිස්ත්‍රික්කයට තුළ පිහිටි වතුවල දූරියන් සහ රඹුටන් සාර්ථක වගාකර ඇත. සමාගමේ ආදායම් වැඩිකරමින් රඹුටන්, කජු, කොකෝවා සහ ගම්මිරිස් වගාවන් මේ වන විට පරිනත තත්වයට පත්වෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස 2012 වසරේදී රුපියල් මිලියන 9.66 ක් වූ වෙනත් භෝගවලින් ලද ආදායම, 2013 වසරේදී රුපියල් මිලියන 11.12 ක් දක්වා වර්ධනය වී ඇත.

වෙනත් බෝග ආදායම




## විසිතුරු පත්‍ර සහ පැළ ව්‍යාපෘතිය

කු.වැ.ස. අත්තනගල්ල පළාත් වතුයායේ නව ව්‍යාපෘතියක් ලෙස මෙරට හා අපනයන වෙළෙඳපොළ මූලික කරගත් විසිතුරු පත්‍ර හා පැළ නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙය අවට වාසීන්ට රැකියා අවස්ථා ඇතිකරන අතර ජාතික ආර්ථිකයට විදේශ විනිමය ද උපයා දෙයි. පළමු තොගය එළඹෙන මුදල් වර්ෂයේදී කොරියානු ජනරජයට අපනයනය කෙරෙයි.

# තිරසාරත්වය පිළිබඳ වාර්තාව



# තිරසාරත්වය පිළිබඳ විමසුම

වැවිලි සමාගමක් ලෙස අපි තිරසාරත්වය වශයෙන් අර්ථ දක්වන්නේ ආර්ථික, සමාජයීය සහ පාරිසරික වශයෙන් එකාබද්ධ වූ ක්‍රියා පිළිවෙලක් මගින් වර්ධනයක් අත්පත්කර ගැනීමයි. ආර්ථික තිරසාරත්වය බවට ප්‍රාථමිකව පරිවර්තනය වන්නේ සමාගමේ මූල්‍ය තිරසාරත්වයයි. ඒ මගින් ප්‍රජාව සඳහා අවස්ථාවන් මෙන්ම රජයට සහ සේවකයන්ට ආර්ථික ප්‍රතිලාභයන් ලැබීම සහතික කරනු ලබයි. කෘෂිකර්මය මත පදනම් වූ ක්‍රියාදාමයක් තුල අපගේ මූල්‍ය තිරසාරත්ව පාරිසරික තිරසාරත්වය සමග එක්ව බැදී පවතී. ඒ නිසාවෙන් අපගේ ව්‍යාපාරික ක්‍රියාවන්ට උපකාරීවන ස්වභාවික පරිසරය සහ පාරිසරික පද්ධති සංරක්ෂණය කිරීමට අපි බැඳී සිටිමු. මෙය අර්ථ දැක්වෙන්නේ තිරසාර භූමි සහ ජල පරිහරණය සහ ස්වභාවික සම්පත් ආරක්ෂා කරමින් තිරසාර කෘෂිකාර්මික පිළිවෙත් සිදුකිරීම යනුවෙනි.

මෙයට අමතරව සමාජයීය තිරසාරත්වය සහතික කරනු අපගේ වතු අශ්‍රිතව වෙසෙන ජන කණ්ඩායම් සමග ඔවුන් සේම  අපද අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවැත්වීම මගින් ඔවුන්ද අපගේ ව්‍යාපාරයන්හි අවශ්‍ය කොටසක් වන බව අපි විශ්වාස කරමු. යහපාලනය සහ සමාජයීය සුබසාධන අවශ්‍යතා සිදුකරමින් රාජ්‍ය  ආයතනයක් ලෙස සමස්ත පොදු ජනතාවට අපගේ ඇති වගකිවයුතු බව පිළිබඳව අපද දැනුවත්ව සිටිමු. විනිවිද භාවයෙන් යුත් ක්‍රියාපිළිවෙත් අනුගමනය කරමින් සහ නිතිපතා නිරීක්ෂණය කරමින් සහ වාර්තා කිරීමේ පිළිවෙත් මගින් දූෂණය වැරදි කල්ක්‍රියාවන් නැතිකර යහපාලනය ඇති කිරීම අපි සහතික කරමු. අපගේ හැසිරීම සහ ක්‍රියාවෙන් අපි අපගේ සේවකයන්ට උදාහරණයක් වෙමින් යහපාලනය සහතකි කරමු.

## අපගේ මානව සම්පත

අපගේ මිනිස් බලය අපගේ විශාලතම සම්පත බව අපිද ආඩම්බරයෙන් අනුමත කරමින් එමගින් සුදුසුකම් සහිත පළපුරුදු සහ විශ්වාසවන්ත වෘත්තිකයන් ලැබීමේ තරගකාරී වාසියක් ලබමු. වෘත්තීයමය විශේෂතාවයක් නොමැතිව වැවිලි කර්මාන්තය ලාභදායී ලෙස කළමනාකරණය කළ නොහැකි බව පැහැදිලිව ඔප්පුවේ. මෙය කළහැකි මිනිස් බලයක් පැවතීම කු. වැ. ස. සතු භාග්‍යයකි.

කු. වැ. ස. මේ මුළු සේවක සංඛ්‍යාව 1400 ක් වේ.

| ශ්‍රේණිය | ප්‍රධාන කාර්යාලය | වතු අංශය | එකතුව |
|---|---|---|---|
| විධායක නිලධාරීන් | 11 | 22 | 33 |
| ලිපිකරු සහ ඒ හා සමාන | 29 | 115 | 144 |
| සුළු සහ  ඒ හා සමාන | 21 | 32 | 53 |
| මුරකරුවන් සහ චෙක්රෝල් සේවකයන් | - | 1,170 | 1,170 |
| එකතුව | 61 | 1,339 | 1,400 |

## සේවක මණ්ඩල දිරිගැන්වීම

2013 දී කාර්ය සාධන මත පදනම් වූ දිරිගැන්වීම් සඳහා වෙන්කළ මුදල රුපියල් මිලියන 27.4 කි. සමාගම විසින් අනුගමනය කරනු ලබන අචල හා පැහැදිලි පාලන ව්‍යුහයක් සමග බද්ධ වූ දිරිගැන්වීම් ක්‍රමය වඩාත් හොඳ සේවයක් සඳහා සේවකයන් දිරිමත් කරනු ලබයි.

## පුහුණු කිරීම හා සංවර්ධනය

සමාගමේ වර්ධනය තහවුරු කරනු වස් සේවක මණ්ඩලය සතුව තිබිය යුතු හැකියාවන් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණු වීම් ලබාදිම උදෙසා අපි අඛණ්ඩව ආයෝජනය කරන්නෙමු. 2013 වසරේදී මෙම ආයෝජනය රුපියල් මිලියන 1.02 කි. සියලුම මට්ටම් වල සේවකයන් ඉලක්ක කරමින් පුහුණු කිරීමේ වැඩසටහන් 20 ක් වර්ෂය තුළදී සිදුකර ඇත. විදේශ පුහුණුව  සඳහා සේවකයන් 05 දෙනෙක් සහභාගී කරවූහ.

## සේවක සුබසාධන පහසුකම්

අපි සේවකයන්ට නොයෙකුත් ප්‍රතිලාභ සපයමු. වර්ෂයතුළදී රුපියල් මිලියන 50 ටත් වඩා ආයෝජනය කරමින් කාර්යය මණ්ඩල නිලනිවාස සහ මුරකරුවන්ගේ නිවාස ලබාදී සේවකයන්ට වඩා හොඳ නිවාස පහසුකම් ලබා දුන්නෙමු. ජලය, විදුලිය සහ සනිපාරක්ෂක පහසුකම් ආදිය කාර්ය මණ්ඩලය සහ මුරකරුවන්ට ලබාදීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් උසස් කළෙමු.

## කාර්යාල ප්‍රධානී නිකේතන



පෙර



පසු

## රැකවල් කුටි







අපගේ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ අතර උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව සහ අඩු පොලී අනුපාතයක් යටතේ ආපදා ණය ලබාදීම්ද, කාර්යය මණ්ඩල සාමාජිකයන්ට උසස් අධ්‍යාපනය සඳහා මුල්‍ය සහයෝගය ලබාදීම, පාසැල් පොත් සහ රෙදිපිළි සඳහා පොලී රහිත ණය ලබාදීම, මුරකරුවන් වැටුණු පොල් එකතුකිරීම සහ මාසික වැඩට පැමිණීම වෙනුවෙන් දිරි දීමනා, විධායක නිලධාරින් සඳහා රුපියල් මිලියනයක හදිසි අනතුරු රක්ෂණයක්ද, විධායක නිලධාරින් හා ඔවුන්ගේ පවුල් සඳහා රු. 400,000 ක සෞඛ්‍ය රක්ෂණාවරණයක්ද ලබාදි ඇත. අපගේ පාරිතෝෂික මුදල් ගෙවීමේ සූත්‍රයද 2014 පෙබරවාරි 01 දින සිට වෙනස් කළෙමු. ඒ අනුව අවුරුදු 5 ට වැඩි නමුත් අවුරුදු 10 කට වඩා අඩු සේවා කාලයක් සහිත වූවනට සම්පූර්ණ කරන ලද් එක් අවුරුද්දකට මාස 1/2 ක් වැටුප් බැගින ද අවුරුදු 10 ට වඩා වැඩි සේවා කාලයක් ඇති සේවකයන්ට සම්පූර්ණ කළ එක් අවුරුද්දක් සඳහා මසක වැටුප බැගින් ද හිමිවෙයි. මෙම ප්‍රතිලාභයන් සහ දිරිගැන්වීම් ඵලදායීතාවය සහ සමාගම කෙරෙහි ඇති හිතවත් භාවය ද ඉහළ නැංවීමට හේතු වී ඇත. පාවිච්චි නොකල අසනීප නිවාඩු සඳහා මාසයක වැටුප ගෙවීම සේවයට පැමිණීම වර්ධනය කළ අතර කු. වැ. ස. සමාගම 98% ක සේවක රඳවා ගැනිමක් වාර්තා කරයි.

## දිරිදීමනා උළෙල









# තිරසාරත්වය පිළිබඳ විමසුම

## තිරසාර කෘෂිකාර්මික ක්‍රමවේදයන්

වතුයායන් 08 හිම අපි තිරසාර කෘෂිකාර්මික කළමනාකරණ ක්‍රමයන් ක්‍රියාවට නැංවූයෙමු. මෙය භූමියේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, අලුත් වගාවන් වෙත යොමුවීම, අතුරු වගාවන් සහ යටි වගාවන් තුලින් මෙය තහවුරුකර ඇත. කු. වැ. ස. පොල් වගා වපසරියෙන් 20% ප්‍රමාණයක් උසස් ගනයේ පොල් පැල යොදාගනිමින් යටි වගා කර ඇත. සීසෑම, කාබනික හා අකාබනික පොහොර යෙදිම, ආවරණ වගාවන් ස්ථාපනය, සමෝච්ඡ කානු  කැපීම, ආදී කෘෂිකාර්මික භාවිතයන් ක්‍රියාවට නංවා ඇත. වසර තුළදී රුපියල් මිලියන 93 ක් නොමේරූ වගාවන් සඳහා ආයෝජනය කෙරිණ. මෙම මුදලින් 78% ක් පොල් වගාවන් සඳහාද,  15% ක් රබර් සඳහාද 7% ඉතිරි වගාවන් සඳහාද වෙයි.

කු. වැ. ස. සමාගම කාබනික පොහොර කිලෝ ග්‍රෑම් 875 ක් යොදා ඇති අතර එය 2012 වසරේ යෙදීම් වලට වඩා 24% කින් ඉහළ දැම්මේය. යටි වගාවන් සඳහා අවශ්‍ය පෝෂක ප්‍රමාණයෙන් 50 % ක් කාබනික පොහොර මඟින් ලබා දී ඇත. පෝෂක සැපයීමට අමතරව කාබනික පොහොර පසෙහි ව්‍යුහය වැඩිදියුණු කිරීමට උදවුකරන අතර ජලය රඳවා ගැනීමේ හැකියාවද වැඩි කරයි. තවදුරටත් එය පසේ අයන රඳවා ගැනීමේ හැකියාව ද වැඩි දියුණු කරයි.

පොල් මයිටාගේ (ඇසෙරියා ගුරරෝමිස්) හානිය ජෛව විද්‍යාත්මක ව පාලනය කිරීමට විලෝපික මයිටා වතු (නියෝසිලස් බරාකි) නිෂ්පාදන කිරීම සඳහා විද්‍යාගාරයක් ස්ථාපිත කළෙමු. මෙය පරිසර හිතෛෂී ක්‍රම වේදයකි.

## යහපත් කෘෂි ක්‍රමවේදයන්



ආවරණ වගාවන් ස්ථාපනය කිරීම


සී සෑම


වසුන් යෙදීම


කාබනික පොහොර යෙදීම


අකාබනික පොහොර යෙදීම


සමෝච්ඡ කාණු කැපීම

## පොහොරවල සඵලතාවය වැඩිදියුණුව සඳහා ක්ෂුද්‍ර ජීවීන් භාවිතය

කු. වැ. ස. සමාගම 2012 වසරේදී හන්තානේ පිහිටි මූලධර්ම අධ්‍යන ආයතනය සමඟ පොහොරවල සඵලතාවය ඉතා කුඩා ක්ෂුද්‍ර ජීවීන් (මයික්‍රෝබේස්) මගින් වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රනයක් ගොඩනැගීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේය. මෙහි අභිප්‍රාය වූයේ පොල් සඳහා රසායනික පොහොර භාවිතය 50% කින්  පමණ අඩු කිරීමයි. මෙමගින් පොහොර සඳහා යන වියදම  අඩුවීම, පරිසර හිතකාමී ලෙස පොහොර යෙදීම, රටට විදේශ විනිමය ඉතිරිය වැනි දිගුදුර විහිදෙන ප්‍රතිලාභ අත්කර ගැනීමට බලාපොරොත්තු වේ. ව්‍යාපෘතියේ මූලික ප්‍රතිඵල ධෛර්යය ඇතිකරවන සුළු වන අතර මෙය නිර්දේශ ක්‍රියාවලීයේ ප්‍රාථමික අවධියෙහි පවති.

## සමාජයීය වගකීම

කු. වැ. ස. සමාගම වසර තුළදී ඔවුන්ට ඇති පුළුල් සමාජයීය වගකීම නොයෙකුත් මාර්ගයන් මගින් ඉටු කළේය.

ජාතික පොල් සංවර්ධන වැඩපිළිවෙල යටතේ කු. වැ. ස. උසස් තත්ත්වයේ බීජ පොල් මිලියන 1.7 ක් නිකුත් කළේය.

අසල්වාසී ගොවියන්ගේ හරකුන්ට තණ කැවීම සඳහා කු. වැ. ස. වතුවලට ඇතුළුවීමට අවසර දුනි. මේ මගින් වතුවලට කාබනික පොහොර (ගොම) ලැබෙන අතර වල් පැළෑටි මර්දනයද සිදුවෙයි. මෙය දෙපාර්ශයටම වාසිදායක තත්වයක් නිර්මාණය කර ඇත. මේ සතුන්ගෙන් දොවාගන්නා කිරි ජාතික කිරි නිෂ්පාදනට එකතු වෙයි.

මෙයට අමතරව සමාගම මහනුවර දළදා පෙරහැර, ප්‍රාදේශීය විහාරයන්හි පෙරහැර වලට අවශ්‍ය කොප්පරා සපයයි. ආගමික සිද්ධස්ථාන සහ පාසැල් සඳහා අවශ්‍ය දැව සැපයීම කෙරෙහි ද සමාගම  යහපත් ප්‍රතිචාරයක් දක්වයි.


වාර්ෂික පිරිත් පිංකම


සේවක වාර්ෂික විනෝද චාරිකාව


අන්තර් වතු ක්‍රිකට් තරගාවලිය


වාර්ෂික සේවක සුහද හමුව

# අවදානම් කළමනාකරණය

කුරුණෑගල වැවිලි සමාගම සිය මෙහෙයුම් සිදුකෙරෙන සමාජ - දේශලපාලනික පරිසරය තුළ පොල්, රබර් සහ වෙනත් නිෂ්පාදන වගා කිරීම, සැකසීම සහ අලෙවිය සම්බන්ධ අවදානම් කිහිපයකට මුහුණපානු ලබයි. මෙම අවධානම් කළමනාකරණය සඳහා මූල්‍ය, මෙහෙයුම් සහ වෙනත් පාලනයන් ක්‍රියාකාරීව යොදා ගැනිනි.

## මෙහෙයුම් අවදානම

අපගේ ප්‍රධාන භෝගය වන පොල් සමාගමෙහි ප්‍රමුඛ ආදායම් මාර්ගය වේ. ජාතික නිෂ්පාදතයෙන් 70%කට අධික ප්‍රමාණයක් දේශීය වශයෙන් පරිභෝජනය කෙරෙන අතර කර්මාන්ත අංශය සඳහා ඉතිරි වනුයේ 30%ක ප්‍රමාණයක් පමණි. මෙම තත්වය මගින් වෙළඳපළ උච්චාවචනයන් නිර්මාණය කෙරෙන අතර ඉහළ ඵලදා තත්වයන් හැමවිටම පහළ වාර්ෂික පිරිවැටුම් කෙරෙහි හේතු වේ. උසස් තත්වයේ පොල් නිෂ්පාදනය සහ ප්‍රතික්ෂේප වීම් අවම කිරීම මගින් කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන මණ්ඩලය මගින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී ගැනුම්කරුවන්ගේ ගෞරවයට පාත්‍ර වේ. වෙළඳපළ තුළ ඉහළ තරඟකාරීත්වයක් ඇති කිරීම උදෙසා සමාගම මගින් දේශීය ගැණුම්කාර පදනමක් ගොඩනගා ඇති අතර එමගින් අස්වැන්න අධික සමයන්හිදී අදාළ තොග අලෙවිය පහසු වී ඇත. එකතුකිරීමේ ස්ථාන වෙත පහසු පිවිසුමක් ලබාදීම, පොල් ලෙලි ගසන්නන් වෙත නේවාසික පහසුකම් ලබාදීම සහ වතු තුල අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් සැපයීම මඟින් සමාගම එහි ගැණුම්කරුවන්ට හිතකාමී පරිසරයක් ඇති කිරීමට කටයුතු කර ඇත.

මේ වන විට නිරන්තරයෙන් උද්ගත වන තත්වයක්  බවට පත්ව ඇති අහිතකර කාලගුණ තත්වයන් පොල්ද ඇතුළුව සියළු භෝග කෙරෙහි අයහපත් අයුරින් බලපා ඇත. දිගු නියගයන් සහ අධික වර්ෂාපතනයද නියමානාරයෙන් අස්වැන්න නෙළාගැනීමේ ක්‍රියාවලීන් කෙරෙහි බලපා ඇත. පසෙහි තෙතමනය පවත්වා ගනිමින් පස සංරක්ෂණය සඳහා අප විසින් පොල් ලෙලි වල දැමීම, අගල් කැපීම හා කාබනික පොහොර භාවිතය වැනි කටයුතු ක්‍රියාත්මක කෙරේ. සියළු මේරූ රබර් වගාවන්ට වැසි ආවරන යෙදීමට කටයුතු කර ඇත.

## කෘමි, පලිබොධ සහ රෝග

පොල් මයිටාවන් (Aceria guerreronis), කොළකන දලඹුවන් (Plessispa) සහ වැලිගම කොළ මැලවීමේ රෝගය (Weligama Wilt) මේ වන විට පැවති කෘමි, පලිබොධ සහ රෝග කාණ්ඩ සමග එක්ව මනා පොල් වගාවන් ඇති කිරීම කෙරේහි තර්ජන එල්ල කරයි. ‘වැලිගම කොළ මැලවීමේ රෝගය’ පොල් සඳහා විනාශකාරී රෝගයක් බවට පත්ව ඇති අතර එහිදී අදාළ වගාවන් ගලවා ඉවත්කිරීම හැර වෙනත් විකල්පයක් නොමැත. කෙසේවුවද පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය මෙම රෝගය පැතිරිම අවම කිරීමෙහිලා ප්‍රංශසනීය කාර්යභාරයක් ඉටු කරයි.

සමාගම අවම අවදානම් තත්වයටකට මුහුණපැවද අප විසින් අදාළ රෝග හඳුනාගැනීම සඳහා අප සේවකයින් සතු දැනුම වර්ධනය සඳහා කටයුතු කර ඇත. විලෝපික මයිටාවකු යොදාගනිමින් මයිටා උවදුර සාර්ථකව පාලනය කරනු ලැබ ඇත. අපගේ විද්‍යාගාරයේදී පොල් පර්යේෂණ ආයතනයෙහි මගපෙන්වීම යටතේ මෙම විලෝපික මයිටාවන් ඇති කෙරේ. එම විලෝපිත මයිටාන් වෙනත් පොල් වගාකරුවන් වෙතද සාධාරණ මිළකට ලබාදීමට කටයුතු කෙරේ. පළපුරුදු ක්ෂේත්‍ර කාර්ය මණ්ලයේ අධීක්ෂණය තුල අපගේ වගාවන් රෝග වලින් ආරක්ෂා කරගැනීමේ අවස්ථාව උදා වී ඇත.

## භෝග ආරක්ෂාව

ගිනි සහ ජල ගැලීම් වැනි ස්වභාවික ආපදාවන් ගේ අවධානමට අමතරව පොල් අතිශය බහුල වශයෙන් පරිභෝජනයට ගැනෙන භෝගයක් වශයෙන් නිරන්තරයෙන් සොරකම් කිරීමේ අවදානම් වලට ලක් වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ කිහිපයක් පුරා පැතිරුන කුඩා වතු කොටස් සමුහයකින් සමන්විත විම නිසාම මේවා පලාත් වතු ලෙස හඳුන්වනු ලබයි. මාසිකව පොල් නෙලන වපසරිය උපරිම කිරීමට මේවන විට කටයුතු කර ඇති අතර එය සමස්ථ පොල් නෙලන වපසරියෙන් 88% ක් පමණ වේ. ද්වීමාසිකව අස්වැන්න නෙලිමට සාපේක්ෂව පොල් වැටිමේ ප්‍රතිශතය අඩුවීම තුල සොරකම් කිරීමේ අවධානම අඩුවී ඇත. වැටවල් ශක්තිමත් කිරීම, වතු අධිකාරිවරුන් විසින් ක්ෂේත්‍ර නිලධාරීන් හා විගණක වරුන් විසින් කරනු ලබන අධීක්ෂණය තුල මෙම තත්ත්වය අවම කිරීම සඳහා කටයුතු කර ඇත. වැටුණු පොල් ඇහිලීම වෙනුවෙන් සේවකයින් වෙත දිරිදීමනා ලබා දීමද තවත් එක් උපාය මාර්ගයකි.

## ශ්‍රම හිඟය

පොල් වැවිලි කරුවන් පුහුණු ශ්‍රමය සම්බන්ධ බරපතල හිඟ යකට මුහුණ පා ඇත. නුපුහුණු ශ්‍රමය හිඟ වීම නිසා එදිනෙදා කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම ද අසීරු වේ. තේ සහ රබර් මෙන් නොව පොල් සඳහා නේවාසික ශ්‍රමික පිරිසක් නොමැති බැවින් අසල ගම්වල ශ්‍රමය මත රඳා පැවතීමට සිදු වේ. අප විසින් නිසි පරිදි අපගේ ශ්‍රම බලකාය තුලින් උපරිම නිමැයුමක් ලබාගැනිම සහ යාන්ත්‍රීකරණය තුල උපරිම ප්‍රතිපල නෙලා ගැනීමට කටයුතු යොදා ඇත.

විදුලිය, ජලය සහ නේවාසික පහසුකම් නොමිලේ ලබා දෙමින් ද ගෙවීම් සහ දිරි දීමනා ඉහළ නැංවීමෙන් ද සහන පොලී යටතේ ණය ලබා දෙමින් ද සේවකයින්ගේ අවශ්‍යතා ඉටු කර දීමෙන් ද මිත්‍රශීලී සහ විනය ගරුක සේවක පිරිසක් බිහි කර ගැනීමට සමාගමට කටයුතු කරයි.

## ඉඩම් අත්පත් කර ගැනීමේ අවධානම

සමාගම ජාතික අවශ්‍යතාවයන්, මහජන අරමුණු සහ ව්‍යාස්ථාපිත නිශ්චයන් මත එලදායී ඉඩම් අත්පත් කර ගැනීමේ අවදාමට නිරාවරණය වේ. 1992 දී සමාගම බිහිකිරීමේදී මූලිකව අත්පත් කර ගත් ඉඩම් වලින් සමාගමට 20% ක ප්‍රමාණයක් මේ වන විට අහිමි වී ඇත. පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ මැදිහත්වීම මත මේ වන විට අදාල අවදානම අවම වී ඇත.

## වෘත්තීය සමිති සමාජ සහ පරිසර වෙනස්වීම්

කුරුණෑගල වැවිලි සමාගම කාර්මික සංහිඳියාවෙහි වැදගත්කම අවබෝධ කර ගනිමින් සේවක සංගම් සහ ලංකා සේවක සංගමය සමඟ සාමූහික ගිවිසුමකට එළඹුනි. වැටුප්, ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවක වන්දි නිසි කලට ගෙවීම සහ සේවක ගැටළු වලට ප්‍රමුඛතාවය ලබාදීම වැනි කරුණු කෙරෙහි සමාගමේ අවදානය යොමු කිරීම තුලින් කාර්මික සංහිඳියාව ශක්තිමත් කිරීමට කටයුතු කර ඇත.

# සාමූහික පාලන ප්‍රකාශය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකකම, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියාකරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරේහි උනන්දුවක් දක්වන පිරිස් සමඟ ප්‍රබල සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. ව්‍යවස්තාපිත අශ්‍යතාවයන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනා කම් වර්ධනයවන අයුරින් සකස්කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන්, ක්‍රියා පිළිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා වගකිවයුතු වන්නා සේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැදි සිටින්නේය.

### වගකීම

මූල්‍ය ප්‍රතිපත්තින් හා උපායශීලි අරමුණු සකස් කිරීමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැදි සිටි. සමාගමේ මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි සාර්ථකත්වය සඳහාද අවසාන වගකීම දරන්නා වන්නේ එහි අධ්‍යක්‍ෂ මණ්ඩලයයි.

### සංයුතිය

සභාපතිතුමාගෙන් සමන්විත යුත් අධ්‍යක්‍ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂකවරුන් සත් දෙනෙකුගෙන් යුක්ත වේ.

### අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්

අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අය වැය, සියළු කාර්යන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා ප්‍රවර්තන වියදම් විමසිමට ලක් කිරීම මෙම රැස්වීම් වලදී සිදුකරනු ලබයි.

සෑම රැස්වීමක් පවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හට ලබාදීමට කටයුතු කරනු ලැබේ. නව අධ්‍යක්‍ෂක මණ්ඩලය 2013 සැප්තැම්බර් 24 දින පත්කරන ලදී. මෙයට පෙර සිටි අධ්‍යක්ෂක මණ්ඩලය 2013 වසරේදී අට වතාවක්ද, නව මණ්ඩලය තුන් වතාවක්ද රැස්වී ඇත.

අධ්‍යක්‍ෂක මණ්ඩල සාමාජිකයින්ගේ සහාභාගිත්වය පහත පරිදි වේ.

### පෙර අධ්‍යක්ෂක මණ්ඩලය (2013.09.24 දක්වා)

| | |
|---|---|
| පණ්ඩුක ජයසිංහ මහතා<br>සභාපති/ කළමණාකාර අධ්‍යක්‍ෂ | 8/8 |
| එම්.ඒ.එස්.එන්. කුරේරා මහතා<br>විධායක අධ්‍යක්‍ෂ | 6/8 |
| ආර්.ඩබ්.එන්.ජේ.ආර්. පෙරේරා මහතා<br>ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ | 8/8 |
| ඩබ්.ජී. චන්ද්‍රිකා මහත්මිය<br>භාණ්ඩාගාර නියෝජිත (2013.02.11 දින ඉල්ලා අස්විය.) | 2/8 |
| කේ.ඩී. පීරිස් මහතා | 8/8 |
| බී.ආර්. කුලරත්න මහතා | 8/8 |
| අයි.ඒ.එම්. අප්පුහාමි මහතා | 8/8 |

### වර්තමාන අධ්‍යක්‍ෂ මණ්ඩලය (2013.09.24 සිට)

| | |
|---|---|
| ආචාර්ය සුනිල් ජයසේකර මහතා<br>සභාපති | 3/3 |
| පී.ජී. අමරකෝන් මහතා<br>විධායක අධ්‍යක්‍ෂ | 3/3 |
| ආර්. ඩබ්. එම්. ජේ. ආර්. පෙරේරා මහතා<br>ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ | 3/3 |
| ඒ.පී. කුරුම්බලපිටිය මහතා<br>භාණ්ඩාගාර නියෝජිත | 2/3 |
| මහාචාර්ය ගාමිණී ද අල්විස් මහතා | 2/3 |
| ජේ. වී. ඒ. ඩබ්. ඩී. ගමආරච්චි මහතා | 1/3 |
| ජේ. දේවපිරාන් මහතා | 3/3 |

### විගණන කමිටුව

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වෙයි. භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂකවරයා එම විගණන කමිටුවේ සභාපතිත්වය දරයි. මෙම රැස්වීම් නිසියාකාරව පැවැත් වෙන අතරම ගරු සභාපති, විධායක අධ්‍යක්ෂක, ක්‍රියාකාරී අධ්‍යක්ෂක, ප්‍රධාන විධායක නිලධාරි, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ පලාත් වතු අධිකාරිවරුන් ආරාධිතව මෙම රැස්වීම්වලට සහභාගි වේ. මෙම රැස්වීම් සම්බන්ධීකරණය විගණන කළමනාකරු විසින් සිදු කරයි. 2013

වසරේදී අධ්‍යක්ෂක මණ්ඩල වෙනස්වීම් නිසා විගණන කමිටු දෙකක් ක්‍රියාත්මක විය. එම කමිටු සඳහා සහභාගිත්වය පහත සඳහන්ය.

පෙර විගණන කමිටුව (2013.09.24 දක්වා)

ඩබ්ලිව්. ජී. චන්ද්‍රිකා මහත්මිය
භාණ්ඩාගාර නියෝජිත (2013.02.11 දින ඉල්ලා අස්විය)

බී.ආර්. කුලරත්න මහතා

අයි.ඒ.එම්. අප්පුහාමි මහතා

වර්තමාන විගණන කමිටුව (2013.09.24 සිට)

| | |
|---|---|
| ඒ.පී. කුරුම්බලපිටිය<br>භාණ්ඩාගාර නියෝජිත | 1/1 |
| ජී.වී.ඒ.ඩබ්.ඩී. ගමආරච්චි | 1/1 |
| ජේ. දේවපිරාන් | 1/1 |

## නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම අවස්ථාවන්හිදී සාංගමික සංස්ථාපත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත්වන අනෙකුත් නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට උත්සාහ ගනු ලබයි.

එමෙන්ම සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවන පරිදි පිළියෙල කරන බවටත් 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවන බවටත් අධ්‍යක්ෂක මණ්ඩලය තහවුරු වේ.

# මූල්‍යමය වාර්තා



# අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

කු. වැ. ස. සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් එහි අධ්‍යක්ෂවරුන් ලෙස ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

### පොදු හැඳින්වීම

සී/ස කරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස පිහිටුවා ඇත. එය 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරණ අතර නව ලියාපදිංචි අංක PB 1319 වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල, දඹුල්ල පාරේ, අංක 80 දරණ ස්ථානයේ පිහිටා ඇත.

කු. වැ. ස. එක් කොටස්කරුවකු ගෙන් යුත් සමාගමක් වන අතර ශ්‍රී ලංකා ජනරජයේ භාණ්ඩාගාර ලේකම් එකම කොටස්කරු වේ.

### සමාගමේ ප්‍රධාන කටයුතු සහ ව්‍යවපාරයේ ස්වභාවය

අදාළ වර්ෂයේදී සමාගමේ ප්‍රධාන කටයුතු ලෙස පොල්, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන වගාකිරීම, නිෂ්පාදනය සහ විකිණීම සිදුකරණ ලදී. කු. වැ. ස. වතුයාය 08 කින් සමන්විතව වන අතර ඒවා කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ව්‍යාප්තව පවතියි. එම වතුයායන් නම්,

| | |
|---|---|
| අත්තනගල්ල | කටුගම්පල |
| දඹදෙණිය | කුරුණෑගල |
| දොඩම්ගස්ලන්ද | නාරම්මල |
| හිරියාල | මහයාය |

### අඛණ්ඩ පැවැත්ම

දුර දක්නා අනාගත කාලයක් සමාගමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි සමාගම සතුව ඇති බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය සෑහිමට පත් වේ. ඒ අනුව ගිණුම් වාර්තා අඛන්ඩ පැවැත්ම සංකල්පය යටතේ පිළියෙල කර ඇත.

### මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාව

මෙහි පිටු අංක 50 හි 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර අත්සන් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් සහ විගණන වාර්තාව ඇතුලත් කර ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

පිටු අංක 56 හි මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේ අනුගමනය කරන ලද ප්‍රතිපත්ති දක්වා ඇත. මෙයට පෙර වර්ෂයේදී අනුගමනය කරන ලද ප්‍රතිපත්ති එලෙසම මෙම වර්ෂයේදීද අනුගමනය කර ඇත.

### ආදායම

2013 වර්ෂයේ ආදායම රුපියල් මිලියන 475.89 කි. (2012 දී රුපියල් මිලියන 491.82 කි. අනෙකුත් මෙහෙයුම් ආදායම් රුපියල් මිලියන 95.83 කි. (2012 දී රුපියල් මිලියන 89.35 කි.) අදාල වර්ෂයේ පොලී ආදායම රුපියල් මිලියන 44.34 කි. (2012 දී රුපියල් මිලියන 38.20 කි.)

### ප්‍රතිපල සහ විසර්ජනයන්

සමාගමේ බදු පසු ලාභය 2013 වසරේදී රුපියල් මිලියන 208.15 කි. (2012 දී රුපියල් මිලියන 177.27 කි) සමාගමේ මූල්‍ය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙන් විද්‍යාමාන වේ.

ලාභ සහ විසර්ජනයන්ගේ විස්තරාත්මක පැහැදිලි කිරීමක් පහත දැක්වේ.

| | **2013** | 2012 |
|---|---|---|
| පොල්වලින් ලද ලාභය | **189,350,000** | 159,243,556 |
| රබර්වලින් ලද ලාභය | **13,988,267** | 33,318,065 |
| වෙනත් භෝගවලින් ලද ලාභය | **3,755,090** | 1,974,744 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | **95,827,085** | 89,353,353 |
| | **302,920,442** | 283,889,718 |
| පරිපාලන වියදම් | **(109,250,679)** | (107,147,020) |
| මෙහෙයුම් ක්‍රියාවලියන්ගේ ලාභය | **193,669,763** | 176,742,698 |
| ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම | | |
| පොලී ආදායම | **44,336,994** | 38,200,820 |
| පොලී වියදම | **(24,377,772)** | (21,892,306) |
| | **19,959,222** | 16,308,514 |
| ආදායම් බදු වියදම්වලට පෙර ලාභය | **213,628,985** | 193,051,212 |
| ආදායම් බදු වියදම | **(5,483,047)** | (15,784,867) |
| වර්ෂය සඳහා ලාභය | **208,145,938** | 177,266,345 |

### ප්‍රාග්ධන වියදම් හා ආයෝජන

2013 වසරේදී රුපියල් මිලියන 186.70 (2012 දී රුපියල් මිලියන 164.81) ක් ස්ථාවර වත්කම් වල ආයෝජනය කරන ලද අතර මෙයින් රුපියල් මිලියන 93.66 ක් (2012 දී රුපියල් මිලියන 73.4 කි.) නොමේරූ වගාවන් සඳහා යොදවන ලදී.

### කෙටිකාලීන ආයෝජන

2013 දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 326 ක කෙටිකාලීන ආයෝජන (2012 දෙසැම්බර් 31 දිනට රුපියල් 320 ක්) පැවතිණි. මේවා රාජ්‍ය බැංකුවල ස්ථිර තැන්පතු වශයෙන් පැවතිනි. (රුපියල් මිලියන 40 ක් ලංකා බැංකුවේද, රුපියල් මිලියන 168 ක් මහජන බැංකුවේද, රුපියල් මිලියන118 ක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙද වශයෙනි.)

### ස්කන්ධ ප්‍රාග්ධනය

කොටස් විකිණීමෙන් ලැබුණු සම්පූර්ණ මුදල් ස්කන්ධ ප්‍රාග්ධනය ලෙස දක්වා ඇත. 2013 දෙසැම්බර් 31 දිනට මුළු ස්කන්ධ ප්‍රාග්ධනය රුපියල් 200,000 010 කි. මෙය සාමාන්‍ය කොටස් 20,000,000 ක් සහ භාණ්ඩාගාර ලේකම් විසින් දරණ ස්වර්ණමය කොටස් 01 කින් සමන්විත වෙයි. අදාළ වර්ෂය තුළදී වෙනත් කොටස් නිකුත් කිරීමක් සිදු කර ඇත.

### සංචිත

2013 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ලාභය රුපියල් මිලියන 887.23 ක් වූ අතර දැව සංචිතය රුපියල් මිලියන 183.16 ක් සහ වෙනත් සංචිතය රුපියල් මිලියන 7.63 ක් විය.

### අධ්‍යක්ෂක මණ්ඩලය

2013 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනසක් සිදුවිය. වසරේදී තනතුරු දැරූ අධ්‍යක්ෂවරුන්ගේ නාමාවලිය පහත දැක්වේ.

2013.01.01 සිට 2013.09.23 දක්වා

| නම | පත්කළ දිනය |
|---|---|
| පණ්ඩුක ජයසිංහ මහතා | |
| සභාපති/ කළමණාකාර අධ්‍යක්‍ෂ | 2010 මැයි 17 |
| එම්.ඒ.එස්.එන්. කුරේරා මහතා | |
| විධායක අධ්‍යක්‍ෂ | 2010 මැයි 17 |
| ආර්.ඩබ්.එම්.ජේ.ආර්. පෙරේරා මහතා | |
| ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ | 2010 මැයි 17 |
| ඩබ්.ජී. චන්ද්‍රිකා මහත්මිය | |
| භාණ්ඩාගාර නියෝජිත | 2010 මැයි 17 |
| (2013.02.11 දින ඉල්ලා අස්විය.) | |
| කේ.ඩී. පිරිස් මහතා | 2010 මැයි 17 |
| බී.ආර්. කුලරත්න මහතා | 2010 මැයි 17 |
| අයි.ඒ.එම්. අප්පුහාමි මහතා | 2010 මැයි 17 |

2013.09.24 සිට 2013.12.31 දක්වා

| | |
|---|---|
| ආචාර්ය සුනිල් ජයසේකර මහතා | |
| සභාපති | 2013 සැප්තැම්බර් 24 |
| පී. ජී. අමරකෝන් මහතා | |
| විධායක අධ්‍යක්‍ෂ | 2013 සැප්තැම්බර් 24 |
| ආර්. ඩබ්. එම්. ජේ. ආර්. පෙරේරා මහතා | |
| ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ | 2013 සැප්තැම්බර් 24 |
| ඒ.පී. කුරුම්බලපිටිය මහතා | |
| භාණ්ඩාගාර නියෝජිත | 2013 අගෝස්තු 16 |
| මහාචාර්ය ගාමිණී ද අල්විස් මහතා | 2013 සැප්තැම්බර් 24 |
| ජී.වී.ඒ.ඩබ්.ඩී. ගමආරච්චි මහතා | 2013 සැප්තැම්බර් 24 |
| ජේ. දේවපිරාන් මහතා | 2013 සැප්තැම්බර් 24 |

### අධ්‍යක්ෂවරුන් සහ සමාගම අතර ඇති සම්බන්ධතාවය

සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය ඍජුව හෝ වක්‍රව සමාගමේ ගනුදෙනු කෙරෙහි කිසිදු ආකාරයකින් බලපෑමක් කර නොමැත.

### අධ්‍යක්ෂවරුන්ගේ කොටස්වල අයිතිය

සමාගමේ කිසිදු අධ්‍යක්ෂකවරයෙකු හෝ ඔවුන්ගේ කලත්‍රයකු සමාගමේ කොටස් සඳහා හිමිකම් නොකියයි.

### විගණන කමිටු

පහත දැක්වෙන අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් 2013 වසරේදී විගණන කමිටුව නියෝජනය කළහ.

2013.01.01 දින සිට 2013 පෙබරවාරි 11 දක්වා

ඩබ්.ජී. චන්ද්‍රිකා මහත්මිය
භාණ්ඩාගාර නියෝජිත
(2013.02.11 දින ඉල්ලා අස්විය.)
බී.ආර්. කුලරත්න මහතා
අයි.ඒ.එම්. අප්පුහාමි මහතා

2013.09.24 සිට 2013.12.31 දක්වා

ඒ.පී. කුරුම්බලපිටිය මහතා
භාණ්ඩාගාර නියෝජිත
ජී.වී.ඒ.ඩබ්.ඩී. ගමආරච්චි මහතා
ජේ. දේවපිරාන් මහතා

### සේවා නියුක්තිය

සේවකයන් තෝරා ගැනීමේදී සමාගම වෙනස්කම් කෙරෙහි අවධානය යොමු නොකොට සමානාත්මතා සංකල්පය මත ක්‍රියා කිරීමට සැමවිටම කටයුතු කරයි. පුහුණුව, සංවර්ධනය සහ උසස්වීම් ලබාදීම ආදියේදී සැමවිටම පදනම් වන්නේ කුසලතාවයයි. එමෙන්ම ජාතිය, ආගම, දේශපාලනික මතවාද,

# අධ්‍යක්ෂක මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ස්ත්‍රී පුරුෂභාවය, විවාහක අවිවාහක බව හෝ ශාරීරික දුබලතා පිළිබඳව වෙනස්කම් නොදක්වා සැමටම සමාන අවස්ථාවන් ලබාදීමට කටයුතු කරයි.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය උපරිම දැනුම අනුව සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත සියලු බදු සහ සමාගමේ සේවකයන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන කර ඇති බවට හෝ අධ්‍යක්ෂකවරුන් සහතික වේ.

### මූල්‍ය වාර්තා ඉදිරිපත්කරන දිනට පසු සිදුවීම්

මූල්‍ය වාර්තා ඉදිරිපත්කරන දිනයේ සිට මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන දින දක්වා ගිණුම් සටහන් අංක 29 හි අනාවරණය කර ඇති කරුණු හැර ගිණුම් ප්‍රකාශන කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති ඇතිකරන වෙනත් නිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

### විගණකවරු

2013 වසර සඳහා වූ ගිණුම් දයානන්ද සමරවික්‍රම සහ සමාගම (වරලත් ගණකාධිකාරිවරු) විසින් විගණනය කරන ලදී.

### වාර්ෂික වාර්තාව

2014 අප්‍රේල් 22 දින මූල්‍ය වාර්තා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### වාර්ෂික මහ සභා රැස්වීම

2014 ජූනි 26 දින පස්වරු 1.30 ට කොළඹ 01, ඩියුක් වීදියේ අංක 11, 3 වන මහල දරන ස්ථානයේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ඇත.

වාර්ෂික මහා සභා රැස්වීම කැඳවීමේ නිවේදනය මේ සමග අමුනා ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ



**ආචාර්ය සුනිල් ජයසේකර**
සභාපති



**ආර්. ඩබ්ලිව්. ඩී. බී. ආර්. පෙරේරා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂක



**සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම**
ලේකම්වරු - සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

2014 අප්‍රේල් 22 දින කොළඹදීය.

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනයන් සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත දැක්වෙන ප්‍රකාශනයෙහි දක්වා ඇත. 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතා අනුව මූල්‍යමය ප්‍රකාශනයන් සැකසීම සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් විගණකවරුන්ගේ වාර්තාවෙහි දක්වා ඇත.

## මූල්‍යමය ප්‍රකාශනයන් පහත දැක්වෙන කරුණු වලින් සමන්විත වේ:

- මූල්‍ය වර්ෂය සඳහා සමාගමෙහි ලාභ/ අලාභ තත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිඹිබු වන අයුරින් සකස් කල විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

- සමාගම් පනතෙහි අවශ්‍යතා වලට අනුකූලව මූල්‍ය වර්ෂය අවසානයේදී සමාගමෙහි මූල්‍ය තත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු වෙන අයුරින් සකස් කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය.

අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍යමය ප්‍රකාශන සැකසීමේදී පහත දැක්වෙන කරුණු තහවුරු කල යුතු වේ.

- සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඒවා අඛණ්ඩව හා සංගතභාවයෙන් යුතුව යොදාගැනීමටත් යම් ප්‍රමාණාත්මක බැහැරවීමක් සිදුවී ඇත්නම් ඒවා සවිස්තරාත්මක ලෙස අනාවරණය කිරීමට කටයුතු කර ඇති බව.

- අදාළ සියළුම ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇති බව.

- නිෂ්චයන් සහ ඇස්තමේන්තු සාධාරණ සහ විචක්ෂණශීලී ඒවා බව.

- සමාගමට සිය මෙහෙයුම් කටයුතු දුරදක්නා අනාගත කාල පරිච්ඡේදයක් තුල පවත්වා ගෙන යාමට අවශ්‍ය සම්පත් පවතින බවට අධ්‍යක්ෂක මණ්ඩල තහවුරු කරන අතර ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම සංකල්පය යොදාගැනීම සාධාරණ බව.

සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව ප්‍රමාණවත් තරම් ගිණුම් වාර්තා පවත්වා ගෙන යාමටත්, සමාගමේ මූල්‍ය තත්වය යහපත් මට්ටමක පවත්වාගෙන යාමටත්, මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිරිපත් කිරීමටත් අධ්‍යක්ෂක මණ්ඩලය බැඳී සිටි.

සමාගම සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා හා වෙනත් අක්‍රමිකතා හදුනාගෙන ඒවා වැලැක්වීම පිණිස සුදුසු අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම අධ්‍යක්ෂක වරුන්ගේ වගකීමකි.

සිය විගණන මතය ලබාදීම සඳහා විගණකවරුන් වෙත සියළු පරීක්ෂාවන් සඳහා අවසර ලබාදීමද අධ්‍යක්ෂකවරුන්ගේ වගකීමකි.

සමාගම් පනත අනුව අධ්‍යක්ෂකවරුන් විසින් සමාගමෙහි වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව අදාළ රැස්වීම පැවැත්වෙන දිනට අවම වශයෙන් වැඩ කරන දින 15 කට පෙරාතුව සියළුම කොටස් හිමිකරුවන් වෙත යැවිය යුතු වේ.

මෙම ප්‍රකාශනයෙහි දක්වා ඇති සියළු වගකීම් ඉටු කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂක මණ්ඩලයෙහි මතය වේ.

## අනුගතවීමේ වාර්තාව

අධ්‍යක්ෂකවරුන් විසින් ස්වකීය උපරිම දැනුම අනුව සමාගම මගින් ගෙවිය යුතු සියළු බදු, තීරු බදු සහ සමාගම විසින් එහි සේවකයන් වෙත ගෙවිය යුතු සියළු ව්‍යවස්තාපිත ගෙවීම් ගිණුම් වාර්තා ඉදිරිපත් කරන දින වන විට ගෙවනු ලැබ ඇති බව හෝ ගෙවීම සඳහා ගිණුම්තුල අවශ්‍ය වෙන්කිරීම් කර ඇතිබව හෝ තහවුරු කෙරේ.

අධ්‍යක්ෂකවරුන්ගේ අණ පරිදි



**කෝර්පරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්ගලික) සමාගම**
ලේකම්වරු - කුරුණෑගල වැවිලි සමාගම

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

**Dayananda Samarawickrema & Co.,**
CHARTERED ACCOUNTANTS

Partners
H.G. Dayananda F.C.A.
J. Rajasuriya F.C.A., BA
K.G. Chandana Kumara A.C.A

No. 20/26, Station Lane, (Janatha Pola Road)
NUGEGODA, SRI LANKA.
Tele : 2854614, 2809650, 2822940
Fax : 2820112
E-mail : dsandco@sltnet.lk

## කුරුණෑගල වැවිලි සමාගමෙහි කොටස් හිමිකරුවන් වෙත

### මූල්‍යමය ප්‍රකාශනයන් පිළිබඳ වාර්තාව

කුරුණෑගල වැවිලි සමාගමේ 2013 දෙසැම්බර් මස 31 වැනි දිනට පිළියෙල කරන ඇති මූල්‍ය ප්‍රකාශනයන් එනම්, එම දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, එම දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය වන විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ගිණුම්සටහන් අප විසින් විගණනය කරන ලදී.

### මූල්‍යමය ප්‍රකාශනයන් පිළිබඳ කළමනාකාරීත්වයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සමාගමේ අධ්‍යක්ෂ වරුන්ගේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන කළමනාකාකරනයේ නියෝජනයක් වේ. මෙම ප්‍රකාශය පිළියෙල කිරීමේදී වැදගත් ගිණුම්කරන ඇස්තමේන්තු සහ නිශ්චයන් කිරීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යෝග්‍ය ගිණුම්කරන ප්‍රතිපත්ති හා ක්‍රම තිරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමකී. මීට අමතරව වැරදි හා වංචා අවම වන ලෙස අභ්‍යන්තර පාලන ක්‍රමයන් ඇති කිරිමද ඒවා ක්‍රියාකාරි ලෙස පවත්වාගෙන යාමද කළමනාකාරීත්වයේ වගකීමකී.

### විගණනයේ විෂය පථය සහ මතයේ පදනම

විගණකවරුන් ලෙස අපගේ වගකීම වන්නේ අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන ගැන මතයක් ප්‍රකාශ කිරීමයි. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව අපි අපගේ විගණනය කරගෙන ගියෙමු. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන්ගෙන් තොරදැයි සාධාරණ තහවුරුවක් ලබා ගැනීමේ අරමුණින් අප විසින් විගණනය සැලසුම් කර ඉටු කිරීම මෙම ප්‍රමිතීන් මගින් අවධාරණය කෙරේ.

මූල්‍යමය ප්‍රකාශන වල අගයන් හා හෙළිදරව් කිරීම් තහවුරු කිරීමට නියැදි පදනමක් මත සාක්ෂි පරීක්ෂා කිරීම මූල්‍ය විගණනයට ඇතුළත් වේ. භාවිත කල ගිණුම්කරණ ප්‍රමිතීන් සහ කළමනාකරනය විසින් කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම් මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම ඇගයීමකට ලක් කිරීම විගණනයට ඇතුලත් වේ. අපගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබා ගතිමු. එමනිසා අපගේ විගණනය අපගේ මතය සඳහා සාධාරණ පදනමක් වන්නේ යැයි අපි විශ්වාස කරමු.

### මතය

අපගේ මතය වන්නේ අපගේ විගණනයෙන් පෙනියන අන්දමට 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සමාගම නිසි පරිදි ගිණුම් පොත්පත් පවත්වන ලද අතර මූල්‍ය ප්‍රකාශන මඟින් සමාගමේ ගණුදෙනු, ක්‍රියාකාරිත්වය හා තත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දර්ශණයක් පෙන්නුම් කරන බවත් 2013 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වන ලාභය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ගණනය කර ඇති බවත්ය.

### නෛතික සහ ව්‍යයස්ථාපිත අවශ්‍යතා පිළිබඳ ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශනයන් 2007 අංක 07 151 (2) දරණ සමාගම් පනතේ විධිවිධාන වලටද අනුකූලව සකස් කර ඇති බව අපගේ මතයයි.

**දයානන්ද සමරවික්‍රම සහ සමාගම**
වරලත් ගණකාධිකාරීවරු

නුගේගොඩ
2014 අප්‍රේල් 22

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | සටහන | 2013<br>රු. | 2012<br>ප්‍රතිෂ්ඨාපිත<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | 04 | **475,890,175** | 491,819,486 |
| විකුණුම් පිරිවැය | 05 | **(268,796,818)** | (297,283,121) |
| දළ ලාභය | | **207,093,357** | 194,536,365 |
| අනෙකුත් මෙහෙයුම් ආදයම් | 06 | **95,827,085** | 89,353,353 |
| පරිපාලන සහ පොදු වියදම් | 07 | **(109,250,679)** | (107,147,020) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ලාභය** | | **193,669,763** | 176,742,698 |
| ශුද්ධ මූල්‍ය ආදායම්/ (වියදම්) | 08 | **19,959,222** | 16,308,514 |
| **බදු පෙර ලාභය** | | **213,628,985** | 193,051,212 |
| ආදායම් බදු වියදම | 09 | **(5,483,047)** | (15,784,867) |
| **වර්ෂයේ ලාභය** | | **208,145,938** | 177,266,345 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| නිර්ණය කළ විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් ආයුගණක ලෙස ගණනය කිරීමෙන් ලැබූ වාසිය/(අවාසිය) | | **783,904** | 6,839,858 |
| **වර්ෂයේ මුළු විස්තීරණ ආදායම** | | **208,929,842** | 184,106,203 |
| කොටසක ඉපයුම | 10 | **10.41** | 8.86 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2013<br>රු. | 2012<br>ප්‍රතිෂ්ඨාපිත<br>රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම් | 11 | **99,727,614** | 102,897,569 |
| නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම් හැර) | 12 | **50,411,777** | 55,253,756 |
| ජෛව වත්කම් | 13A | **632,375,347** | 548,569,164 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් | 13B | **130,885,608** | 125,890,158 |
| දේපල, පිරියත හා උපකරණ | 14 | **225,018,509** | 154,398,849 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 15 | **4,848,097** | 4,938,188 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,143,266,952** | **991,947,684** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 16 | **41,909,937** | 37,317,228 |
| තැන්පතු සහ ඉදිරියට ගෙවීම් | | **4,529,765** | 5,778,757 |
| කෙටිකාලීන ව්‍යාපෘති මත කරන ලද ඉදිරියට ගෙවීම් | 17 | **10,263,971** | 2,488,128 |
| ආපසු ගෙවන ආදායම් බදු | | **7,571,822** | 1,467,715 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 18 | **68,063,660** | 82,359,530 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 15 | **5,099,968** | 4,004,367 |
| කෙටිකාලීන ආයෝජන | 19 | **326,000,000** | 320,000,000 |
| මුදල් හා මුදල් සමාන දෑ | 20 | **9,741,661** | 5,659,031 |
| **මුළු ජංගම වත්කම්** | | **473,180,784** | 459,074,756 |
| **මුළු වත්කම්** | | **1,616,447,736** | 1,451,022,440 |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ස්කන්ධ ප්‍රාග්ධනය | 21 | **200,000,010** | 200,000,010 |
| රඳවා ගත් ලාභ | | **889,230,196** | 755,412,408 |
| දැව සංචිතය | | **183,160,698** | 148,832,548 |
| අනෙකුත් සංචිත | | **7,623,762** | 6,839,858 |
| මුළු හිමිකම | | **1,280,014,666** | 1,111,084,824 |
| ජංගම නොවන වගකීම් | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික | 22 | **124,782,559** | 122,612,895 |
| ශුද්ධ කල්බදු වගකීම | 23 | **71,344,225** | 74,909,429 |
| විලම්භිත ආදායම් - ප්‍රධාන සහ ආධාර | 24 | **-** | - |
| විලම්භිත බදු වගකීම | 25 | **55,944,676** | 51,177,581 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **252,071,460** | 248,699,905 |
| ජංගම වගකීම් | | | |
| ශුද්ධ කල්බදු වගකීම | 23 | **3,565,204** | 3,565,204 |
| ලද අත්තිකාරම් | 26 | **1,675,873** | 204,627 |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 27 | **79,120,533** | 87,467,880 |
| **මුළු ජංගම වගකීම්** | | **84,361,610** | 91,237,711 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **1,616,447,736** | 1,451,022,440 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.
වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.
මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

**පී. එම්. ඩී. ජී. ප්‍රේමතිලක**
මූල්‍ය කළමනාකරු

මූල්‍ය ප්‍රකාශනයන් සැකසීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයෙහි වගකීම වේ.
සී/ස කුරුණෑගල වැවිලි සමාගම සහ එහි අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කලේ

**ආචාර්ය සුනිල් ජයසේකර**
සභාපති
කුරුණෑගල
2014 අප්‍රේල් 22

**ආර් ඩබ්. එම්. ජේ. ආර් පෙරේරා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | කොටස් ප්‍රාග්ධනය රු. | දැව සංචිතය රු. | රඳවාගත් ඉපැයුම් රු. | වෙනත් සංචිත රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| **2012.01.01 දිනට ශේෂය** | | | | | |
| **පෙර වර්ෂයේ වර්ථා කළ පරිදි** පෙර වර්ෂ ගැලපීම් | 200,000,010 | 111,428,668 | 644,668,414 | - | 956,097,092 |
| පාරිතෝෂික වෙන් කිරීම් ගැලපීම් | | | (46,178,108) | - | (46,178,108) |
| කල්බදු පොලී වියදම් ගැලපීම් | | | 67,059,637 | - | 67,059,637 |
| 2012.01.01 දිනට ප්‍රතිෂ්ඨාපිත ශේෂය | 200,000,010 | 111,428,668 | 665,549,943 | - | 976,978,621 |
| වර්ෂයේ ප්‍රතිෂ්ඨාපිත ලාභය - (සටහන අ) | | | 177,266,345 | - | 177,266,345 |
| දැව සංචිතයට මාරු කිරීම | | 37,403,880 | (37,403,880) | | - |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | - | - | 6,839,858 | 6,839,858 |
| ගෙවූ ලාභාංශ - 2012 | | | (50,000,000) | - | (50,000,000) |
| 2013.12.31 ට ශේෂය | **200,000,010** | **148,832,548** | **755,412,408** | **6,839,858** | **1,111,084,824** |
| වර්ෂයේ ලාභය | **-** | | **208,145,938** | **-** | **208,145,938** |
| දැව සංචිතයට මාරු කිරීම | | **34,328,150** | **(34,328,150)** | | |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | | | **783,904** | **783,904** |
| ගෙවූ ලාභාංශ - 2012 | | | **(40,000,000)** | **-** | **(40,000,000)** |
| 2013.12.31 ට ශේෂය | **200,000,010** | **183,160,698** | **889,230,196** | **7,623,762** | **1,280,014,666** |

**සටහන අ 2012 සඳහා ලාභ සැසඳුම**

| | Rs. |
|---|---|
| පෙර වර්ෂයේ වර්ථා කළ පරිදි 2012 වර්ෂය සඳහා ලාභය | 170,292,768 |
| පසුගිය වර්ෂට අදාල ගැලපුම් | |
| පාරිතෝෂික වෙන්කිරීම | (17,482,940) |
| මූල්‍ය පිරිවැය - කල්බදු පොලි වියදම | 9,995,027 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් වලට අදාල ගැලපීම් | |
| දැව ගස්වල විකුණුම් වටිනාකම | (22,942,390) |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් වල අගය වෙනස්වීම නිසා ඇති වූ ප්‍රතිලාභය | 37,403,880 |
| 2012 වසර සඳහා ප්‍රතිෂ්ඨාපිත ලාභය | 177,266,345 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.
වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

| | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වූ මුල්‍ය ප්‍රවාහ** | | |
| ආදායම් බදු පෙර ලාභය | **213,628,985** | 193,051,212 |
| ගැලපීම්, | | |
| ක්ෂය/ක්‍රමක්ෂය | **38,633,551** | 29,381,368 |
| කල්බදු ගිවිසුම මත පොලිය | **22,742,587** | 20,852,763 |
| තාවකාලික බැංකු ණය මත පොලී | **469,199** | 210,986 |
| සේවක ණය මත ක්‍රමක්ෂය | **1,165,986** | 828,557 |
| පාරිතෝෂික වෙන්කිරීම් | **23,593,586** | 22,608,466 |
| ප්‍රධාන සහ ආධාර ක්‍රමක්ෂය | **-** | (260,585) |
| පොලී ආදායම | **(44,336,994)** | (38,200,820) |
| දේ. පි. උ ඉවත්කිරීම මත ලාභය | **74,868** | (443,035) |
| දේ. පි. උ. මත දරන ලද අයභාර වියදම් ලියාහැරීම | **-** | 9,079,178 |
| ගෙවූ ආදායම් බදු | **(6,820,059)** | (19,555,293) |
| කාර්යසාධන දිරිදීමනා සඳහා වෙන්කිරීම් | **27,429,989** | 22,717,215 |
| ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම් | **8,614,940** | 7,458,393 |
| පාරිභෝජ්‍ය ජෛව වත්කම් වල අගය වෙනස්වීම මත ලාභ/අලාභ | **(34,828,150)** | (37,403,880) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **250,868,488** | 210,324,525 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| (වැඩිවීම්)/අඩුවීම් තොග | **(4,592,709)** | 21,275,748 |
| (වැඩිවීම්)/අඩුවීම් තැන්පතු සහ ඉදිරියට ගෙවීම් | **1,248,993** | (1,840,600) |
| (වැඩිවීම්)/අඩුවීම් වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | **16,944,631** | 9,714,727 |
| (වැඩිවීම්)/අඩුවීම් කෙටිකාලීන ආයෝජන මත ඉදිරියට ගෙවූ වියදම් | **(7,775,843)** | 1,545,441 |
| වැඩිවීම්/(අඩුවීම්) කලින් ලද කුලී | **1,471,246** | (20,381,262) |
| වැඩිවීම්/(අඩුවීම්) වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | **(7,995,099)** | (3,398,063) |
| පාරිතෝෂික ගෙවීම් | **(20,640,018)** | (8,134,590) |
| කාර්යසාධන දිරිදීමනා ගෙවීම් | **(22,765,896)** | (21,158,401) |
| ප්‍රසාද දීමනා ගෙවීම් | **(7,162,538)** | (7,231,825) |
| දැවගස් ගස් විකුණුම් වලින් ලද මුදල් | **29,332,700** | 22,942,390 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **228,933,956** | 203,658,090 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් වූ මුදල් ප්‍රවාහ** | | |
| දේ. පි. හා උ. මිලදී ගැනීම් | **(186,700,542)** | (164,809,564) |
| දේ. පි. හා උ. ඉවත් කිරීමෙන් ලද මුදල් | **1,578,214** | 2,488,920 |
| ලද පොලී | **40,522,256** | 32,547,768 |
| **අයෝජක ක්‍රියාකාරකම් තුළින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(144,600,072)** | (129,772,876) |
| | | |
| මුල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ | | |
| ගෙවූ කල්බදු පොලිය | **(32,776,546)** | (12,593,275) |
| තාවකාලික බැංකු ණය මත පොලී | **(469,199)** | (210,986) |
| සේවක ණය | **(7,427,800)** | (11,092,835) |
| සේවක ණය ආවරණය කර ගැනීම් | **6,422,291** | 4,290,173 |
| ගෙවූ ලාභාංශ | **(40,000,000)** | (50,000,000) |
| මුල්‍ය ක්‍රියාකාරම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | **(74,251,254)** | (69,606,923) |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑ වල වැඩිවීම/අඩුවීම** | **10,082,630** | 4,278,291 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | **325,659,031** | 321,380,740 |
| කාලච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | **335,741,661** | 325,659,031 |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

**(සටහන අ)**

**2013.12.31 දිනෙන් අවසන් වූ කාල පරිච්ඡේදය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ**

| | 31.12.2013 දිනට රු. | 31.12.2012 දිනට රු. |
|---|---|---|
| ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව | **40,000,000** | 79,500,000 |
| ස්ථාවර තැන්පතු - මහජන බැංකුව | **168,000,000** | 10,000,000 |
| ස්ථාවර තැන්පතු - ජා.ඉ. බැංකුව | **118,000,000** | 230,500,000 |
| භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනිම් | **7,000,000** | - |
| තැපැල් මුද්දර | **5,088** | 8,042 |
| මාර්ගස්ත මුදල් | **-** | 47,585 |
| බැංකු මුදල් | **2,438,289** | 4,476,403 |
| අතැති මුදල් | **298,284** | 1,127,001 |
| | **335,741,661** | 325,659,031 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.
වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. පොදු ප්‍රතිපත්ති

### 1.1 නෛතික ස්වභාවය

සී/ස කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධි විධානයන්ට අනුකූලව 1982 අංක.17 දරන සමාගම් පනත යටතේ පිහිට වූ සීමාසහිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑල දඹුල්ල පාරේ අංක 80 දරන ස්ථානයේ පිහිටා ඇත.

සමාගමේ සියලු කොටස්වල අයිතිය මහා භාණ්ඩාගාරය සතුය.

### 1.2 මූලික ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරයෙහි ස්වභාවය

අදාළ වර්ෂයේදී සමාගමේ ප්‍රධාන කටයුතු ලෙස පොල්, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන වගාකිරීම, නිෂ්පාදනය සහ විකිණීමය සිදුකරණ ලදී. කු. වැ. ස. වතුයාය 08 කින් සමන්විතව වන අතර ඒවා කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ව්‍යාප්තව පවතියි. එම වතුයායන් නම්,

| | |
|---|---|
| අත්තනගල්ල | කටුගම්පල |
| දඹදෙණිය | කුරුණෑගල |
| දොඩම්ගස්ලන්ද | නාරම්මල |
| හිරියාල | මහයාය |

### 1.3 ප්‍රකාශයට පත්කිරීම සඳහා අනුමත කළ දිනය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා කුරුණෑගල වැවිලි සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් මස 22 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සඳහා අනුමත කෙරිණි.

## 2. මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් වලින් සමන්විත මූල්‍යමය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කොට ඇත.

### 2.2 අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂකවරුන් විසින් සමාගමෙහි අඛණ්ඩ පැවැත්මෙහි හැකියාව පිළිබඳ තක්සේරුවක් සිදුකරන ලද අතර ව්‍යාපාර කටයුතු නැවතීමට හෝ ඇවර කිරීමත් සිදුනොකොට සිදුකරගෙන යන බවට තහවුරු වේ.

### 2.2 මූල්‍යමය ප්‍රකාශන සැකසීමේ පදනම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයන්හි දැක්වෙන පහත අයිතමයන් හැර සියලුම මූල්‍ය ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය හා උපචිත පදනම මත සකසන ලදී.

- සටහන 11හි සඳහන් පරිදි හිස් බදු ඉඩම් ප්‍රත්‍යා ගණනය කර ඇත.
- පරිභෝජ්‍ය ජෛව වත්කම් විකිණුම් පිරිවැය අඩු කොට සාධාරණ අගය මත තක්සේරු කොට ඇත.
- විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ආයුගණක තක්සේරුවක් මත හඳුනාගෙන ඇත.
- ජෛව වත්කම් වලින් නෙලාගත් කෘෂිභෝග අස්වැන්න ශුද්ධ උපලබ්ධිත අගය මත තක්සේරු කොට ඇත. ශුද්ධ උපලබ්ධිත අගය ඇස්තමේන්තු විකුණුම් මිලෙන් ඇස්තමේන්තුගත විකිණුම් වියදම් අඩුකිරීමෙන් ගණනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමන සාධකයන් සඳහා කිසිදු ගැළපුමක් සිදුකොට නොමැත.

### 2.3 ව්‍යවහාරික සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍යමය ප්‍රකාශනයන් සමාගමෙහි ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත. සියළු මූල්‍ය අයිතමයන් ආසන්නතම රුපියලට වටයා ඇත.

## 2.4 ඇස්තමේන්තු භාවිතය සහ නිශ්චයන්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍යමය ප්‍රකාශ සැකසීමේදී වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වලට අදාළ නිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් යොදා ගැනීම අවශ්‍ය වේ.

අදාළ නිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම්, ප්‍රවණතා සහ වෙනත් සාධක මත පදනම් වේ. ඒ අනුව සැබෑ ප්‍රතිඵල අදාළ නිෂ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

වලංගුභාවය තහවුරු කිරීම උදෙසා අදාළ ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිරන්තර සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම අදාළ සංශෝධනය සිදුකරන කාලපරිච්ඡේදයේදී එය කාලපරිච්ඡේදයට හා ඉදිරියට බලපාන පරිදි හඳුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් මූල්‍ය ප්‍රකාශන සඳහා විශාල බලපෑමක් ඇතිකරන වටිනාකම් සම්බන්ධ ගිණුම් කරන ප්‍රතිපත්ති ආශ්‍රිත නිශ්චයන් හා ඇස්තමේන්තු භාවිතා කළ අවස්ථා පහත දැක්වෙන සටහන් වල ඇතුළත් වේ.

සටහන 11 ස්පෘෂ්‍ය වත්කම් (ඵලදරන ජෛව වත්කම් හැර)

සටහන 13 පරිභෝජ්‍ය ජෛව වත්කම්

සටහන 21 නිර්නය කළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ආශ්‍රිත මිනුම්

සටහන 24 විලම්භිත බදුකරණය

## 2.5 සන්සන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂය සමග සැසඳීම සඳහා සහ වඩාත් යහපත් ඉදිරිපත් කිරීමක් උදෙසා පෙර වසර වල මූල්‍යමය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණයන් සංශෝධනය කරනු ලැබ ඇත.

# 3. කැපී පෙනෙන ගිණුම්කරණ ප්‍රමිතීන්

මෙම මූල්‍යමය ප්‍රකාශනයන් සැකසීමේදී යොදා ගැනුනු මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

## 3.1 වත්කම් සහ ඒවායේ තක්සේරුකරණ පදනම

මූල්‍යය ප්‍රකාශනයන්හි ජංගම වත්කම් වශයෙන් වර්ග කොට ඇත්තේ සමාගමෙහි සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි වන හෝ වාර්තාකරණය දිනයෙන් වසරක් ඇතුළත උපලබ්ධි වන වත්කම්ය. ජංගම වත්කම් හැර වෙනත් වත්තම් වනුයේ සමාගම විසින් වාර්තාකරණ දිනයෙන් වසරකට වඩා වැඩි කාලයක් පවත්වා ගෙන යාමට අදහස් කරන වත්කම් වේ.

### 3.1.1. දේපල පිරියත සහ උපකරණ

### 3.1.1.1 හඳුනා ගැනීම සහ මිනුම් ගත කිරීම

දේපල පිරියත සහ උපකරණ දක්වනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත අපහාය අලාබ අඩු කිරීමෙන් අනුතුරුවය. මෙම අරමුණ සඳහා වූ පිරිවැය, අදාල වත්කම අපේෂිත සඳහා ක්‍රියාත්මක තත්වයට හෝ භාවිතයට ගෙන ඒමට වැයවන ඍජු වියදම් ඇතුලත් කොට ඉදිරිපත් කරයි. ස්වයං නිර්මාණිත වත්කම්වල පිරිවැය, අමුද්‍රව්‍ය, ඍජු ශ්‍රමය සහ වෙනත් ඍජු වියදම් වලින් යුක්ත වේ. මේ සඳහා පවතින වත්කම් ඉවත් කිරීමේ පිරිවැයද ඇතුලත් වේ.

නොනිමි ප්‍රාග්ධන කාර්යයන් අදාල වත්කම පළමුවෙන් භාවිතා කරන මොහොතේදී නියමිත වත්කම් ගිණුම් වෙත මාරු කරයි.

දේපල පිරියත සහ උපකරණ ආයු කාලය වෙනස් වන අවස්ථාවන් වලදී ඒවා වෙනම අයිතම වශයෙන් ගණනය කරයි.

ස්ථිර ඉඩම් සංවර්ධන පිරිවැය වශයෙන් හැඳින්වෙන්නේ බිම් සැකසුම්, නව මාර්ග ඉදිකිරීම් සහ වෙනත් ප්‍රධාන පෙලේ යටිතල පහසුකම් සංවර්ධනයන්ය.

දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අදාල දේපල සහ පිරියත වල ධාරණ වටිනාකම සහ ඒවා ඉවත් කිරීමෙන් ලැබෙන ආදායමෙහි අන්තරය වශයෙන් සැලකෙන අතර ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකශනයෙහි වෙනත් ආදායම් යටතේ දැක්වේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1.1.2 පසුකාලීන වියදම්

දේපල පිරියත සහ උපකරණ මත සිදුකරණ ලද වියදමක් නිසාවෙන් එම වත්කමින් මුලිකව තක්සේරු කරන ලද ප්‍රමාණයට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි අපේක්ෂිත කල්හි එම වියදම ප්‍රාග්ධනීත කෙරේ. ප්‍රතිස්ථාපිත වත්කමහි පවතින වටිනාකම ඉවත් කරනු ලැබේ.

එදිනෙදා දරණ දේපල පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේ පිරිවැය විස්තීර්ණ මුල්‍ය ප්‍රකාශනයෙහි වියදම් වශයෙන් හඳුනා ගැනේ.

### 3.1.1.3 වත්කමක වටිනාකම ඉවත් කිරී

දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීමේදී හෝ එමගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ තවදුරටත් නොලැබෙන කළ එහි පවතින වටිනාකම නොසලකා හැරේ. ආදාල ඉවත්කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනාගැනේ.

### 3.1.1.4 ණය පිරිවෙත්

කිසියම් වත්කමක් අත්පත් කර ගැනීමේදී, ඉදිකිරීමේදි හෝ නිෂ්පාදනයේදි සෘජුව ගණු ලබන ණයට අදාළ ණය පිරිවැය ආදාල වත්කම අපේක්ෂිත කාර්ය සඳහා යොදා ගන්නා තෙක් එම කාලයට අදාළ ණය පිරිවැය එම වත්කමේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනී කෙරේ. ප්‍රාග්ධනී කරණය සඳහා සුදුසුකම් ලබන ණය පිරිවැය ප්‍රමාණය ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති අංක 23 අනුව තීරණය කරයි.

### 3.1.1.5 ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය

ක්ෂය වීම් ගණනය කරනුයේ වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම මත පදනම් වේ. ක්ෂය වීම් එක් එක් වත්කමෙහි ඇස්තමේන්තු ගත ඵලදායී ජීව කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ සිදුකරනු ලබයි.

බදු පදනමට ලබා ගත් වත්කම් බදු කාල පරිච්ජේදය හෝ අදාළ වත්කම් වල ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. ඉඩම් ක්ෂය නොකරයි.

ඇස්තමේන්තු ගත ඵලදායී ජීවකාලයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 40 පුරා |
| ළිං | අවුරුදු 40 පුරා |
| වැටවල් | අවුරුදු 03 පුරා |
| රථවාහන | අවුරුදු 05 පුරා |
| යන්ත්‍ර | අවුරුදු 13 1/3 පුරා |
| ගෘහ භාණ්ඩ | අවුරුදු 10 පුරා |
| උපකරණ | අවුරුදු 08 පුරා |
| පරිගණක | අවුරුදු 05 පුරා |

කිසියම් වත්කමක ක්ෂය වීම එය භාවිතා කරන පළමු වසරේ සිට ඇරඹෙන අතර ආදාල වත්කම විකිණීම සඳහා පවතින බවට වර්ග කල දිනයේදී හෝ වත්කමෙහි භාවිතය අතහරින දිනයේ දී අවසන් වේ. බදු පදනමට ලබා ගත් වත්කම් පහත දැක්වෙන කාලපරිච්ඡේදයන් පුරා ක්‍රමක්ෂය සිදු කෙරේ.

| | |
|---|---|
| හිස් ඉඩම් | අවුරුදු 53 පුරා |
| ගොඩනැගිලි | අවුරුදු 25 පුරා |
| යන්ත්‍ර | අවුරුදු 15 පුරා |
| මේරූ වගාවන් | අවුරුදු 30 පුරා |
| ඉඩම් සංවර්ධන පිරිවැය | අවුරුදු 30 පුරා |

### 3.1.1.6 බදු පදනමට ලබා ගත් වත්කම්

සමාගම මුල්‍ය කල්බදු පදනමට ලබාගත් වත්කම් වල අවදානම් සහ ප්‍රතිලාභ සමාගමට අයත්වන බැවින් ඒවා මුදලට මිලදී ගත් වත්කමක් සේ සලකා ප්‍රාග්ධන කර ඇත.

මුල්‍ය කල්බදු පදනමට ලබා ගත් වත්කම් බදු කාල පරිච්ජේදය හෝ අදාළ වත්කම් වල ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ.

බදු හිමියා විසින් බදු කාලසීමාව තුල හිමිකාරිත්වයට අදාල අවදානම් සහ ප්‍රතිලාභ රඳවාගන්නා අවස්ථාවන්හි ඒවා මෙහෙයුම් කල් බදු වශයෙන් සැලකේ.

### 3.1.1.7 මූල්‍යමය නොවන වත්කම් වල අපහායනය

සමාගම් මගින් සෑම වාර්තාකරන දිනයකදීම වත්කමක අපහායනය වී ඇතිදැයි සළකා බැලේ. එවැනි හානි වීමක් පිළිබඳ සංඥාක් පවතී නම් හෝ වාර්ෂික හානි වීම් පරීක්ෂාවක් අවශ්‍ය වූ විටකදී සමාගම මගින් වත්කමෙහි ආවර්ණ වටිනාකම පිළිබඳ තක්සේරුවක් සිදු කරයි.

කිසියම් වත්කමක් මුදල් ප්‍රවාහයන් උත්පාදනය නොකරන්නේ නම්, අදාල වත්කමෙහි ආවර්ණය කරගත හැකි වටිනාකම එහි භාවිත වටිනාකමට වඩා වැඩිනම් සහ එහි සාධරණ අගයෙන් විකිණීමේ පිරිවැය අඩුකොට එවැනි වත්කමක වටිනාකම තීරණය කෙරේ. වත්කමක ධාරණ වටිනාකම එහි ආවරණය කරගත හැකි වටිනාකම ඉක්මවා ඇතිවිටක අදාල වත්කම අපහායනය වූ බවට සැලකෙන අතර එහි වටිනාකම ආවරණය කරගත හැකි අගය දක්වා ආයු කරන ඇත.

වත්කමක භාවිතා වටිනාකම තක්සේරු කිරීමේදි ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් බදු පෙර වට්ටම් අනුපාතයන් යොදා ගනිමින් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් ගත කරන ලබයි. විකිණීමේ පිරිවැය අඩුකළ සාධාරණ වටිනාකම තීරණය කිරීමේදී මෑත කාලීන ගණුදෙනු සැලකිල්ලට ගැනේ.

එවැනි ගනුදෙනු නොමැති විටක උචිත තක්සේරු ආකෘතියන් භාවිතා කරනු ලබයි.

අපහායන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ. පූර්ව වශයෙන් හඳුනා අපහායනය අලාභයක් ආපසු හරවනු ලබන්නේ අදාල වත්කමෙහි ආවරණ වටිනාකම තීරණය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු වල වෙනසක් සිදුවුවහොත් පමණි.

### 3.1.2 ජෛව වත්කම්

ජෛව වත්කම් මේරූ සහ නොමේරූ වත්කම් වශයෙන් වර්ග කෙරේ. මේරූ ජෛව වත්කම් යනු අස්වැන්න නෙළාගත හැකි තත්වයට පත්වූ වගා වන අතර නොමේරූ ජෛව වත්කම් යනු තවමත් අස්වැන්න නෙළාගත හැකි තත්වය පත් නොවූ වගාවන්ය.

ජෛව වත්කම් තවදුරටත් දැරීමේ ඵල දරන ජෛව වත්කම් සහ පරිභෝජ්‍ය ජෛව වත්කම් වශයෙන් වර්ග කරයි. ඵල දරන ජෛව වත්කම් වලට විකිණීමට හෝ නෙලීමට අපේක්ෂා නොකරන පොල් සහ රබර් ගස් ඇතුලත් වේ. පරිභෝජය ජෛව වත්කම් වනුයේ තේක්ක, මහෝගනී, හල්මිල්ල වැනි වාණිජ වටිනාකමක් සහිත දැව වර්ග වේ.

### 3.1.2.1 ඵල දරන ජෛව වත්කම්

ඵල දරන ජෛව වත්කම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීමේ හා අපහායනය අලාභයන් අඩු කිරීමෙන් අනුතුරුව වන අතර දේපල පිරියත සහ උපකරණ සහ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති අංක 16 අනුව එය සිදු කරයි.

වාණිජමය අස්වැන්න නෙළා ගැනීමේ තත්වය තෙක් දරනු ලබන බිම් සැකසුම්, නව වගාවන්, නැවත වගාවන්, බෝග විවිධාන්ගි කරණයන් සහ පොහොර යෙදීම් වැනි පිරිවැය නොමේරූ වගා යටතේ වර්ග කරයි. නොමේරූ වගා යටතේ වර්ගකරයි. මෙම නොමේරූ වගා පිරිවැය වැවිලි සෘජු පිරිවැය ඒවාට අදාල පොදු කාර්ය පිරිවැය සහ දිගුකාලීන ණය සඳහා වූ පොලී පිරිවැය යන පිරිවැයන්හි එකතුවන් ලෙස ගණනය කරනු ලබයි.

මේරූ ඵලදරන ජෛව වත්කම්වල ප්‍රයෝජන කාලය අනුව ක්ෂය කරනු ලබයි.

| | |
|---|---|
| පොල් | අවුරුදු 50 පුරා |
| රබර් | අවුරුදු 20 පුරා |
| වෙනත් වැවිලි | අවුරුදු 20 පුරා |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1.2.2 ඵල දරන ජෛව වත්කම්වල පැල සිටුවීමේ පිරිවැය

මේරූ වගාවල ඇති පුරප්පාඩු සිටුවීම සඳහා දරනු ලබන වියදම් මෙම ගණයට අයත් වේ. වගාවේ ඵලදායී ජීවිත කාලය වැඩිවීමට හෝ අස්වැන්න වැඩිවීමට හෝ පෙර තක්සේරු කරන ලද වගාවේ ප්‍රගතිය අභිබවා නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩිවීමකට තුඩු දෙන ආකාරයෙන් පාලු සිටුවීමක් වෙනුවෙන් දරනු ලබන පිරිවැය ප්‍රාග්ධනය කරනය කර මේරූ වගාව ක්ෂය කරන පදනම් මතම ක්ෂය කිරීම කරනු ලබයි. ප්‍රාග්ධනය කරනු නොලබන පාලු සිටුවීමේ පිරිවැය එය දැරූ වර්ෂයේ වියදමක් ලෙස සලකා ලාභ ලාභ ගිනුමට ලියාහරිනු ලබයි.

### 3.1.2.3 පරිභෝජ්‍ය කළ හැකි ජෛව වත්කම්

පරිභෝජනය කල හැකි දැව ගස් හඳුනා ගැනීමේදී මිණුම් කරන අතර එක් එක් වාර්තාකරන කාල සීමාව අවසානයේ ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති 41 අනුව විකිණීමේ පිරිවැය අඩු කොට සාධාරණ අගයට ගණනය කරයි. දැව ගස්වල සාධාරණීය වටිනාකම ගණනය කරනු ලබන්නේ වට්ටම කළ මුදල් ප්‍රවාහ ක්‍රමය (DCF) යොදා ගනිමිනි.

නොමේරූ ගස්වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලබයි.

**මුදල් ඒකක වටිනාකම රු.**

| | |
|---|---|
| **දැව අන්තර්ගතය** | විවිධ ප්‍රදේශයන් හි එක් එක් දැව විශේෂයන් හි ඇඩි බව උස සහ වර්ධනය සැලකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සිදු කරයි. |
| **ආර්ථික ඵලදායි කාලය** | සමාගමහි වන වගා සැලසුම අනුව එක් එක් දැව විශේෂයන් හි සාමාන්‍ය ආයු කාලය තීරණය කරයි. |
| **විකුණුම් මිල** | පවතින ශ්‍රී ලංකා වෙළඳපල මිල අනුව ඇස්තමේන්තු සිදු කෙරේ. |
| **වට්ටම් අනුපාතය** | අනාගත මුදල් ප්‍රවාහයන් පහත දැක්වෙන වට්ටම් අනුපාතයන් අනුව වට්ටම් ගත කෙරේ: දැව ගස් 14% |

### 3.1.2.4 හඳුනාගැනීම් හා මිනුම්

සමාගම් මගින් ජෛව වත්කම් හඳුනාගනු ලබන්නේ අදාල වත්කම මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත හිමිවන බවට තහවුරුවක් පවතින්නේ නම් සහ එහි පාලනයක් සමාගම සතුව පවතින්නේ නම් පමනි.

ඵල දරන ජෛව විද්‍යාත්මක වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීම් සහ අපහායන අලාභ වීම් අඩු කිරීමෙන් පසු ගණනය කෙරේ.

පරිභෝජ්‍ය දැව ගස් මුලික හඳුනාගැනීමේදී එක් එක් වාර්තා කරන කාළ සිමාව අවසානයේදී මණින ලබන අතර ගිණුම්කරණ අංක 41 අනුව තක්සේරු කරයි.

### 3.1.3 මුල්‍යමය උපකරණ

### 3.1.3.1 මූල්‍යමය වත්කම්

### 3.1.3.1.1 මුලික හඳුනා ගැනීම සහ මිනුම

ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති 39 යටතේ පවතින මුල්‍යමය වත්කම් ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු මුදල්, කල්පිරිම තෙක් තබාගත් ආයෝජන හෝ විකිණීමට ඇති මුල්‍යමය වත්කම් සාධාරණ අගය මත හඳුනා ගැනේ.

වත්කම් ලාභ හො අලාභ, සෘජුව යෙදිය හැකි ගණුදෙනු පිරිවැය ඔස්සේ සාදාරණ අගය මත ගණනය නොකරණ කල්හි සියලූම මුල්‍යමය වට්ටම් මුලිකව හඳුනාගැනේ.

### 3.1.3.1.2 පසුකාළීන මිණුම්

මුල්‍යමය වත්කම් වල පසුකාළීන මිනුම් පහත දැක්වෙන වර්ගීකරණයන් මත රදා පවතීයි.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත මුල්‍යමය වත්කම්.

මෙයට වාණිජ කටයුතු සඳහා රඳවාගත් මුලම්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධරණ අගය මත මුලිකව හඳුනා ගෙන යොදාගත් වත්කම් ඇතුලත් වේ. කිසියම් වත් කමක් විකිණීමේ අරමුණින් හෝ

ප්‍රතිවිකිනිමේ ගැනිමේ අරමුණින් අත්පත් කර ගත්තේ නම් ඒවා විකිණීම සඳහා රඳවා ගත් මූලමය වත්කම් වශයෙන් වර්ග කරයි.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත මූල්‍යමය වත්කම් මූල්‍යමය ස්ථාවර පිළිබඳ ප්‍රකාශයෙහි දැක්වේ.

සමාගම් මගින් 2013 දෙසැම්බර් 31 අවසන් වූ වසර තුල ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත මූල්‍යමය වත්කම් කිසිවක් රඳවා නොගැනුනි.

**ණය සහ ලැබිය යුතු මුදල්**

ණය සහ ලැබිය යුතු මුදල් යනු ක්‍රියාකාරී වෙළඳපල තුළ නොදැක්වෙන ස්ථාවර හෝ නිෂ්චිත ගෙවීම් සහිත මූල්‍යමය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව එවැනි මූල්‍යමය වත්කම් (EIR) යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව පසු කාළීනව මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනුයේ බලාත්මක පොළි අනුපාත ක්‍රමය බලාත්මක පොළි අනුපාත ක්‍රමයෙහි වැදගත් අංගයක් වන වට්ටම් හෝ අත්පත් කර ගැනීමේ වාරික සහ ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමිනි.

සමාගම මගින් රඳවා ගන්නා ලද ණය සහ ලැබිය යුතු මුදල් වාණිජ අය කිරීම්, තැන්පතු, අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු මුදල් සහ මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වේ.

**විකිණීමට ඇති මූල්‍යය ආයෝජන**

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන සඳහා ස්තන්ධ සහ ණය සුරැකුම් අයත්වේ. විකිණීමට ඇති ස්කන්ධ ආයෝජන වශයෙන් වර්ගකොට ඇති දෑ ලාබ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත වාණිජ කටයුතු සඳහා වෙන් කරණ ලද වටිනාකම් වශයෙන් නොසැලකේ. මෙම කාණ්ඩයේ ණය සුරැකුම් යනුවෙන් අවිනිශ්චිත කාල පරිච්ජේදයක් සඳහා රඳවා ගත් සුරැකුම් සහ වෙළඳපල අවශතාවන්හි වෙනස් වීම් වලට ප්‍රතිචාරයක් වශයෙන් විකිණීමට අදහස් කෙරුණු සුරැකුම් වශයෙන් සැළකේ.

මූලික මිනුම්කරණයෙන් පසු විකිණීමට ඇති මූල්‍යමය ආයෝජන පසුකාලීනව යතාකරණය නොවේ. ලාභ හෝ අලාභ වශයෙන් සාධාරණ අගය මත පසු කාලීනව මැනේන අතර අදාල ආයෝජනය නොසලකා හැරෙන තෙක් විකිණීමට ඇති සංචිතයේ වෙනත් සමස්ථ ආදායම් යටතේ කාණ්ඩ ගත කරයි. විකිණීමට ඇති ණය සුරකුම් මත පොලී ආදායම බලාත්මක පොලී ක්‍රමවේදය අනුව මැනේන අතර එය ලාභ අලාභ ගිණුමේ දී හඳුනාගැනේ.

### 3.1.3.1.3 නොසලකා හැරීම්

කිසියම් මූල්‍යමය වත්කමක් (හෝ මූල්‍යමය වත්කමක කොටසක් හෝ සමාන ආකාරයේ මූල්‍යමය වත්කමක සමූහයක කොටසක් හෝ) පහත දැක්වෙන අවස්ථාවන්හධී හඳුනා ගැනේ.

- අදාල වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ හිමිකම කල් ඉකුත් වූ විට
- සමාගම් මගින් මුදල් ප්‍රවාහ ලබා ගැනිමේ හිමිකම මාරුකල විට හෝ (a) තෙවන පාර්ශවයක් වෙත භෞතික ප්‍රමාදයකින් තොරව තමන්ට හිමිවන මුදල් ප්‍රවාහය ගෙවීමේ වගකීමක් ඇති බවට උපකල්පිත අවස්ථාවකදී හෝ (b) සමාගම මගින් වත්කමට අදාල සියලූම අවදානම් සහ ප්‍රතිලාභ පසු කාලිනව රදවා නොගෙන වත්කම සහ පාලනය මාරුකළ අවස්ථවකදී.

### 3.1.3.1.4 මූල්‍යමය වත්කම් හානි වීම

සමාගම් මගින් එක් එක් වාර්තා කරන දිනයන්හි දී මූල්‍යමය වත්කම් හානි වීම පිළිබඳ භෞතික සාක්ෂියක් පවතීදැයි පරික්ෂා කෙරේ. කිසියම් වත්කමක මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදු වූ සඳුවීමකදී හානි වීමක් පිළිබඳ සාක්ෂියක් හඳුනාගතහොත් පමණක් මූල්‍යමය වත්කමක හෝ සමූහයක් හානියට පත්බවට නිර්ණය කෙරේ.

2012 දෙසැම්බර් 31 සහ 2013 දෙසැම්බර් 31 අතර අවසන් වූ වසර සඳහා සමාගම් මගින් මූල්‍යමය වත්කම් සම්බන්ධව කිසිදු හානි වීමේ අලාභයක් හඳුනා නොගැනුනි.

### 3.1.3.2 මූල්‍යමය වගකීම්

#### 3.1.3.2.1 මූලික හඳුනා ගැනීම් සහ මිණුම්

ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතීන් 39 යටතේ වන මූල්‍යමය වගකීම් සුදුසු පරිදි ලාභය හො අලාභය හො ණය ගැනීම් ඔස්සේ වන මූල්‍යමය වගකීම් වශයෙන් වර්ග කෙරේ. සමාගම මගින් මෙහි මූල්‍යමය වගකීම් වර්ගකිරීම මූලික හඳුනා ගැනීමේදී නිර්නය කෙරේ. සියළුම මූල්‍යමය වගකීම් මූලිකව සාධාරණ අගය මත හඳුනාගැනෙන අතර ණය ගැනීම් සහ ණය සම්බන්ධ තත්වයන් හි දී අදාල අත්පත් කරගැනිමට සෘජුව සම්බන්ධිත පිරිවැය හෝ එවැනි මූල්‍යමය වගකීම් නිකුත් කිරීම සඳහා වන පිරිවැය සමාගම මගින් හඳුනාගැනේ. විකිණීමට ඇති මූල්‍යමය වගකීම් වශයෙන් හඳුනා ගැනේන්නේ ඒවා මෑත කාලීනව විකිණීමේ අරමුණින් අත්පත්කරගන්නා ලද්දේ නම් පමණි. විකිණීම සඳහා රඳවා ගත් වගකීම් මත වන ලාභ හෝ අලාභ සමස්ථ ආදායම් ප්‍රකාශනයේදී හඳුනාගෙන ඇත. සමාගම මගින් සාධාරණ අගය මත ලාභ හෝ අලාභ ඔස්සේ කිසිදු මූල්‍යමය වගකීමක් මූලික හඳුනාගැනීමේදී සිදු කොට නොමැත. පළමු හඳුනාගැනීමෙන් අනතුරුව වන ණය සහ ණය ලබාගැනීම්, පොලී සහිත ණය සහ ණය ලබාගැනීම් පසු කාලීනව මිණුම් කරණය කොට බලාත්මක පොලි අනුපාත ක්‍රමවේදය යොදා ගනිමින් ක්‍රමක්ෂය කරණු ලැබේ. වගකීම් නොසලකා හින අවස්ථාවන්හි ලාබ හෝ අලාභයන් බලාත්මක පොලී අනුපාත ක්‍රමයන් හඳුනා ගැනේ ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ බලාත්මක පොලී අනුපාත ක්‍රමවේදයෙහි වැදගත් පාර්ශවයක් වන අත්පත් කරගැනීමේ වාරික හෝ කිසියම් වට්ටමක් සැලකිල්ලට ගනිමිනි.

#### 3.1.3.2.2 නොසලකා හැරීම්

කිසියම් වගකීමක් යටතේ වන කැපවීම ඉවත් වූ හෝ අවලංගු වූ හෝ කල් ඉකුත් වූවිට අදාල වගකීම නොසලකා හැරේ.

### 3.1.3.3 මූල්‍යමය මෙවලම් කියවීම්

කිසියම් මුදලක් පියවීම සඳහා බලාත්මක නෛතික පවතීනම් හෝ ශුද්ධ පදනමක් මත අදාල පියවීම සිදුකිරීමේ අදහසක් පවතීනම් හෝ වත්කම් යතාතරණය කරමින් සමගාමීව අදාල වගකීම් ඉටු කිරීමේ හැකියාවක් පවතීනම් මූල්‍යමය වගකීම් වෙනුවෙන් මූල්‍යමය වත්කම් ඔස්සේ පියවීම් සිදුකළ හැක.

**ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් යොදා ගනිමින් ස්වකීය මූල්‍යමය වගකීම් ඉටු කිරීමේදී සමාගමක් විසින් මුහුණ දෙන අවදානම වේ. සමාගමක් මගින් ද්‍රවශීලතාවය කළමාණකරණය යනු සාමාන්‍ය හෝ ආතතික තත්වයන්හිදී එළඹෙන වගකීම් ඉටු කිරීම සඳහා හැම විටම ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමට.

**පොලී අනුපාත අවදානම**

සමාගම හි පොලී අනුපාත සම්බන්ධ අවදානම් නිරාවරණය පාවෙන පොලී අනුපාත ආශ්‍රිතව සමාගම හි දිගු කාලීන ණය මත පදනම් වේ.

### 3.1.4 තොග

#### 3.1.4.1 ජීව විද්‍යාත්මක වත්කම් මගින් නෙලාගත් කෘෂි නිෂ්පාදන අස්වැන්න

අස්වැන්න නොලාගත් කෘෂිනිෂ්පාදන විකිණීමේ පිරිවැයෙන් ශුද්ධව තක්සේරු කරන අතර වාර්තා කරන දිනයේදී ඇස්තමේන්තු ගත ශුද්ධ විකුණුම් මිල මත මෙය තිරණ කෙරේ. පොල් සම්බන්ධයෙන් සැලකීමේදී කොප්පරා බවට පරිවර්ථනය කිරීමෙන් පසු වන ශුද්ධ යතාකරන වටිනාකම වෙළඳපල අවිනිශ්චිතා හේතුවෙන් තීරණය කෙරේ.

#### 3.1.4.2 වැඩි දුර සැකසු කෘෂි නිෂ්පාදන

වැඩිදුර සකසන ලද කෘෂි නිෂ්පාදන වල පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම අනුව තක්සේරු කෙරේ. ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු අදාල තොග සමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුල විකිණිමෙන් ලැබිමට අපේක්ෂිත මිලෙන් අපේක්ෂිත විකුණුම් වියදම අඩු කොට ලැබෙන අගය වේ.

### 3.1.4.3 යෙදවුම් අමුද්‍රව්‍ය, පරිභෝජනය කළහැකි දෑ සහ අමතර කොටස්

මේවා පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් (FIFO) පදනම මත ගණනය කෙරේ.

### 3.1.4.4 පැළතවාන්

පැල තවාන් පිරිවැය සඳහා ඍජු අමුද්‍රව්‍ය, ඍජු ශ්‍රමය සහ වෙනත් පොදු කාර්යය පිරිවැය ඇතුලත් වේ.

### 3.1.5 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ, මුදල් ශේෂයන්, ඉල්ලුම් තැන්පතු සහ කඩනමින් මුදල් බවට පත්කරගත හැකි ද්‍රවශීල ආයෝජනයන්ගෙන් සමන්විත වෙයි.

## 3.2 වගකීම් සහ වෙන්කිරීම්

ජංගම වගකීම් යටතේ වගකිම්ද දක්වා ඇත. වාර්තාකරන දිනයෙන් වසරක් ඇතුලක ගෙවිය යුතු ජංගම නොවන වගකීම් වනුයේ වාර්තාකරන දිනයෙන් වසරකට පසු ගෙවියයුතු ගෙවීම් වේ.

### 3.2.1 සේව්‍ය ප්‍රතිලාභ

### 3.2.1.1 නිර්ණය කළ අනිවාර්යදායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල්

අදාල නීති රීති හා රෙගුලාසිවලට අනුව සියලුම සේවකයන් ඉහත සඳහන් අරමුදල්වල දායකත්ව හිමිකම සඳහා සුදුසුකම් ලබයි. සමාගම විසින් සෑම සේවකයකුගේම දල පාරිශ්‍රමිකයන් ගණනය කරනු ලද 12% හා 3% ක ප්‍රමාණයක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදල සඳහා සහ සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා සමාගමේ දායකත්වය ලෙස ගෙවනු ලබයි.

### 3.2.1.2 නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති අංක 19 හි “විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය” සඳහන් ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභක්‍රමය යොදාගෙන පාරිතෝෂික ගණනය කිරීම සිදුකර ඇත. කෙසේ වුවද 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත අනුව මෙම ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ ඇති සේවකයන් පමණි. එම බැදීම සඳහා බාහිර ප්‍රතිපාදන සම්පාදනයක් සිදුනොවන අතර එය ආයු ගණනය ලෙස ගණනය කර නැත.

කෙසේ වුවද 2013.01.24 පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමාගමහි පවති පාරිතෝෂික ගෙවීම් ක්‍රමවේදය වෙන් කිරීමට තීරණය කෙරුණු අතර විශ්‍රාම ලබා ගන්නා සේවකයන් වෙත සම්පූර්ණ කරණ ලද වසරක් සඳහා අර්ධ මාසික වැටුපක් ගෙවීම වෙනුවට 2013.01.24 ගනු ලැබු නව තීරණය අනුව පහත පරිදි පාරිතෝෂික ගෙවීමට කටයුතු කරයි.

- වසර 10කට අඩු නමුත් වසර 5 හෝ ඊට වැඩි සේවාකාලයක් සම්පූර්ණ කල සේවකයින් වෙත සම්පූර්ණ කරන ලද එක් වසර සඳහා අර්ධමාසික වැටුපක් ගෙවනු ලැබේ.

- වසර 10කට වැඩි සේවාකාලයක් සම්පූර්ණ කල සේවකයින් වෙත සම්පූර්ණ කරණ ලද එක් වසරක් සඳහා මාසික වැටුපක් ගෙවනු ලැබේ.

ගිණුම්කරන ප්‍රතිපත්තිවල සිදුකරණ ලද මෙම වෙනස්කම 2012 වසරේ සිට බලපාන පරිදි ගිණුම් ගතකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ පරිදි සමාගම මගින් පාරතෝෂික සම්බන්ධ සිය වගකීම් ඉටුකිරීම සඳහා අභ්‍යන්තර අරමුදලක් ස්ථාපනය කර ඇත.

## 3.3 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යයන්

අසම්භාව්‍යයන් යනු අතීත සිදුවීමක් මත හට ගෙන ඇති නමුත් ආයතනයේ පාලනයෙන් පරිබාහිර වූ අනාගත අවිනිශ්චිත සිදුවීමක, සිදුවීම හෝ සිදුනොවීම මත ඇතිවිය හැකි වත්කමක් හෝ වගකීමකි.

සියලූ ප්‍රමානාත්මක ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාවයන් සටහන 28 හි දක්වා ඇත.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.4 විලම්භිත ආදායම

### 3.4.1 ප්‍රධාන සහ ආධාර

ප්‍රධාන සහ ආධාර හඳුනාගැනෙනුයේ අදාල ප්‍රදානය හිමි වන බවට සහතික වීමක් සහ ඒ සඳහා අවශ්‍ය කොන්දේසි සපුරාලිය හැකි බවට තහවුරුවීමෙන් පසුව පමනි. කිසියම් ප්‍රධානයක් වත්කමක් සමග සම්බන්ධ වන විට අදාලවත්කමේ පිරිවැයෙන් ප්‍රධාන ලෙස ලැබෙන වටිනාකම අඩුකරණු ලැබේ.

### 3.5 විස්තීර්ණ අදායම් ප්‍රකාශය

විස්තීරණ අදායම් ප්‍රකාශය එලිදැක්වීම සඳහා වියදම් ක්‍රියාත්මක වන ක්‍රමය වඩාත් සාධාරණ බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි අවශ්‍යතාවන්ට අනුකුලව එම ක්‍රමය විස්තීරණ ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා යොදාගෙන ඇත.

### 3.5.1 අදායම් හඳුනාගැනීම

ආදායම් හඳුනාගැනීම සිදුකර ඇත්තේ සමාගම වෙත ලැබිය යුතු ආදායම සහ ඒ වෙනුවෙන් දරණ ලද පිරිවැය සාධාරණව මැනීමෙන් අනුතුරුවය ආදායම ලැබුණ සහ ලැබිය යුතු මුදල් සාදාරණ අගය මත සැලකිල්ලට ගනිමින් වෙළෙඳ වට්ටම් සහ බදු වලින් ශුද්ධව ගණනය කොට ඇත්තේ සමාගම ඇතුලත විකුණුම් ඉවත්කිරීමෙන් අනුතුරුවය.

### 3.5.1.1 භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගෙන ඇත්තේ ක්‍රියාත්මක විකිණුම් එකගතාවයන් සම්බන්ධ සාක්ෂි පාදකකොට ගනිමින් සහ ගැනුම්කරුවෙකු වෙත හිමිකාරිත්වය සම්බන්ධයෙන් සිදුවන ප්‍රතිලාභ සහ අවදානම් සැලකිල්ලට ගනිමිනි. අදාල ලදුපතේහි අගයමත ආදායම වාර්තා කෙරේ.

### 3.5.1.2 පොළී ආදායම

අයකර ගැනීම සැකසහිත නොවේනම් පොළී ආදායම උපචිත වශයෙන් හඳුනාගැනේ.

### 3.5.1.3 ඉවත් කිරීම් වලින් ලැබෙන ලාභ හෝ අලාභ

දේපල පිරියත සහ උපකරණ ඉවත්කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අදාල දේපල පිරියත සහ උපකරණ වල පවතින වටිනාකම සහ ශුද්ධ විකුණුම් ආදායම සන්සන්දනයනය කිරීමේන් නිර්නය කරන අතර ඒවා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ දැක්වේ.

### 3.5.2 වියදම් හඳුනාගැනීම

### 3.5.2.1 මෙහෙයුම් වියදම්

දේපල පිරියත සහ උපකරණ එදිනෙදා නඩත්තු කිරීමේදී වැයවන සියලූ වියදම් වසර සඳහා වන විස්තීර ආදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කෙරේ. මූල්‍ය නොවන වත්කම්, මන්දගාමී සංසරණයක් සහිත තොග, ප්‍රමාණය ඉක්මවා වැඩුනු පැලතවාන් ඇතුලූ දේපල පිරියත සහ උපකරණ සම්බන්ධ සියලූ වහකීම් සහ ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් සිදුකර ඇත.

### 3.5.2.2 මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය සඳහා පොළී වියදම් සහ කල් බදු යටතේ සිදුකල ගෙවීම් ඇතුලත් වේ. වත්කම් අත්පත් කරගැනීම්, ඉදිකිරීම් හෝ සුදුසුකම්ලත් වත්කම් වලට අදාල මූල්‍ය පිරිවැය නිෂ්පාදනය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනානොගැනේ.

### 3.5.2.3 බදු වියදම

ආදායම් බදු වියදම වර්තමාන සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. ආදායම් බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. විලම්භිත බදු මනිනු ලබන්නේ බදු අනුපාතයන්හි තාවකාලික වෙනස්වීම් අනුවය වාර්තාකරණ දින වන විට ක්‍රියාත්මක විය හැකි නිතිරීති වලට අනුකූලවය. භාවිතා නොකරන ලද බදු අලාභයන්, බදු ණය සහ අඩුකල හැකි තාවකාලික වෙනස් වීම් සඳහා විලම්භිත බදු වත්කමක් හඳුනාගැනේ. විලම්භිත බදු වත්කම් එක් එක් වාර්ථාකරණ දිනයේදී විමර්ෂණය කරණ අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ තවදුරටත් යතාකරණය නොවන්නේනම් එහි වටිනාකම අඩුකරනු ලැබේ.

## 3.6 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය යටතේ පිළියෙල කරනු ලබයි. බදු වාරික ගෙවීම, ලාභාංශ ගෙවීම සහ ප්‍රධාන හා ආධාර ලැබීම් මූල්‍ය ක්‍රියාකරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් ලෙසද ලැබු පොලී හා ලාභාංශ ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන් ලෙසද වර්ගීකරණය කර ඇත.

## 3.7 කොටසක ඉපැයුම

කොටසක ඉපැයුම, සාමාන්‍ය කොටස් කරුවන්ට හිමි වාර්ෂික ලාභය වසර සඳහා වූ සාමාන්‍ය කොටස් වල බරතැබු සාමන්‍යයෙන් බෙදීමෙන් ගණනය කරනු ලබයි.

## 3.8 වාර්තාකරණ දිනට පසු සිදුවීම්

වාර්තාකරණ දිනට පසු සිදුවීම් යනු මූල්‍ය වාර්තා ඉදිරිපත්කරන දිනය හා මූල්‍ය වාර්තා ප්‍රසිද්ධ කිරීම සඳහා අනුමත කරන දිනය අතර සිදුවන හිතකර හෝ අහිතකර සිදුවීම්ය.

වාර්තාකරණ දිනට පසු සිදුවූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කිරීමට හෝ අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට හෝ කටයුතු කර ඇත.

# ගිණුම්කරණ සටහන්

## 4 ආදායම්

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| පොල් (සටහන් 4.1) | **402,365,395** | 404,191,573 |
| රබර් | **62,405,810** | 77,964,363 |
| රඹුටන් | **3,072,425** | 3,943,221 |
| ගම්මිරිස් | **1,499,150** | 724,195 |
| කජු | **1,018,656** | 933,256 |
| කුරුඳු | **871,474** | 549,354 |
| අනෙකුත් | **4,657,265** | 3,513,524 |
| | **475,890,175** | 491,819,486 |

### 4.1 පොල් ආදායම

| | 2013 | 2012 |
|---|---|---|
| ගෙඩි පොල් | **342,821,037** | 336,593,145 |
| බීජ පොල් | **48,465,111** | 42,663,876 |
| පොල් තෙල් | **11,061,380** | 19,298,641 |
| කොප්පරා | **17,867** | 5,635,911 |
| | **402,365,395** | 404,191,573 |

## 5 විකුණුම් පිරිවැය

| | 2013 | 2012 |
|---|---|---|
| පොල් | **213,015,395** | 244,948,017 |
| රබර් | **48,417,543** | 44,646,298 |
| රඹුටන් | **668,693** | 536,630 |
| ගම්මිරිස් | **387,097** | 407,386 |
| කජු | **961,129** | 1,247,190 |
| කුරුඳු | **573,612** | 778,360 |
| අනෙකුත් | **4,773,349** | 4,719,240 |
| | **268,796,818** | 297,283,121 |

## 6 අනෙකුත් මෙහෙයුම් ආදායම්

| | 2013 | 2012 |
|---|---|---|
| පොල් ගස් විකුණුම් | **12,622,984** | 17,346,081 |
| රබර් ගස් විකුණුම් | **5,631,860** | - |
| වටිනාකම වෙනස්වීම මත ලාභ/අලාභ - පාරිභෝජ්‍ය ජෛව වත්කම් | **34,328,150** | 37,403,880 |
| පොල් ලෙලි විකුණුම් | **22,000,033** | 12,929,090 |
| අයකරන ලද ප්‍රමාද ගාස්තු | **5,018,553** | 7,715,616 |
| කුලී සහ පහසුකම් ගාස්තු ආදායම | **4,588,872** | 3,780,832 |
| ප්‍රධාන සහ ආධාර ක්‍රමක්ෂය | **-** | 260,585 |
| දේ පි. උපකරණ විකිණීම ඉවත්කිරීම මත ලාභ/අලාභ | **(74,868)** | 443,035 |
| ලියා හැරීම | **1,834,728** | 1,362,450 |
| තවාන් ආදායම් | **3,522,771** | 4,184,752 |
| ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ ලාභය/ (අලාභය) | **262,342** | (1,760,854) |
| වෙනත් ආදායම් | **6,091,660** | 5,687,886 |
| | **95,827,085** | 89,353,353 |

### 6.1 ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ ලාභය/(අලාභය)

ට්‍රැක්ටර් මධ්‍යස්ථානයේ සේවකයින්හට දිරිදීමනා ගෙවීම සඳහා වෙන්කරණ ලද රු. 630,512 (2012 - රු. 471,747) හා ප්‍රසාද දීමනා සඳහා වෙන්කරන ලද රු. 84,075 (2012 - රු. 67,500) ක මුදල පරිපාලන හා පොදු වියදම් තුළ ඇතුළු වේ.

## 7 පරිපාලන හා පොදු වියදම්

| | 2013 | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| වැටුප් වේතන සහ ඒ ආශ්‍රිත වියදම් | **67,216,624** | 60,306,943 |
| නඩත්තු සහ අලුත්වැඩියා වියදම් | **12,493,403** | 20,365,544 |
| අනෙකුත් පරිපාලන වියදම් | **29,540,652** | 26,474,533 |
| | **109,250,679** | 107,147,020 |
| **මෙහෙයුම් කටයුතුවලින් වූ ලාභ ගණනය කිරීමේදි** පහත වියදම් අඩුකර ඇත. | | |
| අධ්‍යක්ෂක වරුන්ගේ දීමනා | **4,210,036** | 5,306,499 |
| විගණන ගාස්තු | **590,000** | 530,000 |
| කාර්ය සාධන දිරිදීමනා | **27,429,989** | 22,717,215 |
| ප්‍රසාද දීමනා | **8,614,940** | 7,458,393 |
| ප්‍රතිත්‍යාග සහ සාමූහික සමාජීය වගකම් වෙනුවෙන් කල වියදම් | **1,993,996** | 1,765,143 |
| දේ. පි. උ. මාරු කිරීමේ වියදම් මත අලාභ | **-** | 9,079,178 |
| ක්‍ෂය/ක්‍රමක්‍ෂය | | |
| බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම් | **3,169,955** | 2,988,533 |
| නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම් හැර) | **4,841,979** | 5,056,544 |
| මේරූ වගාවන් | **8,228,002** | 7,400,635 |
| දේ. පි. උ. | **22,393,615** | 13,935,657 |
| පුද්ගල පිරිවැය | | |
| වැටුප්, වේතන, සේ. අ. අ. හා සේ. භා. අ. | **206,683,002** | 205,525,353 |
| නිර්ණය කල ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | **23,593,586** | 22,608,466 |

## 8 ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම

### 8.1 පොලී ආදායම්

| | 2013 | 2012 |
|---|---|---|
| ස්ථාවර තැන්පතු මත පොලී | **41,252,290** | 33,895,955 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලී | **-** | 1,768,695 |
| භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනිම් මත පොලී ( සටහන 08.1.1) | **1,445,447** | 1,308,660 |
| සේවක ණය මත පොලී | **473,271** | 398,953 |
| කලින් ගෙවූ සේවක ප්‍රතිලාභ | **1,165,986** | 828,557 |
| | **44,336,994** | 38,200,820 |

### 8.2 පොලි වියදම්

| | 2013 | 2012 |
|---|---|---|
| කල්බදු පොලී | **22,742,587** | 20,852,763 |
| තාවකාලික බංකු ණය පොලී | **469,199** | 210,986 |
| සේවක ණය ක්‍රමක්‍ෂයවීම් | **1,165,986** | 828,557 |
| | **24,377,772** | 21,892,306 |
| ශුද්ධ මූල්‍ය ආදායම | **19,959,222** | 16,308,514 |

*8.1.1 ද්විතීක වෙළඳ පොළ ගණුදෙනු සම්බන්ධ රඳවා ගැනීම් බදු මත ව්‍යවස්ථාපිත ණය*

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ ජේද 137 මගින් කිසියම් සමාගමක් රාජ්‍ය සුරැකුම් ආශ්‍රිත ද්විතියික වෙළෙඳ පොළ ගණුදෙනු සිදු කිරීම මගින් පොලී ආදායමක් උපයයිනම් කාල්පනික රඳවාගත් බද්ද ආදාල බදු වර්ෂයේදී සමාගමේ ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් බවට පත් වේ.

ඒ අනුව වසර 2013 දී රජයේ සුරැකුම් සම්බන්ධ ද්විතියික වෙළෙඳපොළ ගණුදෙනු වලින් උපයා ගත් ශුද්ධ පොලී ආදායම, මූල්‍යමය ප්‍රකාශනයන්හි දල පොලී ආදයමක් ලෙසට හඳුනාගැනිම සඳහා ශුද්ධ පොලී ආදායමෙන් 1/9 වන රුපියල් 144,545 ක කාල්පනික රඳවාගත් බද්ද එකතු කර දක්වා ඇත.

## 9 ආදායම් බදු වියදම්

### 9.1 ප්‍රවර්තන බදු වියදම

2006 අංක 10 දරණ ආදායම් පනතේ 48 (ඒ) වගන්තිය 2011 අංක 22 දරණ ආදායම් බදු පනතෙහි 16 වන වගන්තියෙන් සංශෝධනය කරඇති අතර ඒ අනුව කෘෂිකාර්මික කටයුත්තක් තුලින් ඉපැයූ ලාභ සහ ආදායම් එම පනතේ පළමු උපලේඛණයට අනුව 10% බදු අනුපාතයට යටත් වේ. අනෙකුත් ලාභ සාමාන්‍ය අනුපාතය යටතේ බද්දට යටත්වේ.

| | **2013** | 2012 |
|---|---|---|
| | රු. | රු. |
| ප්‍රවර්තන ආදායම් බදු වියදම් ( සටහන 9.2 ) | **1,146,157** | 7,778,863 |
| පෙර වසරේ ආදායම් බදු ඌණ/ (අධි) වෙන්කිරීම් | **(430,205)** | - |
| විලම්බිත බදු වියදම | **4,767,095** | 8,006,004 |
| | **5,483,047** | 15,784,867 |

### 9.2 ගිණුම්කරණ ලාභය සහ බදුවන ලාභය සැසඳීම

| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | |
|---|---|---|
| බදුවලට පෙර ගිණුම්කරණ ලාභය | **213,628,982** | 186,077,635 |
| අනෙකුත් ප්‍රභවයන් ගෙන් ලද ආදායම් හා බද්දෙන් නිදහස් ආදායම් | **(77,424,290)** | (89,820,721) |
| | **136,204,692** | 96,256,914 |
| අඩු කිරීමට ඉඩ නොදෙන අයිතමයන්ගේ එකතුව | **66,810,551** | 48,156,140 |
| අඩු කිරීමට ඉඩ දෙන අයිතමයන්ගේ එකතුව | **(176,237,586)** | (105,118,295) |
| ගලපන ලද ව්‍යාපාර ලාභය | **26,777,657** | 39,294,759 |
| අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම | **43,171,008** | 37,372,263 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | **69,948,665** | 76,667,022 |
| සුදුසුකම් ලද ගෙවීම් | **(58,487,095)** | (27,537,851) |
| බදු අයකළ හැකි ආදායම | **11,461,570** | 49,129,171 |
| | | |
| කෘෂිකාර්මික ක්‍රියාකාරකම් මත බද්ද | **1,146,157** | 3,320,725 |
| වෙනත් ආදායම් මත බද්ද | - | 4,458,138 |
| වාර්ෂික ලාභය මත ආදායම් බද්ද | **1,146,157** | 7,778,863 |

### 9.3 විලම්භිත බදු වියදම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී සහ බදුකරණයේදී, වත්කම් හා වගකීම් වල ශුද්ධ ධාරණ අගය ලෙස යොදාගන්නා වටිනාකම් වල තාවකාලික වෙනසක් පවතින අතර එම තාවකාලික වෙනස සඳහා වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භිත බදු වගකීම ගණනය කරනු ලබයි. එය සටහන් අංක 25 දක්වා ඇත. විලම්භිත බදු වගකීමෙහි ඇතිවන්නා වූ වෙනස වසර තුලදී මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනා ගැනේ.

| විලම්භිත බදු වියදම්/ ආදායම් | | |
|---|---|---|
| බදු කරණයේදි යොදාගන්නා ත්වරිත ක්ෂය කිරීම් | **(2,414,803)** | (694,709) |
| මේරූ සහ නොමේරූ වගා ක්‍රමක්ෂය | **(8,407,163)** | (6,590,203) |
| බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම් | **155,787** | (188,483) |
| නිර්නය කල සේවක ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික | **5,899,084** | (532,609) |
| | **(4,767,095)** | (8,006,004) |

## 10 කොටසක ඉපැයුම

කොටසක ඉපැයුම, සාමාන්‍ය කොටස් කරුවන්ට හිමි වාර්ෂික ලාභය වසර සඳහා වූ සාමාන්‍ය කොටස් වල බරතැබූ සාමන්‍යයෙන් බෙදීමෙන් ගණනය කරනු ලබයි.

### 10.1 මූලික කොටසක ඉපයීම

| | 2013 | 2012 |
|---|---|---|
| සාමාන්‍ය කොටස් කරුවන්ට හිමි ලාභය (රු.) | **208,145,938** | 177,266,345 |
| බර තබන ලද සාමාන්‍ය කොටස් ගණන | **20,000,001** | 20,000,001 |
| කොටසක ඉපැයුම (රු. ශත) | **10.41** | 8.86 |

### 10.2 පහත හෙලන ලද කොටසක ඉපැයුම්

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුලදී කිසිදු අවස්ථාවක සාමාන්‍ය කොටස් වල මිල පහලයාමක් ඇති වී නැත. එම නිසා පහත හෙලන ලද කොටසක ඉපැයුමද උක්ත ගණනය කර ඇති කොටසක මූලික ඉපැයුමටම සමාන වේ.

## 11 බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම්

### 11.1

වරලත් ගණකාදීකරණ ආයතනයේ කඩිනම් වැඩ පැවරුම් බලකායෙන් ලබා ගත් රීතින්ය අනුව යමින් සමාගම පිහිට වූ 1992 ජූලි 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියළුම වතුවල බදු අයිතීන්හි වටිනාකම සමාගමේ පොත් වලට ඇතුලත්කරන ලදී. මෙම කාර්ය සඳහා 1995 මාර්තු 08 දින අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී මෙම හිස් බදු ඉඩම්, තක්සේරු විශේෂඥ ඩී.ආර්. වික්‍රමසිංහ මහතා විසින් සමාගම පිහිටුවීමට පෙර ඊට ආසන්නයේ ඊට පෙර මෙම බදු ඉඩම් සඳහා ලබා දී තිබූ වටිනාකම ප්‍රත්‍යාගණනය කළ යුතු බවට තීරණය කර ඇත. මෙම ඉඩම් වල බදු අයිතිය ලෙස 1992 ජූනි 18 දින ශේෂ පත්‍රයට ගනු ලැබූ ප්‍රත්‍යාගණන වටිනාකම රුපියල් 189,234,932 විය. එම වත්කම් වල ධාරණ අගය සටහන අංක 11.3 හි දැක්වා ඇත.

### 11.2

ජනවසම සතුව පැවති වතු 13 ක් සමාගමට භාර දුන් නමුදු ඉන් වතු 05 ක පමණක් බදු ගිවිසුම් සම්පුර්ණ කර ඇති අතර ඉතිරි වතු 08 හි (දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, හිරියාල, කටුගම්පොල, කුරුණෑගල, මහයාය, නාරම්මල සහ වාරියපොල) බදු ගිවිසුම් සම්පුර්ණ කළ යුතුව ඇත. බදු ගිවිසුම් සම්පූර්ණ නොවූ වතු වෙනුවෙන් සමාගම හා ජනවසම අවබෝධතා ගිවිසුමකට එළඹී ඇති අතර මෙම බදු ගිවිසුම් ජූනි 18 දින සිට ක්‍රියාත්මක වන පරිදි සකස් කර ඇත.

### 11.3 බදු අයිතිය යටතේ ඇති හිස් ඉඩම් (වසර 53)

| පිරිවැය ශේෂය 01.01.2013 රු. | සමුච්චිත ක්‍රමක්‍ෂය 01.01.2013 රු. | වාර්ෂික ක්‍රමක්‍ෂය රු. | සමුච්චිත ක්‍රමක්‍ෂය 31.12.2013 රු. | ධාරණ අගය **31.12.2013** දිනට රු. | ධාරණ අගය 31.12.2012 දිනට රු. |
|---|---|---|---|---|---|
| 168,007,552 | 65,109,983 | 3,169,955 | 68,279,938 | **99,727,614** | 102,897,569 |

## 12 නිශ්චල බදු දේපළ (හිස් ඉඩම් හැර)

සටහන 11හි විස්තර කර ඇති පරිදි, ජනවසමෙන් භාර දුන් සියළුම වතුවල බදු ගිවිසුම් සම්පූර්ණ වී නොමැති වුවත් වරලත් ගණකාධිකාරි ආයතනයේ කඩිනම් වැඩ පැවිරිලි බලකායේ නියමයන්ට අනුකූලව, මූල්‍ය කල් බදු යටතේ ඇති වතුවල සියළුම වත්කම් 1992 ජූනි 18 වන දින සිට බලපාන පරිදි සමාගමේ පොත් වලය ඇතුලත් කර ඇත. මෙම කාර්ය සඳහා එම වත්කම් සමාගමේ පොත්වල වාර්තා කළ යුත්තේ, එම වත්කම් ජනවසම පොත් වල පෙන්වන පොත් අගයටය යන්න 1995 මාර්තු මස 8 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

මෙම වත්කම් 1992 ජූනි 18 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පහත දැක්වෙන පරිදි සටහන් කර ඇති අතර පහත පරිදි ක්ෂයවීමට ලක් කොට ඇත.

| ප්‍රත්‍යාගණිනිත අගය | | රු. |
|---|---|---|
| ඉඩම් සංවර්ධන පිරිවැය | වසර 30 | 1,123,305 |
| ගොඩනැගිලි | වසර 25 | 22,130,873 |
| යන්ත්‍රෝපකරණ | වසර 15 | 34,841 |
| මේරූ වගාවන් | වසර 30 | 43,001,122 |
| නොමේරූ වගාවන් | | 90,647,222 |
| | | 156,937,363 |

එම වත්කම්වල ඉදිරියට ගෙන ආ ශේෂයන් පහත පරිදි වේ.

| ප්‍රත්‍යාගණිනිත අගය | 01.01.2013 දිනට ශේෂය | මාරු කිරීම් | එකතු කිරීම් (ඉවත් කිරීම්) | **31.12.2013 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| ඉඩම් සංවර්ධන පිරිවැය | 1,123,305 | - | - | **1,123,305** |
| ගොඩනැගිලි | 17,693,752 | - | - | **17,693,752** |
| යන්ත්‍රෝපකරණ | 34,841 | - | - | **34,841** |
| මේරූ වගාවන් | 122,903,503 | - | - | **122,903,503** |
| | 141,755,401 | - | - | **141,755,401** |

| ක්‍රමක්ෂය | 01.01.2013 දිනට ශේෂය | මාරු කිරීම් | වසරට ආදාල ක්ෂය වීම් | **31.12.2013 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| ඉඩම් සංවර්ධන පිරිවැය | 769,078 | - | 37,444 | **806,522** |
| ගොඩනැගිලි | 14,536,993 | - | 707,751 | **15,244,744** |
| යන්ත්‍රෝපකරණ | 34,841 | - | - | **34,841** |
| මේරූ වගාවන් | 71,160,733 | - | 4,096,784 | **75,257,517** |
| | 86,501,645 | - | 4,841,979 | **91,343,624** |

| ඉදිරියට ගෙන ආ ශේෂය | 01.01.2013 දිනට ශේෂය | **31.12.2013 දිනට ශේෂය** |
|---|---|---|
| ඉඩම් සංවර්ධන පිරිවැය | 354,227 | **316,783** |
| ගොඩනැගිලි | 3,156,759 | **2,449,008** |
| යන්ත්‍රෝපකරණ | - | **-** |
| මේරූ වගාවන් | 51,742,770 | **47,645,986** |
| | 55,253,756 | **50,411,777** |

**ධාරණ අගය**

ජනවසම මගින් භාර දුන් වතුවල ඒ වනවිට පැවිති නොමේරූ වගාවන් සඳහා කර තිබූ ප්‍රාග්ධන ායෝජන වියදම් 1992.06.18 දිනට වූ ප්‍රත්‍යාගණිනිත අගයට "නොමේරූ වගාවන්" යටතේ පෙන්වා ඇත. ඉන් අනතුරුව මෙම වගාවන් එල දරණ තුරු දරණ ලද ප්‍රාග්ධන ආයෝජන වියදම් සටහන අංක 13 අ හි දක්වා ඇත. මෙම වගාවන් එල දරණ/ පරිණත වගාවන් තත්වයට පත් වූ වට එම වගාවන් එම තත්වයට ගෙන ඒම දක්වා දරණ ලද සටහන අංක 13 අ හි "නොමේරූ වගාවන්" ගණය යටතේ පෙන්වා ඇති අමතර පිරිවැය එම සටහන යටතේ "මේරූ වගාවන්" ගණයට මාරු කර ඇත. ඊට අනුරූපිතව මෙම සටහන් (අංක 13 අ හි) "නොමේරූ වගාවන්" යටතේ එම වගාවන් සම්බන්ධයෙන් වන යම් පිරිවැයක් වෙතොත් එය මෙම සටහනේම "මේරූ වගාවන්" යටතට මාරු කිරීම සිදු කර ඇත.

## 13 අ ඵල දරණ ජෛව වත්කම්

ආරම්භයේ සිටම දිගුකාලින වගාවන් සඳහා කරන ලද ප්‍රාග්ධන වියදම් සම්බන්ධ විස්තර පහත වේ. බදු ගිවිසුම යටතේ අත්පත් කර ගත් වත්කම් (වගාවක්ද ඇතුලත්ව) සටහන් අංක 11 සහ 12 ඇතුලත් කර ඇත. ජකවසමින් බදු පදනම යටතේ සමාගමට පැවරුන "නොමේරූ වගාවන්" වෙනුවෙන් ඉන්පසුව දරනලද ආයෝජන වියදම්ද මෙම සටහන යටතේ පෙන්වා ඇත. මෙම වගාවන් අත්වූ දිනයේ සිට ඵල දරණ තෙක් දරන ලද වියදම් "නොමේරූ වගාවන්" යටතේ ඇති අතිරේක ආයෝජන වියදම් ප්‍රමාණය මෙම වගාවන් ඵල දරණ/ පරිනත තත්වයට පත්වීමේදී "මේරූ වගාවන්" යටතට මාරුකර ඇත. ඊට අනුරූපිතව සටහන් අංක 12 හි (ජනවසමෙන් බද්දට ගත් නිශ්චල වත්කම්) "නොමේරූ වගාවන්" යටතේ එම වගාවන්ට අදාල පිරිවැයක් වේනම් එය එම සටහවෙහි "මේරූ වගාවන්" යටතට මාරුකිරීම සිදුකර ඇත.

| | නොමේරූ ජෛව වත්කම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | පොල් වසර 50 | රබර් වසර 20 | කජු වසර 20 | කුරුඳු වසර 20 | රඹුටන් වසර 20 | වෙනත් භෝග | එකතුව |
| වර්ෂය ආරම්භක දිනට ශේෂය | 226,537,734 | 25,655,601 | 10,883,959 | 965,756 | 1,629,675 | 18,023,854 | 283,696,579 |
| වර්ෂය තුළ එකතු වීම් | 73,175,213 | 13,616,882 | 1,170,787 | 1,598,383 | 380,534 | 3,716,418 | 93,658,217 |
| වර්ෂය තුළ මාරුකිරීම් | (20,961,171) | (4,624,778) | - | - | (309,108) | (3,247,626) | (29,142,683) |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | (1,624,032) | | - | - | - | | (1,624,032) |
| **වර්ෂය අවසන් දිනට ශේෂය** | **277,127,744** | **34,647,705** | **12,054,746** | **2,564,139** | **1,701,101** | **18,492,646** | **346,588,081** |

